# 2025 ජූනි මස 24 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ජේ.ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | එච්.ඩී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.එච්. ප්‍රදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. පමිත් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඩී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සසෝජන් ප්‍රියදර්ශන මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රොයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. නිලංක විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න ගන්ධාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලියාරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. හර්ෂන් පිලිපියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ජේ.ඩබ්. සදුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එච්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමින්ත සිල්වා මහතා |
| 30 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. මහේෂ හර්ෂණ අබේවර්ධන මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සමින් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.එච්. ප්‍රශාන් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ- සුදත් ශ්‍රීයාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්මි මයුමිකා තිස්කාර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස් චමුත් පෙරමේෂ් ප්‍රනාන්දු මහතා |

41. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් ඉරාෂාන් කුමාර පෙරේරා මහතා
42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ලූෂන් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
43. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
44. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රසාද් ප්‍රනාන්දු මහතා
45. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. සචින්ත් ගිහාන් ක්‍රිස්ටිල්කාන්ත මහතා
46. මහා නගර සභා මන්ත්‍රී - පී. පුලක්ෂිකා තිලක්ෂණී ප්‍රනාන්දු මෙනවිය
47. මහා නගර සභා මන්ත්‍රී - හරීෂ් චන්දන පිලානාපිටිකානගේ මහතා
48. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එෆ්. ජයතුංග මහත්මිය
49. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මහේෂ් මධුරංග විජයරත්න මහතා
50 මහා නගර සභා මන්ත්‍රී - ඒ. දිනූෂි කොෂලා පෙරේරා මහත්මිය
51. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. නිලිනි සහන්සරණී මෙනවිය

## 01. <u>නාගරික ලේකම් විසින් සභාව කැඳවීමේ නිවේදනය :-</u>

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. ජේ. ඩී. තාරකා මුණසිංහ මහතා විසින් 2025.06.24 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ ආමන්ත්‍රණය :-</u>

<u>ගරු නගරාධිපති :- ජේ.ඩී. නිශාන්ත ප්‍රදීප් ප්‍රනාන්දු මහතා</u>

අභිනවයෙන් පත් වූ මොරටුව මහා නගර සභාවේ, ජාතික ජන බලවේගයේ පාලනය තුළ මෙම සභාවේ නියෝජ්‍ය නගරාධිපතිනිය ලෙස පත් වූ ප්‍රභාෂණී වික්‍රමසිංහ සහෝදරියගෙන් අවසරයි. ඒ වගේම මහා නගර සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුනි, සියලුම මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, ඔබ සැම දෙනාගෙන්ම අවසරයි. ඒ වගේම නාගරික කොමසාරිස්තුමිය හා නාගරික ලේකම්තුමා ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන්, නිලධාරී මහත්ම මහත්මීන් සහ සභාවේ සේවක මහත්ම මහත්මීන් සැමදෙනාගෙන්ම අවසරයි. මේ අවස්ථාවට සහභාගී වී සිටින මාධ්‍යවේදී සොයුරු සොයුරියනි, විශේෂිත ආරාධනය පරිදි පැමිණ සිටින මහත්ම මහත්මීන් සහ ආදරණීය මොරටුව ජනතාවගෙන් අවසරයි.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, පළමුව පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් මොරටුව මහා නගර සභාව ජාතික ජන බලවේගයට ඓතිහාසික ජයග්‍රහණයක් ලබාදීම සඳහා කටයුතු කළ මොරටුව ජනතාවට මාගේ ගෞරවය, ප්‍රණාමය සහ ස්තූතිය පළමුව පළ කර සිටිනවා. විශේෂයෙන් කොට්ඨාශ 29 න් කොට්ඨාශ 26 ක් ජාතික ජන බලවේගය ජයග්‍රහණය කරවීමට ඡන්දය ලබා දී දායක වුණු ඒ ජනතාවට නැවත නැවතත් ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම, මේ සභාවට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඉතාමත් ශක්තිමත් සභාවක් සහ ජ්‍යෙෂ්ඨත්වයෙන් වගේම දක්ෂ නවක මන්ත්‍රීවරුන් සැලකිය යුතු ප්‍රමාණයක් මේ සභාවට එවීමට ඡන්දය පාවිච්චි කරපු ඒ සැම ජනතාවකටම මා මාගේ ස්තූතිය පළ කර සිටිනවා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබ දන්නවා දීර්ඝ කාලයක් මොරටුව මහා නගර සභාව මොරටුවේ ජනතාව තුළ අප ආයතනය පිළිබඳව හැදිලා තියෙන ආකල්පය අපි කාටත් සතුටු වියහැකි එකක් නොවෙයි. ඊට මූලිකවම හේතු වුණේ විශේෂයෙන්ම දේශපාලනය. ඒ අන්තනෝමතිකභාවය, නිලධාරිවාදය වැනි මේ ආයතනයේ සේවාවන් අධිස්ථාපනය යාමේදී ඒ

සේවාවන් සැලකිය යුතු මට්ටමකින් බිඳවැටීමකට ලක් වුණා. මේ තත්වය වෙනස් කරන්න යහපත් තත්වයක් මේ ආයතනය තුළ ගොඩනගලා, ජනතාවට අවශ්‍ය කරන ජනතාවගේ සේවාවන් කාර්යක්ෂමවත්, විධිමත්වත් පවත්වාගැනීම සඳහා මා සතු ප්‍රබල අවිය මහා සභාව. මේ සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු, අත්දැකීම් වලින් සැලකිය යුතු අවබෝධයක් අත්පත් කරගෙන සිටින මන්ත්‍රීවරු. ඒ නිසා ඒ කිසිම අභියෝගයක් මට ජයගත හැකියි. නැවත කියනවා මගේ එකම අවිය මහා සභාව. කිසිදු භේදයකින් තොරව ඔබ හැමදෙනාම මොරටුව ජනතාවගේ වගකීම ඉෂ්ට කරන්න ඉතාමත් අවබෝධයක් සහිතව උපරිමයෙන්ම කටයුතු කරයි කියන විශ්වාසය මා ළඟ තියෙනවා. මා කිසිදු බෙදීමකට ඉඩ නොතබා ඔබ හැමදෙනාම මහජන නියෝජිතයින් ලෙස ඔබට තියෙන ගෞරවය ආරක්ෂා කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබ තමයි අනාගත දවසේ මා දකින සිහිනය. මා විශ්වාස කරනවා. අප හැමදෙනාම එක අරමුණක් සහිතව පොදුවානයක් ගනිමින් එකමුතුකමක් සහිතව මේ අභියෝගයට මුහුණ දුන්නොත් අප නියත ලෙසම මොරටුවේ ජනතාවගේ ඒ සියලු අවශ්‍යතා ඉටු කරන මහා සභාවක් බවට පත්වෙන එක වළක්වන්න බැහැ. ඒ වෙනුවෙන් මා නව කළ හැකි, කළයුතු සියලු කැපකිරීම් කරනවා. අවශ්‍ය හැම මැදිහත්වීමක්ම කරනවා මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරගෙන. ඒ වගේම ඔබ දන්නවා නාගරික කොමසාරිස්තුමියගේ සිට පහළ සේවකයා දක්වා මේ ආයතනයේ යාන්ත්‍රණය සැලකිය යුතු ලෙස දුර්වල තත්වයක තියෙන්නේ. අප ඉක්මනින්ම මෙම යාන්ත්‍රණය ගොඩනගන්න නම් මේ ආයතනය තුළ මහා නගර සභා ආඥා පනත, අතුරු ව්‍යවස්ථාව, ආයතන නීති සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ යන මේ නීති රාමුවට යටත්ව ඉතාම කඩිනමින් නගරාධිපතිවරයාගේ සිට පහළ සේවකයා දක්වා අප විනය සකස් කළ යුතුයි. අපේ ප්‍රධානම අභියෝගය. ඒ විනය නිසියටම පිහිටුවා ගන්න අපි සමත් වුණොත්, මේ යාන්ත්‍රණය ඉතාම හොඳින් කඩිනමින් ගොඩනගන්න සමත් වුණොත්, අපි බලාපොරොත්තු වන කාර්යක්ෂම විධිමත්, ජනතාවගේ බදු මුදල් ඉතාම හොඳින් ඵලදායී ලෙස අවශ්‍ය සේවාවන් ඉටු කර දීමට අපට හැකියාව ලැබෙනවා. මා දැඩි ලෙස විශ්වාස කරනවා අතිශය වැදගත් ආදර්ශය. මා දැඩි ලෙස විශ්වාස කරනවා සමහර නීති වලින් කරන්න බැරි දේවල් ආදර්ශය හරහා සාකච්ඡාවෙන්, සම්මුතියෙන්, එකඟතාවයෙන් කළ හැකියි කියා.

ගෞරවනීය මන්ත්‍රීවරුනි, අපේ ආයතනය තියෙන තත්වය සතුටුදායක නොවන බව ඔබ දන්නවා. ඉතිහාසයට දොස් කියලා වැඩක් නැහැ. ඒ ඉතිහාසයේ අත්දැකීම් හොඳින් ඉගෙනගත් අය, ඒ අත්දැකීම් මස්සේ අපි ඉදිරියට යා යුතුයි. ඒ නිසා ඔබ හැමදෙනාගෙනම නැවතත් ඉල්ලා සිටින්නේ අප කවුරුත් එක වගේ එකමුතුව මේ අසතුටුදායක තැනක තියෙන ආයතනයක් නගා සිටුවන්න මහන්සි වෙමු. කැප වෙමු. මේ තමයි අවස්ථාව. අප ඔබ හැමදෙනාටම අපේ මන්ත්‍රීධුර කාලය වසර 04 යි. මා දන්නවා මා වසර 29 ක් මෙතන ඉන්නවා. මැක්සි මන්ත්‍රීතුමා වසර 19 ක්. අපි දීර්ඝ කාලයක අත්දැකීම් ලබපු මන්ත්‍රීවරු. පටු පාක්ෂික දේශපාලන මතිමතාන්තර වල ගැවෙන්නේ නැතුව, බෙදීම් හදාගන්නේ නැතුව අපි කවුරුත් ප්‍රාර්ථනා කරන යහපත් ලස්සන මොරටුවක් හදාගන්න අපට පුළුවන්. මා නැවත කියනවා මේය අවස්ථාව. ඒ නිසා මා ඉතිහාසයට දොස් කියන්නේ නැහැ. නමුත් ඉතිහාසය අපට දායාදයි ඒවා නැතුව වර්තමානයේ නිවැරදි මගට මෙම ආයතනය අවතීර්ණ කරන්න බැහැ. ඒ නිසා මම ඔබට වගකීමෙන් කියනවා දේශපාලන බලය අත්තනෝමතික ලෙස නැවත මේ ආයතනයේ පාවිච්චි වෙන්නේ නැහැ. ඔබ සැවොම නීතියේ අණ පනත් වලින් අපට දීලා තියෙන ඒ නීති රාමුව ඇතුළේ අපි කටයුතු කරමු. ඒ වෙනුවෙන් මා නැවත කියනවා මට කළ හැකි, කළ යුතු බොහෝ දේවල්, බොහෝ කැප කිරීම් කරනවා. ඔබට මතක් කරනවා අපේ මූල්‍ය තත්වය තියෙන්නේ හොඳ මට්ටමක නොවෙයි. මේ වන විටත් මේ ආයතනයේ වැටුප් ගෙවීම සඳහා අප බදු මුදල් වලින් 40% ක් යෙදවිය යුතුයි 60% යි අපට ප්‍රතිපූර්ණය වන්නේ. ඒ වගේම ඔබ දන්නවා මේ වැටුප් වැඩි වීමත් සමඟ 2027 ට අපට

සේවකයින්ගේ අතිකාල ගෙවන්න වෙන්නේ. ඒ නිසා ම විශේෂයෙන් මූල්‍ය පැත්තෙන් අපේ ආදායම මේ නිසා සැලකිය යුතු ප්‍රමාණයක් අපි අතින් ගිලිහිලා තියෙන්නේ. ඒ ආදායම් නැවත මේ ආයතනයට ගලාගෙන එන ක්‍රියාවලියක් සභාවේ වගකීමක් ලෙස භාර අරගෙන කළ යුතුයි. එය අපේ ප්‍රධාන කාර්යය වෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, අපට තවදුරටත් කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන හොඳ සැලැස්මක්, අපි හිතනවා මොරටුව නගර සංවර්ධන සැලැස්ම, අපි දින යොදාගෙන තියෙනවා ඉදිරිපත් කරන්න, සාකච්ඡා කරන්න. අපි සැමගේ අදහස් උපදේශකගෙන් දැනුම අවබෝධය එකතු කර ගනිමින් ඉතාමත් හොඳ සැලැස්මක් ගොඩනගා ගන්න ඕන. ඒ සැලැස්ම මත අපට අපේ අභියෝග ජයග්‍රහණය කරගත හැකියි. ඔබ දන්නවා එක පැත්තකින් මේ ආයතනය විදිහට අපේ භෞතික සම්පත් ආරක්ෂා කරගන්න ඕන වගේම ඒවා වැඩිදියුණු කරගන්න ඕන. අපේ ප්‍රමුඛ වගකීම ඉතාමත් යහපත් විධිමත් සේවයක් සලසන්න නම් අපි සතුව තියෙන දේ ආරක්ෂා කර ගැනීමටත්, එය වැඩිදියුණු කරගැනීමටත්, ඒ වගේම සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කොට ඔවුන්ගේ සුභ සාධනයන් හොඳින් පවත්වා ගැනීමට කටයුතු කිරීමත්, ඒ වගේම මහජන සේවා කාර්යක්ෂම කිරීමත්, විධිමත් කිරීමත්. ඒ කටයුතු කිරීමේදී මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාව හා අනෙකුත් ආයතන සමඟ හොඳ සහජීවනයක් සදාගෙන කටයුතු කරන්න අප සූදානම්.

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන් අපගේ පරිසර පද්ධතිය බොල්ගොඩ, ලුනාව කලපුව වගේ, විශේෂයෙන් වෙරළ තීරය, එක පැත්තකින් විශාල ආදායම් උත්පාදනය කළ හැකි විභවයන්, මොරටුව සංවර්ධනය කිරීමේදී ප්‍රමුඛ ස්ථාන හොඳින් ආරක්ෂා කොට යොදාගැනීම සඳහා අපට සැලැස්මක් අවශ්‍ය වෙනවා. ඒ වගේම වඩු කර්මාන්තයත්, ධීවර කර්මාන්තයත් අපේ භූමියේ තියෙන ප්‍රධානම වෘත්තීන්. ඒවා අද වෙනකොට සැලකිය යුතු ලෙස බිඳ වැටිලා. එම ජනතාව කොටස් අසරණ ලෙස තමන්ගේ එදිනෙදා ජීවිත ගත කරනවා. ඒ පිළිබඳව අපේ අවධානය යොමු කරගත යුතුයි. මම අදහස් කරනවා හොඳින් දින කීපය ඇතුළත් මොරටුව නගරය අලංකාර නගරයක් බවට පත් කරගන්න. ඔබත් මමත් හැමදාම දැකපු අපිළිවෙළ අවිධිමත් නගරයක් අප සතුව තියෙන්නේ. ඒ නිසා කඩිනමින් වැඩ පිළිවෙලක් සකස් කරගත යුතුව තියෙනවා. මම බලාපොරොත්තු වෙනවා මොරටුව නගරය ඉතාම හොඳින් පළමු පියවර ලෙස අලංකාර නගරයක් බවට පත් කරගන්න එක. මේ වෙනකොටත් මොරටුවේ ජනතාවගේ විශ්වාසය යම්තරම් දුරකට මේ ආයතනය පිළිබඳව බිඳ වැටිලා තියෙනවා. ඔවුන්ගේ ආකල්ප ඉතාම කඩිනමින් තියෙන තත්වයෙන් වෙනස් කරගැනීමේ වගකීම මේ සභාව සතුව තියෙන්නේ.

ගෞරවනීය මන්ත්‍රීවරුනි, නිලධාරී මහත්ම මහත්මීනි, සේවකයිනි, අපි කාටත් පොදුවේ මේ පැවරුණු වගකීම යහපත් මහා නගර සභා පාලනයක්, මහජනතාවගේ පාලනයක්, ජනතාවගේ විශ්වාසය දිනාගත් පාලනයක්. ආකල්පමය වෙනසක් ඇති කළ පාලනයක් ගොඩනැගීම වෙනුවෙන් මා මට කළහැකි සහ කළ යුතු සියලු දේ කරනවා. ඒ වෙනුවෙන් උදව් කරන්න, සහයෝගය දෙන්න. මා සියල්ල දන්නා කෙනෙක් නොවන බව, ජනාධිපතිතුමා කියනවා වගේම අපි හැමදේම දන්නා අය නොවෙයි. බොහෝ අතපසුවීම්, සමහර අඩුපාඩු දක්වෙන්න පුළුවන්. ඒ හැම වෙලාවක ඒවා පෙන්වලා දෙන්න. ඔබගෙන් නිහතමානීව ඒ හැමදෙයක්ම පිළිගන්නවා. අවසාන අරමුණ වූයේ මොරටුවේ ජනතාවට ඉතාමත් යහපත් පාලනයක්. අනාගතයට ඉතාමත් හොඳ මොරටුවක් ගොඩනැගීමේ වැඩසටහන ඉදිරිපත් කරමින් ඒ වෙනුවෙන් හැමෝම නැවතත් උදව් කරන්න, සහයෝගය දෙන්න කියන ආයාචනය කරමින් මාගේ කතාව අවසන් කරනවා.

## 03. <u>යෝජනා :-</u>

**03(01) ගරු නගරාධිපති, කේ.ඩී. නිශාන්ත ප්‍රදීපාන්ත මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 175 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මොරටුව මහා නගර සභාවේ පහත සඳහන් තනතුරු විධායක තනතුරු ලෙස නම් කල යුතු යැයි යෝජනා කරන්නීය.

I. නාගරික කොමසාරිස්
II. නියෝජ්‍ය නාගරික කොමසාරිස්
III නාගරික ලේකම්
IV. ප්‍රධාන නාගරික ගණකාධිකාරී
V. ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරී
VI. ප්‍රධාන නාගරික ආයුර්වේද වෛද්‍ය නිලධාරී
VII. නාගරික යාන්ත්‍රික ඉංජිනේරු
VIII. නාගරික ඉංජිනේරු
IX. නාගරික ගණකාධිකාරී (ආදායම්)
X. නීති නිලධාරී
XI. ප්‍රධාන භාර නිලධාරී (ගිනි නිවීම්)
XII. නාගරික විදුලි අධිකාරී
XIII. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක

**ඉහත අංක 03(1) දරණ යෝජනාව මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - පී. සචින් දුමින් පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ආරම්භයේදී ඉතාමත්ම හොඳ කතාවක් කළා. ඔබ ජන මතයක් ලැබිලා තියෙනවා ඔබතුමාට 34,000 ක. ඒ ජනවරම ගෙනියන්න පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියලු දෙනාම ඔබතුමන්ලාට එකඟත්වය පළ කරලා තියෙනවා. මාලිමාවට ඡන්දය ලබාදුන් මිනිසුන්ගේ ජන වරමත්, අපේ ජන වරමත්, මේ සභාවේ ඔබතුමා නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඇතුළු සභාගෙන් පත්වෙන මේ කමිටු වල සියලුම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය සුරැකිය යුතුයි කියලා මං විශ්වාස කරනවා. ඒ නිසා 252 වන අධිකාරය 175 (1) වගන්තියට අනුව ඔබතුමා මේ වෙලාවේදී විධායක නිලධාරීවරුන් 13 දෙනෙක් පත් කරන්න සභාවට යෝජනා කරලා තියෙනවා. ඒ 175 (1) වගන්තියට අනුව සභාවේ තනතුරු සහ පුර නගරින් විධායක තනතුරු ලෙස සළකනු ලැබිය යුතුයි, ඒවා මහා නගර සභාවක් විසින් යෝජනා සම්මත මඟින් ප්‍රකාශ කළ හැකියි කියලා තියෙනවා. පළමුවෙනි කරුණට අදාළ කාර්යය හා කර්තව්‍යයන් 175(2) න් පැවරෙනවා. ඒ පැවරීමේදී තියෙන එක තමයි ප්‍රශ්නය බවට පත්වෙන්නේ. 175(2) න් කියනවා මේ ආඥා පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නමින් වෙත පවරා ඇති හෝ කමිටුව නියම කර ඇති හෝ නමින් සතු කර ඇති හෝ නමින් වෙත පවරා දෙන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ලම ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම සභාවේ විධායක නිලධාරීන් වෙත පැවරෙනවා. ඒ නිසා ඇත්තටම මේ සභාවේ අනාගතය මම විශ්වාස කරනවා අපේ සුදේශ් මන්ත්‍රීතුමා කාර්මාන්ත කමිටුවේ සභාපති විය යුතුයි. වෙන්න පුළුවන්, ඒ වගේම අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමිය ආයතන කමිටුවේ සභාපති ධුරයට පත් වෙන්න පුළුවන්. අපේ

රංගන මන්ත්‍රීතුමා පෙන්වූ කමිටුවේ සභාපති වෙන්න පුළුවන්. මේ විධායක සභාපතිවරු වලට උඩින් තමයි කමිටුව තියෙන්න ඕනා. යම් සභා සම්මුතියකින් මෙය පැවරුවොත් වෙනස් කරන්න වෙන්නේ සභාවක් තුළින්ම තමයි. නමුත් මෙහි තවත් යෝජනා කියනවා කමිටු පත් කරන්න 26 වෙනි වගන්තිය අනුව ඉදිරිපත් කිරීමේදී එතන තියෙන ඇමුණුම පිළිබඳව මම සෑම මන්ත්‍රීවරයෙකුගේම අවධානයට යොමු කරනවා. එහි තියෙනවා ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව කියලා. එහි 4 වෙනි කාරණාවෙහි තියෙනවා "මහා නගර සභා ආඥා පනතේ 175 වන වගන්තියට අනුව මහා නගර සභාවේ කාරක සභා හා ධුර අතරින් විධායක සභාපති ලෙස පළකතු ලැබිය යුතු කාරක සභා හා ධුර කවරේද යන්න නිරීක්ෂණය හා නිර්දේශ අනුමැතිය පිණිස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම" කියලා. අද වන විටත් එය ස්ථාපිත කරලා නැහැ. අපි අහලා තියෙනවා 5 වන සියවසේ මහානාම හාමුදුරුවෝ ලියපු මහාවංශයේ තියෙනවා යස සහ සුභ කියලා. යසලාලක තිස්ස රජ්ජුරුවෝ ශුභ දොරටු පාලක සමග රජකම් මාරු කරගන්නා. අන්තිමේදී ශුභ යසලාලක තිස්ස රජතුමාව ශුභ කියන දොරටු පාලකයා රජ වුණාට පස්සේ කියනවා මොහුගේ හිස ගසා දමන්න කියලා. ඒ නිසා ජනවරම් සුරකින නගරාධිපතිවරයෙක් බවට පත් කරන්න. සද්භාවයෙනුයි අපි කතා කරන්නේ. හෙට අපි මැරෙන්න පුළුවන්. අසනීප වෙන්න පුළුවන්. මාළිමාවේ ඉන්න මන්ත්‍රීවරයෙක්ට ගෙදරකොට එන්න බැරි වුණා කියමුකො. අපි සද්භාවයෙන් ඔබතුමාට උදව් කරන්නේ. අපි උදව් කරන්නේ නැහැ කියලා කියමුකො. නමුත් මේ ධුර වෙනස් කරගන්න වෙන්නේ සභාවේ. ඒ නිසා විධායක බලතල තියෙනවා. ඔබතුමාගෙන් බලය ආරක්ෂා කරලා 14 හි 3 වන වගන්තියේ තියෙනවා විධායක නිලධාරියා බවට පත්වන්නේ ඔබතුමා. විධායක බලය තමයි පවරන්නේ. පවරන්න පුළුවන් 14(4) න්. මේ ආඥා පනතින් හෝ වෙනත යම් ලිඛිත නීතියකින් නගරාධිපති වෙත පිරිනැමී ඇති, නියමය වී ඇති, පැවරී ඇති බලතල කටයුතු හා කාර්යය කර්තව්‍ය අතරින් කිසිවක් නගරාධිපතිවරයා විසින් නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ කොමසාරිස්වරයාට හෝ සභාවේ යම් නිලධාරියෙකුට ලිඛිත නියමයක් මඟින් පවරා දෙන්න පුළුවන්. එහි 5 වන වගන්තියෙන් කියනවා නගරාධිපතිවරයාගේ නියමයක් මඟින් තමා වෙත පවරා දෙනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක්, නියෝජ්‍ය නාගරාධිපතිවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ වෙන යම් නිලධාරියෙක් විසින් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම, නගරාධිපතිවරයාගේ විධිවිධාන වල නියමයන් දැක්වෙන් කොන්දේසි හා සීමාවන් වලට බාධා වුණොත් ලිපියකින් ඔබතුමාට පවරගන්න පුළුවන් විනාඩි දෙකක් යන්න කලින්. සභාව රැස් කරන්න ඕනේ නැහැ. අපි හිතනවා ඔබතුමා අවුරුදු 27 ක් මේ නගර සභාව තුළ යම් කාර්යභාරයක් කළා. ඒ නිසා ඉදිරියට මේ විපක්ෂයේ සිට අපේ කාලයේ මනුෂ්‍යයෙක් විදිහට අපි කැමතියි ඔබතුමාට සහයෝගය දීලා මේ රටේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න. වර්ග කි.මී. 23.4 ක, ග්‍රාම සේවා වසම් 42 ක, කොට්ඨාශ 29 ක, පවුල් 40128 ක්, ඡන්ද දායකයින් 167,429 කගේ අරමුණු ඉටු කරන්න ඕනා. ඒ නිසා එදා යසලාලක තිස්ස වගේ දොරටු පාලකයෙක් බවට පත් කරන්න එපාමයි. මේ නිසා 14 න් ක්‍රියාත්මක කරන්න. අපි මෙදිමක් ඉල්ලන් කැමති නැහැ ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා මෙය ආයතන කමිටුවට දාලා මෙතන විධායක නිලධාරියා ද පත් කරන්නේ කියලා තීරණය කරන්න. ඔබතුමාගේ බලය ඔබතුමා තියාගන්න. ඔබතුමා නිලධාරීවාදය ගැන කතා කළා. මේ නිලධාරීන් ඔක්කොම හොඳයි. ඒ නිසා අනවශ්‍ය නිලධාරිවාදයක් පටලවනවා නම් ඒකේ වගකීම ගන්නේ කවුද කියලා මම දන්නේ නැහැ. මෙය හැදුවේ ඔබතුමාද වෙන කවුද කියලා දන්නේ නැහැ. අපේ සද්භාවයක් තියෙනවා ඔබතුමාට ඇත්තටම උදවු කරන්න. ඒ නිසා තමයි කිව්වේ අපි සියලු දෙනාම කතා කරලා මේ සියලුම මන්ත්‍රීවරු ඔබතුමා ළඟට ගිහිල්ලා, ජනක මන්ත්‍රීතුමා, ඔසඳ මන්ත්‍රීතුමා, සුජිත් මන්ත්‍රීතුමා, සුරේෂ් මන්ත්‍රීතුමා, තිලකසිරි මන්ත්‍රීතුමා කණ්ඩායමක් විදිහට ගිහින් මේ සියලු දෙනාගේම නියෝජනය ඔබතුමාට කිව්වා. මේ කමිටු ටික පිහිටුවන්න. මේ කමිටුවලම සභාපතිවරු මාලිමාවෙන් පත් කරන්න.

**මීගමු නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, සජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ ඔබතුමා 175(1) න් තමයි මේ අදහස් යන්නේ විධායක බලතල. මෙතෙක් කල් නගර සභාවේ විධායක නිලධාරීන් පත්කලේ නැහැ. එයි නාගරික කොමසාරිස්වරියගේ නම කොමසාරිස් කියලා තියෙනවා. විධායක නිලධාරියෙක් හැටියට නාගරික කොමසාරිස් ඉබේටම පත්වෙනවා. සභාවෙන් පත්කරන්න ඕනෙ නැහැ. පත්වෙනවා. ඉතිරි නිලධාරීන්ට විධායක නිලධාරීන් කලොත් ප්‍රශ්නය තියෙන්නෙ සභාවෙන් තමයි මෙය පත් කරන්නේ, කමිටු සභාපති පත්කරන්නෙ කමිටුවෙන්. කමිටුවේ සභාව තමයි උත්තරීතර. සභාව ඉන්නේ ධූරාවලියේ නගරාධිපතිතුමාටත් උඩින්. සභාව තමයි සියලු තීන්දු තීරණ ගන්නේ. අපි සභාවෙන් තීන්දු කලාම A, B, C කියන නිලධාරීන්ව විධායක නිලධාරීන් ලෙස පත්කිරීම දුන්නාට පසුව කමිටුවේදී කමිටු සභාපතිට බැරි වෙනවා. කමිටු සභාපතිගේ තියෙන අධිකාරී බලය සීමිතෙනවා. එහෙකොට කමිටු සභාපතිට බැහැ අදාල තීන්දු තීරණ ගන්න නිලධාරීන් ඉද්දී. නිලධාරීන් තමයි බලවත්. යම්හෙයකින් නිලධාරියා අකාර්යක්ෂමතාවක් කලොත්, ඔබතුමාගේ ප්‍රතිපත්ති වලට පටහැනිව වැඩ කරන්න ගත්තොත්, ඔබතුමා මට වඩා හොඳට දන්නවානේ මෙහි තත්වය. එහෙම උනොත් ඔබතුමාටවත් බැරි වෙනවා නිලධාරියාව පාලනය කරන්න. ඔබතුමා වරදවා තේරුම් ගන්න එපා. නගරාධිපතිවරයාට ප්‍රමුඛත්වය තියෙන්න ඕනෙ නිලධාරියාට නියෝග නිකුත් කරලා අදාල නිලධාරියා වැඩ කරන්නේ නැත්නම් ඒ වැඩේ වෙන කෙනෙකුට පවරන්න. එහෙකොට ඒක කරන්න බැරි වෙනවා. ඒ නිසා අපි කියන්නේ මෙතෙක් කල් කලේ 14(4) න් තමයි මෙතෙක් කල් බලය පැවරුවේ නිලධාරීන්ට. අපිට නෙමෙයි මේ ප්‍රශ්නය වෙන්නේ ඔබතුමාට. මේ ඉන්න මන්ත්‍රීවරු, කමිටු සභාපතිවරු වෙන්න ඉන්න මන්ත්‍රීවරු. ඒ නිසා කරුණාකරලා මන්ත්‍රීවරුන්ව හැල්ලුවට පත් නොකොට, කමිටු සභාපතිවරු හැල්ලුවට පත් නොකොට, කමිටු ටික හැල්ලුවට පත් නොකොට අපි ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමාගෙන් 14(4) න් බලය පවරන්න. ඒවා සභාවට දාන්න ඕනෙ නැහැ ඇත්තටම. ඔබතුමාට බලය තියෙනවා ඔබතුමා විධායක නිලධාරියා හැටියට මෙහි ප්‍රධානියා හැටියට ඔබතුමාට බලය තියෙනවා ලිපියකින් බලය පවරන්න. ඔබතුමාට හැඟී ගියොත් මෙයා එය කරන්නෙ නැහැ කියලා ඒ බලය නැවත වරක් ගැනීමේ හැකියාවත් ඔබතුමාට තියෙනවා. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමාගෙන් ඕනෙ නම් මෙය සාකච්ඡා කරන්න. තව විනාඩි 5 ක් කල් තියලා මෙය සාකච්ඡා කරලා හරි මේ වැඩේ කරන්න එපා. මෙය කලොත් ඔබතුමාට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා අනාගතයේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා 14(4) න් මේ බලය පැවරීම කරන්න. ඒක තමයි මෙතෙක් කල් වුණේ. මෙතෙක් කල් වුණ දේ කරන්න කියනවා නෙමෙයි. නමුත් එහෙම නොකර මේ නගර සභාව යන්න බැහැ. ඒ නිසා අපි කියන්නේ විධායක බලතල පත් කරලා කමිටු සභාපතිවරු වෙන්න ඉන්න උදවියව හැල්ලුවට පත් කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු නගරාධිපති - ජේ.ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා**

ගරු මන්ත්‍රීවරුනි, සාමාන්‍යයෙන් සභාවක සම්ප්‍රදාය ලෙස අඛණ්ඩව පැවතුණු කාරණාවක් මිස එතනින් වෙනස් වුණු එකක් නොවන බව පළමුව මතක් කළ යුතුයි. මම කතා කරන කාරණාට ඇතුලේ මුල මැද අග නැති ප්‍රතිවිරෝධතා ගොඩක් සජිත් මන්ත්‍රීතුමාගේ කතාවෙන්, සුජිත් මන්ත්‍රීතුමාගේ කතාවෙන්. නගරාධිපතිවරයාටත් උඩින් සභාව. ඒ සභාවට බලය තියෙනවා මේ තීන්දුව එකක් වෙනස් කරන්න. දැන් මම ඔය මතුකරන තර්කය මගම අත ඇරලා මේ සභාවේ මේ විධායක නිලධාරීන් පත් කරනවා. 2018.04.19 සමින්ලාල් නගරාධිපතිතුමන් ඉදිරිපත් කරනවා අංක 5 යටතේ 175(1) යෝජනාව. මේ සභාව අනුමත කරනවා. මම මෙහි සභාවේ නම විදිහට කියන්න යන්නෙ නැහැ. රවීනාත් ගුණසේකර නගරාධිපතිතුමා 2002.04.30 175(1) යටතේ මෙය ඉදිරිපත් කරනවා. මෙහිත් ඔබතුමන්ලාගේ නම් සහිතව තියෙනවා. අනුමත කරනවා. ඒ නිසා ඉතිහාසයේ සිද්ධවුණු එකක්. නමුත්

ඔබතුමන්ලා මතු කරන තර්කය ඇතුළේ අපට සංවාදයක් අවශ්‍ය නම් මම සූදානම්. අපි කමිටුවකට මෙය යොමු කරලා සාකච්ඡා කරමු. එම එකඟයි. නමුත් මහනා තියාගන්න බලය අනවශ්‍ය ලෙස මම අත හරිනු ගැනීම හෝ බලය හැමවිටම ජනතාවගේ අවශ්‍යතාවය සඳහා භාවිත කරගැනීමේදී බලය විමධ්‍යගත කරන්න වෙනවා. මේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්. මේ ආයතනයට සිදු වුණේම ඒක. කොමසාරිස් බලතල එතුමියට. ලේකම් බලතල එතුමාට. මේ ආයතනයේ පරිපාලනය ඔවුන් සතුයි. දේශපාලන අධිකාරියට නැඹුරුම් සකස් කිරීම, ප්‍රතිපත්ති හැදීම, අවශ්‍ය මගපෙන්වීම. දැන් මේ ආයතනයේ දිගටම සිදුවුණේ දේශපාලන නායකත්වය විසින් සේවකයා පාලනය කළා. සේවකයා විසින් අත්පත් කරගත් වැරදි බලයක් ප්‍රධාන නිලධාරීන් පාගගෙන ගියා. අපේ අත්දැකීම ඒක. අදත් යම්කිසි දේශපාලන බලය අත්පත් කරගෙන රඟපු අය තවමත් හොල්මන් අවතාර වගේ මේ සභාවේ කටයුතු වලට බාධා කරනවා. මෙම ශක්තිමත් නිලධාරීන් සහ මෙහි පාලන යාන්ත්‍රණය දැන් කැඩිලා තැන් තැන් වලින් විසිරිලා. මෙය එකරාශි කරන්න. ඒ නිසා මාගේ පළමුවෙනි අරමුණ මෙය ශක්තිමත් කරන්න. එතකොට අපි කාටත් පහසුයි වේවියි. සභාව සතු බලය එහෙමමම තියෙනවා. ඒකට හානියක් නැහැ. නගරාධිපතිගේ බලය එහෙමමම තියෙනවා. ඒකට හානියක් නැහැ. ඒ නිසා මම කියන්නේ මෙය අනුමත කරලා ඒ අවශ්‍ය කටයුතු කරමු. ඔබ කියන පරිදි එහෙම ඕනනම් නම් කමිටුවට ඇරලා සාකච්ඡා කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට එහෙම මෙහෙම කියලා එකක් නැහැ. අපි විපක්ෂයෙන්. මේ කිරීමේදී ඔබතුමා දිගින් දිගටම කියනවා අපි අනාගතයේ සාමූහිකත්වයෙන් වැඩ කරමු, මේක මෙහෙම යමු කියලා. ඒ නිසා අපි දකිනවා දෙයක් ඔබතුමා අවුරුදු 29 ක් නාගරික මන්ත්‍රීවරයෙක් වෙලා ඉඳලා ඔබතුමා මෙතනට ගියේ. නමුත් අපිත් අවුරුදු 16 ක් නාගරික මන්ත්‍රීවරයෙක් වෙලා ඉඳලා මෙතනට ඇවිල්ලා තියෙනවා. ඒ නිසා අපිත් යම්කිසි දෙයක් දකිනවා. අපිට ප්‍රශ්නයක් නැහැ ඔබතුමා හිතනවා වගේ. ඔබතුමා බොහෝම සද්භාවනාවෙන් යුක්තව සාමයේ දෑත් දිගු කරලා හැමෝම එකට තියාගෙන යන්න යම් ගමනක් උත්සහ කරනවා. එය අපි අගය කරනවා. තිශාන්ත ප්‍රදීපානන්දත් සමඟ යම්කිසි ප්‍රශ්නයක් අපිට තිබුණා නම් තිශාන්ත ප්‍රදීපානන්ද නගරාධිපතිවරයා සමඟ අපිට ප්‍රශ්න නැහැ. ඔබතුමාද නගරාධිපතිවරයා වුණාට පසුව ඔබතුමාගේ හැසිරීම අපි බොහෝම අගය කරනවා. හෙට දවසේ මොනවා වෙයිද දන්නේ නැහැ. මේ දක්වා විපක්ෂය හැටියට අපි අගය කරන ලක්ෂණ ඔබතුමා පෙන්නුම් කරනවා. නමුත් ඔබතුමායි මමයි දෙන්නාම දන්නවා පසුගිය කාල සීමාව තුළ මෙතන හොල්මන් කරපු උදවියගේ ප්‍රධානියාගේ ඉඳලා අතීත කාර්ය ඉස්සෙල්ලාම ඒ ප්‍රධානියාට හොල්මන් කරන්න මෙහෙයවුවේ කවුද කියන එක පිළිබඳව ඔබතුමා හොඳටම දන්නවා. ඒ නිසා එම කියන්නේ ඔය බල්ලේ අත් වලට හයිය දීලා ඔබතුමා ඔබතුමාගේ බෙල්ල මිරිකාගන්නයි මේ හදන්නේ. ඒ නිසා අපිට ප්‍රශ්නයක් නැහැ. මෙතනින් එහාට අපි මේක කතා කරන්නේ නැහැ. අපිට ගැටළුවක් නැහැ ඔබතුමා මේක කරගෙන යන්න. නමුත් මේක නැවත වරක් සභාවට ගේන දවසට ඔබතුමාට 26 තීරක ඡන්දයක් පත් කරගන්න පුළුවන්, නමුත් තීරක ඡන්දයෙන් පත් කරගන්න බැරි වෙලාවක් ආවොත් එහෙම ඔබතුමා අන්ත අසරණභාවයට පත්වෙනවා. ඒ නිසා අපි කියන්නේ මේ විධායක බලතල බෙදීම සම්බන්ධයෙන් අපි අපේ විරුද්ධත්වය පත් කරනවා. බලය බෙදීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නැහැ. බලය තියෙන්න ඕනේ. නිලධාරීන්ට වැඩ කරන්න ශක්තිය දෙන්න ඕනේ.

<u>ගරු නගරාධිපති - එස්.වී. තිශාන්ත ප්‍රදීපානන්ද මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අංක 03(01) යෝජනාව ආයතන කමිටුවට යොමු කරලා සාකච්ඡා කරන්න තියා දන්වා සිටිනවා.

03(02) ගරු නගරාධිපති, ජේ.ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 189 වගන්තිය ප්‍රකාරව මොරටුව මහා නගර සභා අරමුදලින් ගෙවීම් සඳහා වන චෙක්පත් වල අත්සන් කිරීමේ බලය පහත සඳහන් නිලධාරීන් වෙත පැවරිය යුතු යැයි යෝජනා කරන්නීය.

- චෙක්පත් වල පළමු අත්සන තැබීමේ බලය

ප්‍රධාන නාගරික ගණකාධිකාරී - එන්.ඩී.ටී. ප්‍රියවර්ධනී මහත්මිය හෝ
නාගරික ගණකාධිකාරී (ආදායම්) - එම්.ටී.අයි කුමාරරත්න මහතා හෝ
පරිපාලන නිලධාරී (මූල්‍ය) - ඩබ්. ජයවික්‍රම මහත්මිය

- චෙක්පත් වල දෙවන අත්සන තැබීමේ බලය

නාගරික කොමසාරිස් - එල්.සී. මිහෝජා එස්. පතිරණ මහත්මිය හෝ
නියෝජ්‍ය නාගරික කොමසාරිස් - එම්.කේ.ඩී.ටී. මුණසිංහ මහතා හෝ
නාගරික ඉංජිනේරු - සී.අයි. ගමිසිංහ මහතා හෝ
පරිපාලන නිලධාරී (පරිපාලන) - එන්.ජේ. කස්තූරි මහත්මිය හෝ
පරිපාලන නිලධාරී (කාර්මාන්ත) - ඩබ්.යූ.පී.චන්ද්‍රශීල මහත්මිය

ඉහත අංක 03(2) දරණ යෝජනාව නියෝජ්‍ය නගරාධිපති, ඩබ්.පී. ප්‍රභාෂිණී වික්‍රමසිංහ මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

අංක 03(02) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03(03) ගරු නගරාධිපති, ජේ.ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

252 අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 26 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මොරටුව මහා නගර සභාව සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව ඇතුළුව 2019.10.03 මහා සභා රැස්වීමේ අංක 07 (09) 37 යටතේ විෂය පථයන් අනුමත වී ඇති පහත සඳහන් ස්ථාවර කමිටු 09 ක් ස්ථාපිත කොට පවත්වාගෙන යා යුතු බවටත්, එම කමිටු සඳහා සභිකයන් තෝරා පත්කර ගතයුතු බවටත්, ඒ ඒ කමිටු සඳහා පවරා දී ඇති (න්‍යාය පත්‍රයේ ඇමුණුම 01 හි දැක්වෙන) බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරිය යුතු බවටත්, යෝජනා කරන්නීය.

I. ඉඩම් හා නාගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව
II. මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව
III. ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව
IV. පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුව
V. ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව

VI. ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුව
VII. ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුව
VIII. කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුව
IX. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව

**නගර සභාවේ ඇමුණුම 01**

## ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව

i. සභාව සතු ඉඩම් පරිපාලනය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. ඉඩම් කට්ටි කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම් විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ පැලපුම් හඳුනාගෙන උචිත බලධාරියා වෙත නිර්දේශ කිරීමට මහා සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

iii. මාර්ග සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. නගර සංවර්ධන යෝජනා පිළිබඳව මහා සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යයනය කර නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම.

v. විෂයට අදාළව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. ඉඩම්, නිවාස, ගොඩනැගිලි හා නගර සංවර්ධනය යන අංශයන්ට අදාළ සියලුම ආකාරයේ ඉදිකිරීම් ඇස්තමේන්තු කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කිරීමට නිර්දේශ කිරීම.

vii. ඉඩම්, නිවාස, ගොඩනැගිලි හා නගර සංවර්ධනය යන අංශයන්ට අදාළ සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිළධාරීන්, විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් පාරම්භයක් ලබා ගැනීම.

## මහජන උපයෝගිතාව, කාන්තා හා ළමා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව

i. නාගරික බල ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන සංවිධාන ඇති කිරීම, පවත්වාගෙන යෑම, ඒ සංවිධාන ශක්තිමත් කිරීම සහ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යයන්ට ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමෝපායයන් පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. නාගරික බල ප්‍රදේශය තුළ පොදු වෙළඳපොළ සහ සතිපොළ පැවැත්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. නාගරික බල ප්‍රදේශය තුළ පූජා ශාලා ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. මහා නගර සභාව විසින් නඩත්තු කරනු ලබන මහජන පුස්තකාල පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ ඇති කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහාය ලබා දීමට අදාළ නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. නාගරිකය තුළ ඇතිවිය හැකි ගිනි ගැනීම් වැළැක්වීම හා ගිනි නිවාරණය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. නාගරිකය තුළ ජීවත්වන නාගරික ජනතාවගේ ආපදා අවස්ථා කළමනාකරණය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පූජා ශාලා පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ix. මහා නගර සභා බල ප්‍රදේශය තුළ සියලුම වීථි, මාර්ග, මංසංධි, පටු මංවල රථ වාහන ගමනාගමනය නියාමනය හා පාලනය කිරීම පිළිබඳව මහා සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යයනය කර නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම.

x. වීථි හා පොදු ගොඩනැගිලි ආලෝකකරණය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xi. විෂයට අදාළව මහා සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස් කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ නිර්දේශ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xii. ගිනි නිවීම් සේවා, පෙර පාසල්, විදුලිය, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පූජා ශාලා හා පූජා සංවර්ධනය පිළිබඳ සියලුම ආකාරයේ ඉදිකිරීම් ඇස්තමේන්තු කාර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කිරීමට නිර්දේශ කිරීම.

xiii. ගිනි නිවීම් සේවා, පෙර පාසල්, විදුලිය, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පූජා ශාලා හා පූජා සංවර්ධනය සම්බන්ධ සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ නිර්දේශ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiv. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිලධාරීන්, විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබා ගැනීම.

## ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව

i. මහා නගර සභාවේ සංයුක්ත සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා පරිපාලන වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ එකතුමින් සැලසුම් හා වාර්තා පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. මහා නගර සභාවට අවශ්‍ය තනතුරු හා ධුර ඇති කිරීම පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු ඉහළ බලධාරීන්ට වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස අධ්‍යයන කර නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. මහා නගර සභාවට අවශ්‍ය බවට ගරු ආණ්ඩුකාරතුමා හා ඉහළ බලධාරීන්ට වෙත නිර්දේශ සකසන තනතුරු හා ධුර පිළිබඳව වැටුප්, දීමනා හෝ පාරිශ්‍රමික නියම කිරීමට හැකිවනු පිණිස අධ්‍යයනය කර මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

iv. මහා නගර සභා ආඥාපනතේ 175 වන වගන්තියට අනුව මහා නගර සභාවේ තනතුරු හා ධුර අතරින්, විධායක තනතුරු ලෙස සලකනු ලැබිය යුතු තනතුරු සහ ධුර කවරේද යන්න නිරීක්ෂණ හා නිර්දේශ අනුමැතිය පිණිස මහා සභාවට ඉදිරිපත් කිරීම.

v. මහා නගර සභා කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ගමන් වියදම් හෝ පරිවර්තිත ගමන් වියදම් මුදා නියම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. මහා නගර සභා සභිකයන්ගේ සහ නිලධාරීන්ගේ නිවාස දුරකථන සැපයීම් සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. මහා නගර සභාවේ කාර්යයන්ට අදාළව මහා සභාව විසින් පවත්වා ගත යුතු දත්ත හා සංඛ්‍යාලේඛන කවරේද යන්න තීරණය කොට අනුමැතිය පිණිස මහා සභාවට ඉදිරිපත් කිරීම.

viii. මහා නගර සභාවේ ලිපිලේඛන වල ආරක්ෂාව සහ ලේඛනාගාර පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ix. සභිකයන්, නිලධාරීන් හා සේවකයන් පුහුණු කිරීම සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

x. මහා නගර සභාවේ කාර්ය මණ්ඩලයට කාර්ය පැවරීම හා ඒවා සමාලෝචනය පිණිස අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xi. මහා නගර සභාවට අදාළ නීති සංශෝධන පිළිබඳව ගනු ලැබිය යුතු ක්‍රියා මාර්ග කවරේද යන්න පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xii. ආයතනගත හා පරිපාලනික ලෙස මහා නගර සභාවේ ව්‍යවස්ථාපිත සියලු කරුණු පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiii. විෂයට අදාලව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiv. ආයතන, නීතිය, පරිපාලනය, ආරක්ෂාව යන අංග සම්බන්ධව සියලුම ආකාරයේ ඉදිකිරීම් ඇස්තමේන්තු කර්මාන්ත හා ඉදිකිරීම් ස්ථාවර කමිටුව වෙත යොමු කිරීමට නිර්දේශ කිරීම.

xv. ආයතන, නීතිය, පරිපාලනය, ආරක්ෂාව යන අංග සම්බන්ධව සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xvi. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිලධාරීන්, විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබා ගැනීම.

<u>සෞඛ්‍ය, පෝෂණ හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුව</u>

i. මානව හා සත්ව සෞඛ්‍ය නංවාලීම, බටහිර වෛද්‍ය සෞඛ්‍ය ආයතන සහ ආයුර්වේද වෛද්‍ය ආයතන පැවැත්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. මදුරුවන් සහ වෙනත් කෘමි සතුන් බෝවීම, ඒ මඟින් රෝග බෝවීම පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. නිවාසවල ඇති කරන සහ දඩාවතේ යන සුනඛයින් එන්නත් කිරීම, සුනඛ ගහනය පාලනය කිරීම හා ජලභීතිකා රෝගය පාලනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. අයාලේ යන සත්ත්වයන් හා එහි පාලනය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. ආසාදන රෝග හා වසංගත රෝග මර්දනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. වැසිකිළි සහ වසුරු වළවල් විධිමත් කිරීම, පාලනය හා ගලි බවුසර් සේවා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. සුසාන භූමි හා ආදාහනාගාර විධිමත් කිරීම සහ පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. නාගරික බල ප්‍රදේශය තුළ රැස්කරනු ලබන කසළ රැස්කිරීම, ප්‍රවාහනය, පිළියම් කිරීම, අවසන් බැහැර කිරීම සහ කානු පිරිසිදු කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ix. ආයුර්වේද ඖෂධ මිලදී ගැනීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

x. අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය මිලදී ගැනීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xi. පරිසර බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xii. පරිසර දූෂණ හා පරිසර ගැටලු පිළිබඳ විමර්ශනය කිරීම, ඒ සඳහා කළ යුතු අත්‍යවශ්‍ය වෙනස්කම් හෝ සංශෝධන සහ අනුගමනය කළ යුතු වඩාත් ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiii. ජනපද මිඩා පැලැස්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiv. කොම්පෝස්ට් වාර්තා, ආහාර පැවැලීම් වාර්තා, සැලූන් සේවා වාර්තා, බඩංගු මර්දන වාර්තා, ආයුර්වේද සේවා වාර්තා, මස් ප්‍රවාහන වාර්තා පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xv. විෂයට අදාළව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xvi. පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව යන අංශ සම්බන්ධ සියලුම ආකාරයේ ඉදිකිරීම් ඇස්තමේන්තු කර්මාන්ත හා ඉදිකිරීම් ස්ථාවර කමිටුවට යොමු කිරීමට නිර්දේශ කිරීම

xvii. සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධ සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xviii ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිලධාරීන්, විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබා ගැනීම.

## <u>ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව</u>

i. විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පොදු විනෝද කටයුතු සඳහා විනෝද බදු පැනවීමට අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික, සමාජයීය හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. නාගරික බල ප්‍රදේශය තුළ ජීවත්වන ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම හා ඒ පිළිබඳව අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. නාගරික බල ප්‍රදේශය තුළ පසාදු උත්සව, සංස්කෘතික ක්‍රියාකාරකම්, ආගමික උත්සව හා පූජා පිළිගැනීම් සංවිධානය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. නාගරික බල ප්‍රදේශය තුළ උද්‍යාන, උත්සව ශාලා ඇති කිරීම හා පවත්වා ගෙන යාම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. විනෝද බදු, සැණකෙළි පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. ක්‍රීඩා කටයුතු පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. නාගරික බල ප්‍රදේශය තුළ ක්‍රීඩා භූමි සහ ක්‍රීඩාගාර ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ix. විෂයට අදාළව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු දැක්වීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

x. ක්‍රීඩා කටයුතු, සුව සාධන හා පොදු විනෝද කටයුතු සම්බන්ධ සියලුම ආකාරයේ ඉදිකිරීම් ඇස්තමේන්තු කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කිරීමට නිර්දේශ කිරීම.

xi. ක්‍රීඩා කටයුතු, සුව සාධන හා පොදු විනෝද කටයුතු සම්බන්ධ සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාව මඟින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xii. ස්ථාවර කමිටුවට අදාළව තනිකයන්,නිලධාරීන්,විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබාගැනීම.

**ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුව**

i. ඉඩම් හැර සභාව සතු සියලුම නිශ්චල හා චංචල භෞතික සම්පත් පරිපාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ, අබලි ද්‍රව්‍ය වෙන්දේසි, ප්‍රාග්ධන භාණ්ඩ හෝ අනාගත ලංකා ප්‍රගතිය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. සභාව සතු රථවාහන අලුත්වැඩියාව, මිලදී ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. සභාව සතු ගොඩනැගිලිවල අලුත්වැඩියාවන් හා නව ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. මහජනතාවට අවැසි වන සමාජ සංවර්ධන විවිධ ව්‍යාපෘති යෝජනා කිරීම හා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

vi. සමාජ සංවර්ධන කටයුතුවලදී සමාජ ප්‍රතිසාධනය, අඩු ආදායම්ලාභීන්, ආබාධිතයන් පිළිබඳව සැලකිලිමත් වී ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘති යෝජනා පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන සමඟ සමීපව සම්බන්ධ වෙමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පහසුව හා සුභසාධනය සඳහා අවශ්‍ය නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. බල ප්‍රදේශයේ කාන්තා හා ළමා සුභසාධන කටයුතු ප්‍රවර්ධනය හා ඒ පිළිබඳ වන ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභා අනුමැතියට යොමු කිරීම.

ix. විෂයට අදාළව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු දැක්වීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම

x. ව්‍යාපෘති, භෞතික සම්පත්, ගබඩා භාණ්ඩ, අබලි ද්‍රව්‍ය, රථවාහන, සහ ගොඩනැගිලි යන අංශයන්ට අදාළ සියලුම ආකාරයේ ඉදිකිරීම් ඇස්තමේන්තු කාර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කිරීමට නිර්දේශ කිරීම.

xi. ව්‍යාපෘති, භෞතික සම්පත්, ගබඩා භාණ්ඩ, අබලි ද්‍රව්‍ය, රථවාහන, සහ ගොඩනැගිලි සම්බන්ධ සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xii. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිලධාරීන්, විවිධ පාර්ශව මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබාගැනීම.

## ඵලදායීතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුව

i. මහා නගර සභාව සතු වත්කම්වල නාස්තිය හා දූෂණය අවම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. මහා නගර සභාවට බලය ලැබී ඇති කාර්යයන් හෝ කර්තව්‍යයන් ක්‍රියාවට නැංවීමේදී සිදුවිය හැකි වියදම් අවම කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. සභාවේ මාසික ඉන්ධන ප්‍රමාණය සම්බන්ධ වාර්තා පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

iv. සභාවේ සියලු අංශවල මුදල් උත්පාදනය හා පරිභරණය පිළිබඳ වාර්තා පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. සභාවේ ඵලදායීතාව ඉහළ නැංවීම පිළිබඳව මහා සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යයනය කර නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම.

vi. සභාවේ මුදල් උත්පාදනය පිළිබඳ මහා සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යයනය කර නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම.

vii. විෂයට අදාළව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කෙටුම්පත් සකස් කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. ඵලදායීතාවය ඇති කිරීම, මුදල් උත්පාදනය කිරීම හා පරිහරණය සම්බන්ධ සියලුම ආකාරයේ මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ix. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිළධාරීන්, විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබා ගැනීම.

<u>කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුව</u>

i. මහා නගර සභාව විසින් ඉටුකළ යුතු සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුලත් යෝජනා ඇතුලත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ii. සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වල / කර්මාන්තවල ප්‍රගතිය වරින් වර විමර්ශනය කිරීම සහ ඒ සඳහා කළයුතු අවශ්‍යය වෙනස්කම් හෝ සංශෝධන සහ අනුගමනය කළ යුතු අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. අවශ්‍ය අවස්ථාවකදී වාර්ෂික සංවර්ධන සැලැස්මට කළ යුතු වෙනස්කම් හෝ සංශෝධන පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් වල/ කර්මාන්තවල කාර්යයන් සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. මහා නගර සභාව සතු මාර්ග පිළිබඳව දත්ත පද්ධතිය කලින් කල සමාලෝචනය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. සභාව සතු මාර්ග, ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා අලුත්වැඩියා කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. වීදි හා මාර්ග සම්බන්ධව මහා නගර සභාව සතු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළයුතු ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

viii. වීදි මාර්ග නාම කිරීම, ස්මාරක ඉදිකිරීම හා ප්‍රසිද්ධ උද්‍යාන ආදිය නාම කිරීම පිළිබඳව පිළිවෙලින් මහා නගර සභා පනතේ 71 වන, 37 අ වන සහ 37 ආ වන වගන්ති යටතේ මහා සභාව විසින් ගනු ලැබිය යුතු තීරණයන් පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

ix. වීථි අවහිර කිරීම, වීථි ආදියට හානි පැමිණවීම, අයුතු අඳා ගැනීම, වීථිවල කට්ටුමුළුවලට බාධා වන ගස් සහ අනතුරුදායක ගස් හෝ අතු හෝ කඳන් හෝ ගෙඩි ඉවත් කිරීම පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

x. නාගරික බල ප්‍රදේශය තුළ නව වීථි මාර්ග ඇති කිරීම හෝ මාර්ග පුළුල් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xi. නාගරික බල ප්‍රදේශය තුළ වීථි රේඛා නියම කිරීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xii. වීථිවල කෙරෙන කරදර ආදිය පාලනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiii. කර්මාන්ත ඇස්තමේන්තු හා සියලුම ඉදිකිරීම් ඇස්තමේන්තු නිරීක්ෂණ හා නිර්දේශ සහිතව මහා සභා අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xiv. විශේෂ කාර්යයන් සඳහා වීථි ප්‍රයෝජනයට ගැනීම සහ නාගරික බල ප්‍රදේශයේ වීථිවල පවතින බාධක හා ප්‍රදර්ශන ඉවත් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xv. නාගරික බල ප්‍රදේශය තුළ පවත්නා අනවසර ඉදිකිරීම් පාලනය, නියාමානුකූල කිරීම හෝ ඉවත් කිරීම සහ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත මගින් මහා නගර සභාවට පැවරෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xvi. විෂයට අදාලව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xvii. කර්මාන්ත, මාර්ග, ජල සැපයුම්, ජලාපවාහනය සම්බන්ධව සියලුම ආකාරයේ මිලපා සැපයුම් පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xviii. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිලධාරීන්, විවිධ ආයතන, මහජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් සහාරම්භයක් ලබා ගැනීම.

<u>මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව</u>

i. මහා නගර සභා ආඥාපනතේ IV වන, IX වන, X වන, XI වන, XII වන සහ XIII වන කොටස් සම්බන්ධයෙන් මහා සභාව විසින් අවසාන වශයෙන් අනුමත කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම;

ii. වටිපනම්, සියලුම බදු හා ගාස්තු පැනවීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iii. අයකරගත නොහැකි ආදායම් කපා හැරීම පිළිබඳව අමාත්‍යතුමාගේ අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

iv. මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ මහා නගර සභාව විසින් සම්පාදනු ලබන අතුරු ව්‍යවස්ථාවල මුදල් පිළිබඳ කාර්යයන් හා සම්බන්ධව අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

v. මහා නගර සභාව සතු දේපල බදු දීම, කුලියට දීම, බැහැර කිරීම හෝ වෙනත් ආකාරයක ගනුදෙනු පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධ යෝජනා නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vi. මහා නගර සභාවට දේපල අත්පත් කර ගැනීම හා මිලදී ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

vii. මහා නගර සභාව විසින් කරනු ලබන වෙනත් මුදල් ගනුදෙනු කාර්යයන් පිළිබඳ තීරණ සඳහා අදාළ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම

viii. අනෙකුත් සියලු ස්ථාවර කමිටු මඟින් නිර්දේශ කොට ඉදිරිපත් කරනු ලබන මහා නගර සභාවේ ආදායම්, වියදම්, ගෙවීම්, පැහැරීම් අවසාන වශයෙන් නිර්දේශ කොට අනුමැතිය පිණිස මහා සභාවට ඉදිරිපත් කිරීම.

ix. විෂයට අදාලව මහා නගර සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

x. මහා නගර සභාවට අයත් සියලු ව්‍යවස්ථාපිත මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.

xi. ස්ථාවර කමිටුවට අදාළව සභිකයන්, නිලධාරීන්, විවිධ ආයතන, ජනතාව විසින් මහා නගර සභාව වෙත යොමු කරන යෝජනා, නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවෙන් ආරම්භයක් ලබා ගැනීම.

**ඉහත අංක 03(3) දරණ යෝජනාව මහා නගර සභා මන්ත්‍රී ඩබ්. රවීන්ද්‍ර රංජන ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

**03(3)I. ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.**

ගරු නගරාධිපති - ජේ. ටී. නියාන්ත ප්‍රනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, පහත නාම සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහා නගර සභා මන්ත්‍රී - ජේ.ඩබ්. සදුන් චාමර ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - අයි.පී. මහින්ද පල්ලිආරච්චි මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එච්.ජේ. හර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ශු. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - බී. දිනූෂී කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**03(3)II. මහජන උපයෝගිතා, සෞඛ්‍ය හා පුර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත්කිරීම.**

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් මහජන උපයෝගිතා, සෞඛ්‍ය හා පුර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - එම්.සී. නයෝමි චාන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
4. මහ නගර සභා මන්ත්‍රී - ජී.එච්. ශුරේෂ් ඉන්දික මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
6. මහ නගර සභා මන්ත්‍රී - කම්මියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

**03(3)III. ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.**

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
2. මහ නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම්ම ද සිල්වා මහත්මිය
3. මහ නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන මිලානම්ගනානගේ මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
6. මහ නගර සභා මන්ත්‍රී - බී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

**03(3)IV. පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.**

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - බී. යෝමේෂ ප්‍රියදර්ශන පමින්ඩිස් මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ඉපරාඩ් ප්‍රනාන්දු මහතා
6. මහ නගර සභා මන්ත්‍රී - එම්. නිලංකසිරි ප්‍රනාන්දු මහතා

**03(3) V.** ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.

ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට මන්ත්‍රීවරුන් පස්දෙනෙකු ඡන්දයකින් තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත කුමාරසිංහ ප්‍රනාන්දු මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - පී.එම්. ජෙහාන් දිලිප් තිසේරා මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - එස්. චමුදිත් හර්ෂමාල් ප්‍රනාන්දු මහතා

**03(3)VI.** ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.

ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - සී. සමිත් සුජීව මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මෆීනා බක්කර් මහත්මිය
5. මහ නගර සභා මන්ත්‍රී - ශ්‍රී. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**03(3) VII.** ඵලදායීතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම.

ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ඵලදායීතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් රොෂාන් කුමාර පෙරේරා මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - එම්. සියෝමි ඉන්දිකා කුරේ මහත්මිය
3. මහ නගර සභා මන්ත්‍රී - සී. සරෝජනී මැන්දිස් මහත්මිය
4. මහ නගර සභා මන්ත්‍රී - පී. දුලක්ෂිකා තිලක්ෂණී ප්‍රනාන්දු මෙනෙවිය
5. මහ නගර සභා මන්ත්‍රී - එච්. ජේ. ප්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
6. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා

**03(3)VIII. කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කාරක සභාවට කාරක සභිකයින් පත් කිරීම.**

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ පිළිබඳ ස්ථාවර කාරක සභාවට පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - එච්.එල්. නිලිනි කොන්සර්ණ මෙණෙවිය
2. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. සී. ප්‍රබෝද්ධින් ගිම්හාන ක්‍රිස්ටල්කාන්ත මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - එල්. මිහඳු හර්ෂණ අබේකෝන් මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - එම්. සුජිත් සිල්රෝයි ප්‍රනාන්දු මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - එම්. ශර්මිලා විජේරත්න මහත්මිය
6. මහ නගර සභා මන්ත්‍රී - ජී.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

**03(3) IX. මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාවට කාරක සභිකයින් පත් කිරීම.**

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, මුදල් කාරක සභාවට සභාපති ලෙස නගරාධිපති නිල බලයෙන් පත්වන අතර මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාවට පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමියන්ත ද සිල්වා මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - එම්. දිලිප් මහේෂ් ප්‍රනාන්දු මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න ගෝනාවිතාරණ මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා

<u>මහා නගර සභා මන්ත්‍රී - ශෙරියන් දිලිනි ප්‍රනාන්දු මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, 03(3) යෝජනාවේ ඇමුණුම 01 ඉදිරිපත් කරලා තියෙනවා. පසුගිය සභා වාරයේදී මහජන උපයෝගිතා, කාන්තා හා ළමා සංවර්ධන ස්ථාවර කාරක සභාව කියලා අපි ඒ කාරක සභාව නිර්වචනය කළා. කාන්තා කියන විෂය එකට ලබාදීලා තියෙනවා. නමුත් ඇමුණුම 01 හි සභාවේ කාර්ය පටිපාටින් දකර කාන්තාවන් සම්බන්ධයෙන්වත් කිසිදු කරුණක් සඳහන් වෙන්නේ නැහැ. මේ අවස්ථාවේ අපි ඉල්ලීමක් කරනවා මේ සභාවේ කාරක සභා වල තිබුණු බලතල හා කාර්යභාරය මේ ලේඛන වල එහෙමම තමයි අමුණලා තියෙන්නේ. එහි යම්කිසි සංශෝධනයක විය යුතුයි. කාන්තාවන් සම්බන්ධයෙන් කුමක්ද කරන්නේ කියලා. කාරක සභාවෙන් බලාපොරොත්තු වෙන්නේ කුමක්ද කියලා මේ විෂය පථයට ඇතුළත් විය යුතුයි. එහි සංශෝධනයක් කිරීමට ඔබතුමාට යෝජනා කරනා අතර කාරක සභාවේදී සාකච්ඡා කරලා හෝ මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. මිහඳු එච්. අබේකෝන් මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, මේ කාරක සභාවේ මාතෘකාවේ තියෙනවානේ මහජන උපයෝගිතා හා කාන්තා කියලා. අපි ඇමුණුම 01 ට කාන්තා කියන එක ඇතුළත් කරමු.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීවරුනි, අපි ස්ථාවර කාරක සභාවක් හරහා එය අරගෙන ස්ථාවර කාරක සභාව හරහා කරමු.

**අංක 03(03) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**04. 2025 වර්ෂය සඳහා මාසික සභා රැස්වීම්, විශේෂ සභා රැස්වීම් හා ස්ථාවර කාරක සභා රැස්වීම් සඳහා දින නියම කර ගැනීම.**

මොරටුව මහ නගර සභාව

2025 වර්ෂයේ ජූනි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ස්ථාවර කාරක සභා හා මාසික සභා රැස්වීම් පැවැත්වෙන දින හා වේලාවන්

| මාසය | මාසික සභා රැස්වීම | ඉඩම් හා නාගරික සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව - පෙ.ව.10.00<br>මහජන උපයෝගිතා, කාර්මික හා පුරා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව - ප.ව.1.30<br>ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව - ප.ව.2.30 | පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පිළිබඳ ස්ථාවර කමිටුව - පෙ.ව.10.00<br>ක්‍රීඩා කටයුතු හා තරුණ විෂයන් කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව - ප.ව.1.30<br>ව්‍යාපාර හා ආදායම් සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුව - ප.ව.3.00 | ඵලදායිතාවය හා මුදල් උපායෝගිතා පිළිබඳ ස්ථාවර කමිටුව - පෙ.ව.10.00<br>කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුව - ප.ව.1.30 | මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව ප.ව.1.30 |
|---|---|---|---|---|---|
| ජූනි | 24 | 26 | 27 | 30 | (ජූලි 01) |
| ජූලි | 15 | 18 | 22 | 23 | 24 |
| අගෝස්තු | 12 | 19 | 20 | 21 | 22 |
| සැප්තැම්බර් | 09 | 16 | 17 | 18 | 19 |
| ඔක්තෝබර් | 07 | 14 | 15 | 16 | 17 |
| නොවැම්බර් | 04 | 11 | 12 | 13 | 14 |
| දෙසැම්බර් | 02 | 09 | 10 | 12 | 16 |

අයවැය - දෙසැම්බර් 11

ජේ.[illegible] ප්‍රනාන්දු
නගරාධිපති
මොරටුව මහ නගර සභාව

සටහන:- සෑම මාසයකම ඉහත දිනයන්හි මහා සභා රැස්වීම පෙ.ව.9.30 ට ද සියළුම ස්ථාවර කමිටු ඉහත සඳහන් දිනයන් හා වේලාවන්හිදී පැවැත්වේ. එකී දිනයන් හා වේලාවන් වෙනස් කිරීමට සිදු වුව හොත් ගරු මන්ත්‍රීවරුන්ට ඉහත කල්තියාම අනුව එම දිනයන්හි කමිටු රැස්වීම්වලට සහභාගීවීම අනිවාර්ය වේ. එම කමිටුවලින් වෙන් ලිඛිතව කැඳවීම් ලිපි සහිත දැනුම්දීමක් සිදුකරනු ලබන අතර, වෙනස්වීමක් සිදුවුවහොත් පමණක් නිලධාරීන් දැනුවත් කරනු ඇත.

මාසික සභා වාර්තාව - 2025.06.24

## 05. නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඇතුළුව මහා නගර සභා මන්ත්‍රීවරුන් සභාව ඇමතීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

අභිනවයෙන් තේරීපත්වුණු නගරාධිපති නිශාන්ත ප්‍රදීපානන්ද මහතාණෙනි,උප නගරාධිපති ප්‍රභාෂිණී වික්‍රමසිංහ මැතිනිය,සභාව නියෝජනය කරන කණ්ඩායම් නායක තිලකසිරි ප්‍රනාන්දු,අනුරසිරි සිල්වා,සුජීත් පුෂ්පකුමාර,සුරේෂ් ඉන්දික,සජිත් දුමින්ද යන කණ්ඩායම් නායකවරුන් ප්‍රමුඛ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් ඇතුළු මගේ සමගිජනබලවේගය කණ්ඩායම වෙනුවෙන් සහ පෞද්ගලිකව මාගේ සුභාශිංසන එක්කර සිටිනවා.තමුන්නාන්සේලා ජේෂ්ඨ අත්දැකීම් තියන මන්ත්‍රීවරු ගණනක ඉන්නවා.එවගේම ප්‍රථම වතාවට මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු ඉන්නවා.ඒ සියලු දෙනාටම තමන් බලාපොරොත්තු වන ආකාරයෙන් මොරටුවේ නමින් පත්කර එවපු ජනතාවට ඒඅය බලාපොරොත්තු වන සේවය නොපිරිහෙලා ඉෂ්ට කරන්නට ධෛර්ය ශක්තිය තමුන්නාන්සේලාට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.විශේෂයෙන්ම මෙය අවස්ථාවක් කරගන්නවා පසුගිය මැතිවරණයේදී සමගිජන බලවේගය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කරලා මන්ත්‍රීධුර මේ සභාව නියෝජනය කරන්නට අවකාශ ලබාදුන්න මොරටුවේ ජනතාවට මෙවන ගෞරවනීය ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි,ඔබතුමන්ලාට විශේෂ ජනවරමක් ලැබී තිබෙනවා.විධායක ජනාධිපතිවරයෙක් පත්වෙලා තියනවා.තුනෙන් දෙකේ බලය ඇත්මවා ගිය පාර්ලිමේන්තුවක් ඔබතුමන්ලාට ලැබිලා තියෙනවා.මොරටුව මහා නගර සභාවේ බලයත් ඒ ආකාරයෙන්ම ලැබිලා තියෙනවා.මේ සභාව තුළින් විපක්ෂයේ අපෙන් ඉල්ලා සිටි පරිදි විපක්ෂයේ සහයෝගය තමුන්නාන්සේලාට ලබාදෙන්න කටයුතු කරන මූලික පියවර වශයෙන් අපි තීරණය කරා තමුන්නාන්සේලාගේ සභාපතිත්වයෙන් පත්වෙන මේ සභාව නියෝජනය කරන කමිටු නාමයෝජනා තමුන්නාන්සේලාගේ සභාපතිත්වයට ලබාල දෙන්න අපි අත උස්සලා එකතුවෙලා ලබාදෙනවා කියලා පොරොන්දු වුනා. ඒ ආකාරයෙන්ම ඒක කරනවා.තමුන්නාන්සේලාට බාධාවකින් තොරව අඛණ්ඩ සංවර්ධන කටයුතු කරගෙන යන්න අවකාශය අපෙන් ලබාදෙන්න පුලුවන් පිටුවහල ලබාදෙන්න කටයුතු කරනවා කියලා මතක් කරනවා.ඒ නිසා විශාල වගකීමක් අද ඉදලා තමුන්නාන්සේලාට පැවරෙනවා. විශේෂයෙන්ම මොරටුව ජනතාවට පසුගිය කාල පරාසය පුරාම අපි බලාපොරොත්තු වන සේවයක් ඉෂ්ට වුනේ නැහැ.කොළඹට කිට්ටුවෙන්ම තියෙන්න නගරයක් වන මොරටුව මහා නගර සභාවක් වුනත් අපි ඇත්තටම ලැජ්ජ වෙනවා මේ මහා නගර සභාවේ වර්තමානයේ මේ බලප්‍රදේශයේ තිබෙන දියුණුව සම්බන්ධයෙන්.ඈත එපිට ගම්මානවලට ගිහින් බලන විට මීට වඩා දියුණුවක් තියෙනවා ඒ ගම්මාන වල.මොරටුව බල ප්‍රදේශය තුළ සවියට වැසිකිලියක් නැති ජනතා තියෙනවා.එම නිසා මේ පද්ධති ඇති කරන්න, පොදු පහසුකම් ඇති කරන්න.සංවර්ධන කටයුතු තවත් ඉස්සරහට ගෙනියන්න තමුන්නාන්සේලාට ධෛර්යය, ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.තමුන්නාන්සේ අපෙන් ඉල්ලීමක් කරා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරන්න කියලා.මම සන්තෝෂ වෙනවා.තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා ප්‍රතිපාදන ලබාදීමේදී පටන් සංවර්ධන ක්‍රියාදාමයන් කරනකොට මහජන නියෝජිතයන්ට පෞද්ගලිකව උදව්කරන එක නොවෙයි මේ ජනතාව නියෝජනය කරන්නේ. මහජනතාව වෙනුවෙන් සේවයක් කරන්නයි ඇවිල්ලා තියෙන්නේ ඒ සේවාව කරනකොට සාධුවත් ප්‍රද්ධ කරන්න,සාරස් හදාගන්න වෙන්න පුලුවන් එවගේ දේවල්වලදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබාදෙන්න.මරණගෙයකදී පොඩියක් දාන්න,ලයිට් එකක් දාන්න වගේ ආයතන ප්‍රධානීන්ට උපදෙස් දෙන්න මන්ත්‍රීවරු කතා කරාම පක්ෂ භේදයකින් උදව් කරන්න පුලුවන් වාතාවරණයක් නිර්මාණය කරන්න.ස්වාධීනව කටයුතු කරන නගරාධිපතිවරයෙක් කියලා විශ්වාසයක් අප තුළ තියනවා.කාලයෙන් කාලයට ආණ්ඩු වෙනස් වෙනවා,දේශපාලන නායකත්වය වෙනස් වෙනවා.අපට අවශ්‍යයි නොවෙනස්වන සංවර්ධන සැලැස්මක් මොරටුව නගරය පුරා ක්‍රියාත්මක කරන්න.පසුගිය කාල පරාසය තුළ ඉරාන් වික්‍රමරත්න මැතිතුමා මොරටුවේ විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරු සමග එකතු වෙලා සැලැස්මක් හැදුවා.බිස්නැට්තුම් පොළ සකස්කරලා මගීන්ප්‍රවාහන පර්යන්තයක් ඇති කරන්න,මොරටුවේ කලාකරුවන් උදෙසා නව රඟහලක් ඇති කරන්න,මාර්ග නාඩින්තු පිටිමක් කරන්න සැලැස්ම තුළ තියනවා.ඒ සැලැස්මත් උපයෝගී කරගෙන

තමුන්නාන්සේලාගේ අදහසුත් එකතු කරගෙන පොහොසත්වන සැලැස්මක් හදලා එයට අධිකාලමක් දුන්නු කියලා යෝජනාව මම ඉදිරිපත් කරනවා.පසුගිය කාලයේ නගර සභාවෙන් ඉෂ්ට වෙන්න තියෙන දේවල් අපි මධ්‍යම රජයෙන් කරලා දුන්නා.ඉරාන් වික්‍රමරත්න,චම්පික රණවක මැතිතුමා ඉන්නකොට සජිත් ප්‍රේමදාස මහතා විශාල මුදලක් මොරටුවට ආයෝජනය කරන පාරවල් ගණනාවක් කාපට් කරලා හදලා දුන්නා.මධ්‍යම රජයෙන් මුදල් වෙන්කරලා රථගාල හදලා දුන්නත් අද වෙනකල් විවෘත කිරීමක් නැහැ.කටුබැද්ද වෙළඳපොළත් හදලා දුන්නේ මධ්‍යම රජයෙන්.තමුන්නාන්සේ කිව්වා වගේ අපි නගරය දියුණු කරන්න නගර සභාවට මුදල් නැහැ කියන එක අපි හැමෝම දන්න කාරණාවක්.තමුන්නාන්සේලාගේ නායකයා කිව්වා තමුන්නාන්සේලාගේ බලයක් තියෙන සභාවට විශාල වශයෙන් මුදල් ලබාදෙනවා කියලා. දැන් ඒක කරන්න අපිට තමුන්නාන්සේලාගේ උදව් ලබාගන්න ඕන අවස්ථාවක් තමයි.මධ්‍යම රජයෙන් උදව් ලබාගෙන මේ කර්තව්‍ය කරන්න කියලා ඉල්ලීමක් කරනවා.මොරටුවැල්ලෙන් පටන් ගත්තම එගොඩඋයනට යනකම් පාරේ අයිනේ අඩියක් තියලා යන්න බැහැ වතුර පිරිලා.දකුණු කලාපය නියෝජනය කරන මන්ත්‍රීවරු මෙයට විශේෂයෙන්ම අවධානය යොමු කරන්න.ආයතන සහ අමාත්‍යාංශ එකතු කරගෙන නිසි වැඩ පිළිවෙලක් දියත් කරන්න.තමුන්නාන්සේලා ගන්න නිවැරදි තීරණවලට අපි තමුන්නාන්සේලාගේ පිටිපස්සෙන් ඉන්නවා.මේ සභාවේ නිලධාරීන්ගේ ශක්තිය අරගෙන මේ නගරය දියුණු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.ඔබතුමන්ලා දිවුරුම්දීපු දවසේ ඇමතිතුමා කරපු කතා විලාසය අපි පිළිකුලෙන් යුතුව බැහැර කරනවා.මොරටුවේ විවිධ ක්ෂේත්‍රවල පුද්ගලයෝ ඉන්නවා.මොරටුව නියෝජනය කරන ඇමතිවරයා විදියට මොරටුවේ ජනතාවගේ ගෞරවය ආරක්ෂා කරන්න ඕනා.සාමාන්‍ය ජනතාවගේ ගෞරවය ආරක්ෂා කරන්න කියලා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කියලා අපි ඉල්ලනවා.ඔබතුමා සභාවේ ගන්න නිවැරදි තීරණවලදී විපක්ෂයක් විදියට අපිට දෙන්න පුළුවන් උපරිම සහයෝගය ඔබතුමාට ලබාදෙනවා.නිලධාරී මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත්,මෙහි පැමිණි සියලුම දෙනාටත් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - එම්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා,ගරු මන්ත්‍රීතුමනි,ගරු මන්ත්‍රීතුමියනි,කොමසාරිස්තුමියනි,ලේකම්තුමනි,අංශ ප්‍රධානී නිලධාරී මහත්ම මහත්මීයනි,සභාව නියෝජනය කරන සියලුම මහත්ම මහත්මීන්ගෙන් අවසරයි. ඒ වගේම අද මේ අවස්ථාව මාධ්‍යට ගෙනයන මාධ්‍යවේදී සියලුදෙනාගෙනුත්,මොරටුව නියෝජනය කරමින් පැමිණි අපේ ආදරණීය සහෝදර සහෝදරියන් සියලු දෙනාගෙන් අවසරයි. ගරු නගරාධිපතිතුමනි,මම හිතනවා අද දවස කියලා කියන්නේ අපිට විශේෂ දවසක්. ඒවගේම මගේ ජීවිතය විදියට ගත්තොත් මම හිතනවා අද දවස හරිම වාසනාවන්ත දවසක්.මට මතකයි 2018 වර්ෂයේ මම නවක මන්ත්‍රීවරියක් විදියට මේ සභාවට ඇවිල්ලා සභාව නියෝජනය කරලා කරපු කතාවේදී මම ප්‍රකාශ කරා අපේ ගමන උඩුගං බලා පිහිනීමක් කියලා.ඇත්තටම ඒක උඩුගංබලා පිහිනීමක්.ඒ ගමන අපිට හරිම සුමට,සුඛිත ගමනක් බවට පත්වුනේ නැහැ.කටුක ගමනක්.ඒ ගමනේදී අපිට මුහුණ දෙන්න සිද්ද වුණු විවිධ අවස්ථා අපි පසුකරා.විශේෂයෙන්ම බොහෝ දෙනෙකුගේ විවිධ කතා,විවිධ අවලාද,විවිධ අපහාස ඒවක් එක්ක තමයි අපි මේ දේශපාලන ගමන ඉස්සරහට ආවේ. මම දකිනවා බොහෝදෙනාගේ වෙච්ච විවිධ දේශපාලන නායකයො අපේ මන්ත්‍රී සහෝදරියො විදියට අද පත්වෙලා ඉන්න අපේ සහෝදරියන්ට මොරටුව ඇතුලෙ විවිධ කතා විවිධ අවලාද, විවිධ අපහාස විශාල වශයෙන් ප්‍රචාරය කරද්දී ඒ හැම එකකටම ශක්තියෙන් ධෛර්යයෙන් මුහුණ දෙමින් අද මේ ගමන මේ විදියට මෙතනට ඇවිල්ල තියෙන්නේ.අපි ආපු ගමනේදී අපේ ආදරණීය පක්ෂය අපිට ලබාදුන් අප්‍රමිත ශක්තිය,අප්‍රමිත ධෛර්යය,අප්‍රමිත සහයෝගය අපිව මේ තැනට ගේන්න අපිට මග පෙන්නුවා කියලා මම විශ්වාස කරනවා.ඒවගේම පක්ෂයට ස්තූතිවන්ත වෙනවා. තවත් දුරට අපිට රැගෙන එන්න ශක්තිය ධෛර්යය සැපයීම සම්බන්ධයෙන්.ඒ වගේම තමයි මේ ගමන එනකොට අපි වැටිච්ච අවස්ථා තිබුනා,අපිව බිඳෙන අවස්ථා තිබුනා ඒ හැම තැනකදීම අපිට ශක්තිය දුන්න අපේ ආදරණීය සහෝදරත්වයට අපි ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම තමයි අපේ විධායක කණ්ඩායමක් අපේ පක්ෂය නියෝජනය කරනවා.විධායක කණ්ඩායමේ ඇතුලෙ අපි කිසි කෙනෙකුට කිසිම පෞද්ගලික බලාපොරොත්තුවක්,පෞද්ගලික ලාභ අපේක්ෂාවක් කිසිදු පෞද්ගලික අරමුණකින් අපි මෙතනට ඇවිල්ලා නැහැ.අපිට තියෙන එකම අරමුණයි. ඒ තමයි අවුරුදු ගණනාවක් දැක්ක,සිහින ගණනාවක් දැක්ක සිහිනය සැබෑකර ගැනීම තමයි අපේ එකම අරමුණ බවට පත්වෙලා තියෙන්නේ.ඒ අරමුණේදී

මොරටුව මහත් ප්‍රජාවට ලස්සන පහසුකමක් මොරටුවක්,ලස්සන ජීවිතයක් ලබා දෙන එක තමයි අපේ ජාතික ජනබල වේගය විදියට මේ සභාව නියෝජනය කරන අප සියලුම දෙනාගෙ අරමුණ බවට පත්වෙලා තියෙන්නේ.ඒ අරමුණේදී අපි කණ්ඩායමක් විදියට මේ කටයුත්ත ඉස්සරහට අරගෙන යන්න අපේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් මහන්සි වෙනවා,කැප වෙනවා ඒ වෙනුවෙන් අපි බැඳී සිටිනවා.ඒ වගේම මාව මේ තැනට පත්කළ මොරුපන කොට්ඨාශයේ මාගේ ආදරණීය සහෝදර සහෝදරියන්ට ස්තූති කරන්න මම මේක අවස්ථාවක් කරගන්නවා.මුළු මොරටුවේම අපි කොට්ඨාශ විසිහයක් ජයග්‍රහණය කළා.ඒ වෙනුවෙන් අපිත් එක්ක අත්වැල් බැඳගත්තු සමස්ත මොරටුව ප්‍රජාවට අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.ගරු නගරාධිපතිතුමනි, අපි දන්නවා අපේ ගමන අපිට තනියම යන්න බැහැ.ඒ ගමන යනකොට අපිට විපක්ෂයේ සහෝදරයන්ගේ සහයෝගය අවශ්‍ය වෙනවා.ඔබේ අරමුණත් අපේ අරමුණත් අදහස් එකයි අරමුණුත් නම් ඔබට හැකියාව තියේවී අපට සහයෝගය දෙන්න අපිත් එක්ක අත්වැල් බැඳගන්න.ඒ වගේම නිලධාරීන් මණ්ඩලයේ සියලුම මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලා සිටිනවා අපි හැමෝම එකතුවෙලා අපි අලුත් මොරටුවක් ස්ථාපනය කරමු.ඒ වෙනුවෙන් අපි අත්වැල් බැඳගමු.ඒ වෙනුවෙන් ඔබ හැමදෙනාගේම සහයෝගය ලැබේවා කියලා අපේක්ෂා කරනවා.අද දවසේ සියලුදෙනාට ස්තූති වන්ත වෙමින් මොරටුවේ සියලු ජනතාවට මගේ හදපිරි ප්‍රණාමය පුදකරමින් මගේ කථාව අවසන් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි,විපක්ෂ නායකතුමනි,සභාව නියෝජනය කරන මහජන නියෝජිත මන්ත්‍රීවරුනි,මන්ත්‍රීතුමියනි,නාගරික කොමසාරිස්තුමියනි,නාගරික ලේකම්තුමා ප්‍රධාන සියලුම නිලධාරී මහත්ම මහත්මීයනි,මේ මොහොතේදී අපගේ ගෞරවනීය ස්තූතිය ප්‍රථමයෙන්ම පුදකරනවා. මොරටුව ජනතාවට එමෙන්ම ඉදිබැද්ද ජනතාව ආදරයෙන් සිහිපත් කරනවා.මන්ත්‍රීධුරය ලබාගැනීම සඳහා ඡන්දය භාවිත කරන ලද මොහොතේ සිට ඡන්දය අවසාන කරන තෙක් යන ඉන්පසුවත් අපිත් එක්කම නිරන්තරයෙන්ම උරෙන් උර ගැටී අප සමග සිටි ජනතාව මේ මොහොතේ ආදරයෙන් සිහිපත් කරනවා.විශේෂයෙන්ම ඉදිබැද්ද ග්‍රාමීය නියෝජනය කරන ගෞරවනීය ගම්පොළ සුමනධජ නායක ස්වාමීන්වහන්සේ ප්‍රධාන ගරුතර මහ සංඝරත්නයට නමස්කාරපූර්වකව මේ මොහොතේ ගෞරවයෙන් සිහිපත් කරනවා.එවගේම කඩලාන මීකෑ ශේෂ්ඨ ගෞරවනීය නිවසුමිලස් හෙට්ටිආරච්චි පූජ්‍යපාදීන් වහන්සේලාටත්,ඉදිබැද්ද කන්‍යාරාමයේ ප්‍රධාන මට්ටුමිය ඇතුළු ගරු කන්‍යා සොහොයුරියන්ටත් මම මොහොතේ ආදරයෙන් සිහිපත් කරනවා.එමෙන්ම නාම යෝජනා ලබාගැනීමේ සිට මැතිවරණය අවසානයේ මන්ත්‍රීධුරය ලබාගැනීමෙදී ලැයිස්තුවෙන් අපට නම කිරීමට විපක්ෂ නායක අජිත දමයන්ත ද සිල්වා මහතා ගත් උත්සාහය අපි මේ මොහොතේදී අගේ කරනවා පමණක් නොවෙයි නිරන්තරයෙන්ම එතුමා අපිත් සමග උරෙන් උර ගැටී කරන ලද ඒ දේශපාලන සංවාදය තුළ මේ මන්ත්‍රීධුරය ලබාගැනීමට අපිට හොඳ අවස්ථාවක් ලැබුණා.විශේෂයෙන්ම සමගි ජන බලවේගය නියෝජනය කරන එහි නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාටත්, මහලේකම්තුමන් ඇතුළු පක්ෂයේ ප්‍රධානීන්ට අපි මේ මොහොතේ සිහිපත් කරනවා.මොරටුව ආසනය තුළ මැතිවරණ කටයුතු මෙහෙයවන ලද මැතිවරණ කළමනාකරණ කමිටුවත් අපි සිහිපත් කරනවා.ඊට අමතරව අපිත් සමග මේ මැතිවරණයේදී තරග කර ඒ අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ උත්සාහයේ ප්‍රතිඵලය තමයි අපි.නගරාධිපතිතුමා සඳහන් කළ පරිදි නගර සභාව නියෝජනය කිරීමට 2002 වර්ෂයේ සිට මේ මොහොත දක්වාම අපට අවස්ථාව ලබාදුන්නේ විවිධ පක්ෂ මගින් යන මොරටුව ජනතාවයි.ඒ ජනතාව වෙනුවෙන් අපට ලබාදුන්නා සේවාව අපි ආදරයෙන් සිහිපත් කරන ගමන්ම ජනතාව වෙනුවෙන් ඒ සේවය ලබාදීමට නිරන්තරයෙන්ම අපි ඇපකැප වෙනවා.නගර සභාව තුළත් ඉන් පිටතත්.නගර සභාව කියන්නේ ජනතාවට උපදින් සිට මරණ දක්වාම සමීප සම්බන්ධතාවයක් තිබෙන තැනක්.ඒ සේවාව ලබාදීමට අපි හැමදාම ඇපකැපවී කටයුතු කරනවා මහජනන්,නියෝජ්‍ය නගරාධිපතිතුමියන් සහ නාගරික කොමසාරිස්තුමිය ප්‍රධාන නිලධාරීන්ගෙන් අපිට ලැබෙන සේවය අගය කරනවා පමණක් නොවෙයි.මම හිතන්නේ අප්‍රිය සංක්‍රාන්ති කාලයක් තිබුනා නගර සභාව විසුරුවා හැරීම තුළ ඒ කාල පරාසය තුළ මොරටුවේ නගර සභාවේ වගකීම නාගරික කොමසාරිස්තුමිය ප්‍රධාන නිලධාරීන් භාරගත්තා.ඒ අය සේවාව ලබාදුන්නාට අපි ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම අපිට නියෝජිතයන් ජනතාව වෙනුවෙන්ම සේවය කිරීමට.නගරාධිපතිතුමා කැමැත්තෙනම තියන්නේ තොරව, නාගරික මන්ත්‍රීවරු ප්‍රමුඛත්වයක් ලබාගෙන අපි වැඩකටයුතු කරමු

කියලා. අපි ඒක ඉතාමත්ම අගය කරනවා.ඒනිසාම විපක්ෂ නායක සේනක දමියන්ත ද සිල්වා ප්‍රමුඛ විපක්ෂයේ මන්ත්‍රීවරු ඔබතුමාට මේ නගර සභාවේ පාලන කාලය මේ මොහොතේදී ඉදිරියට ගෙනයන්න විශේෂයෙන්ම කමිටු තරඟ ඒ කමිටු පත්කිරීමේදී ඔබතුමා දන්නවා විවිධ ගැටලු වලට මුහුණ දෙන්න සිදුවෙනවා ඡන්දයකට අපිට ඕන මන්ත්‍රීවරුන්ව පත්කරගන්න වියානම්.නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරු සාමූහික තීරණයකට ඇවිල්ලා මේ මොහොතේදී ඔබතුමාට සහය ලබාදීලා තියෙනවා සභාවේ වැඩකටයුතු කරගන්නටත්,කමිටු වල වැඩකටයුතු කරගන්නටත්.ඔබතුමා නිරන්තරයේ නගර සභාවේ විපක්ෂයේ ඉඳගෙන ඒ හඬ සභාව තුළ ජනතාව වෙනුවෙන් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් නගරාධිපතිවරයා හැටියට මේ නගර සභාවේ සියලුම කාර්යයන් ඔබතුමා ඉතාමත් හොඳින් පරිශීලනය කරලා තියෙනවා.ඒ නිසා අපිට ඕන ජනතාවට සේවය කරන්නට.ඒ සේවාව ඉෂ්ට කරන්න ඔබතුමාගෙන් නියෝජ්‍ය නගරාධිපතිතුමියගෙන්, නාගරික කොමසාරිස්තුමිය හා නිලධාරීන්ගෙන් සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමින් මේ මොහොතේදී නැවතත් ඔබතුමාට සුබ පතමින් මම නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පුල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,උප නගරාධිපතිතුමිය,නාගරික කොමසාරිස්තුමිය,ලේකම්තුමා ඇතුලු නිලධාරීන් මණ්ඩලයේ සියලුම දෙනාගෙන් අවසරයි.මේ මොහොත තුළ අපි අද පාලක පක්ෂයක් විදියට විරුද්ධ පක්ෂයක් විදියට ප්‍රභේදයක් නැති සභාවක් තුළ මට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදීම ගැන නගරාධිපතිතුමාට ස්තුති වන්න වෙනවා.ඇත්තටම මේය නගර සභා පලාත් සභා තුළ සංකල්පයක් විදියට දේශපාලනයෙන් තොර ඒ ප්‍රදේශයේ ජනතාවගේ යහපත සඳහා හදාගත්ත සංවිධාන.මේවා සියලුම සාක්ෂා ඇත්ත වලින් සම්මත කරගත්තේ ජනතාවගේ යහපත කියන පොදු පරමාර්ථයට.පැරණි ග්‍රීක දේශපාලනයේ සිට ඍජු ප්‍රජාතන්ත්‍රවාදයේ ඉඳලා පසුකාලීනව දියුණු වෙච්ච නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය දක්වා මේ සියලුම ආකාරයේ නියෝජිත ක්‍රම මඟින් අපේක්ෂා කලේ පොදු ජනතාවගේ යහපත.අපි සම්මත ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක් හරහා මේක් කරන ක්‍රියාවලි මේ නගර සභාව එකී පොදු පරමාර්ථ ඉෂ්ට කරගැනීම සඳහා සෑම ආකාරයකින්ම ක්‍රියාත්මක වෙනු ඇතැයි මා අපේක්ෂා කරනවා.මා මේ මොහොත තුළ විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා අපට සහය දෙන විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් සියලු දෙනා අද එක මිටට එක පොකුරක් විදියට එක අරමුණකට යා හැකි වීම තුළ සේනක දමියන්ත මන්ත්‍රීතුමා විසින් අප අදහස් කල ආකාරයට අනාගතයේදී මේ සභාවේදී ප්‍රතිවිරුද්ධතා,පරස්පරතා,කාලය නාස්ති වන විවිධාකාර තර්ක විතර්ක අඩු කරලා අරමුණකී ධාර්මිකභාවය උදෙසා ක්‍රියාකරන්නට අපි හැමෝම එක්සිත්ව එක්සත්ව කටයුතු කරමුයි කියා යෝජනා කරමින් මාව මේ ස්ථානයට ගෙනඒමට ඉඩම මගේ මහාවිහාරයේ ජනතාව මට උදව් කරපු ඒවගේම මගේ පක්ෂය මාව යෝජනා කරලා මාව ආරක්ෂා කරලා මට උපදෙස් දීලා මාව මේ ස්ථානයට පත්කලා මේ මුළු නගරය ඉතිහාසයේ ඉඳලා අවුරුදු හතලිහක් තිස්සේ තුන උසිමිනම් ලබුනේ උගන්නලා ඒ සඳහා මා කල සේවයට ප්‍රතිඋපකාරයක් ලෙස අපගේ ජනතාව මාව තෝරාගත්තා කියලයි මම අපේක්ෂා කරන්නේ මේ ස්ථානයට පැමිණ ධාර්මිකරුවන්ට,මේය නැරඹීමට පැමිණි අපගේ සහෝදරයන්ට ස්තුති කරමින් අනාගතය තුළ මේ නිලධාරී මණ්ඩලය සාමූහිකව එකාවන්ව අනාගතයේදී ලංකාවේ ආදර්ශමත්වම මහ නගර සභාවට පත්කරගැනීමට ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.සමින්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පළමුවෙන්ම මා සුභාශිංසන ප්‍රදානය කරනවා සෑදවතින්ම ඔබතුමාට. 1997 සිට 2006 ඉඳලා වසර 27 ක් අපත් සමඟ ඔබතුමා සභාව නියෝජනය කරපු ඒවගේම මහජනතාව වෙනුවෙන් ඔබතුමාගේ කාලය කැප කරමින් මහන්සි වෙමින් කම්හල්ගෙනෝ වෙන්න ඕන කාර්යභාරය ඉටුකරපු කෙනෙක් වශයෙන් සභා වශයෙන්ම මම ඔබතුමා මාගේ සුභාශිංසන ප්‍රදානය කරනවා. ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා,පාර්ලිමේන්තුව දිහා බැලුවොත් පාර්ලිමේන්තුවේ වින්‍යාසක් විපක්ෂයක් ඇරුණාම පස්සේ ඔබතුමා පාර්ලිමේන්තුවේ සිටින්න ඕන කෙනෙක් විදියට මම දකිනවා ජාත්‍යන්තරයේ පක්ෂ තුළ ආව ගමන් මහත් වත්කම බැලුවම.අද ඔබතුමා නගරාධිපතිවරයා වශයෙන් පත්වෙලා විශාල දැනුම් සම්භාරයක් තියෙන කෙනෙක් වශයෙන් මම ඔබතුමාව දකිනවා.ඒවගේම

තේරීපත්වුණු අපගේ විපක්ෂ පක්ෂයේ මන්ත්‍රීවරු,මාලිමාවේ තේරීපත්වුණු අභිනව මන්ත්‍රීවරු,නියෝජ්‍ය නගරාධිපතිට මාගේ සුභාශිංසන පත්තරනවා.මම ප්‍රාර්ථනා කරනවා සියලුම දෙනාටම මහජනතාවගේ වැඩකොටස කරන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා.ඒවගේම මම සංතෝෂ වෙනවා මාගේ පාසල් මිතුරා සුසන්ත කුරේගේ මන්ත්‍රීතුමාට මම විශේෂයෙන්ම සුබ පතනවා.ඒවගේම මාගේ කොට්ඨාශයෙන් පොහොට්ටුවෙන් පත්වුණු තිළිණි දියසියටත් සුභාශිංසන පිරිනමනවා.මොරටුවැල්ල ජනතාව ඇතුලු සමස්ථ මොරටුව ජනතාවට මාගේ ගෞරවනීය ස්තූතිය පුදකරනවා.ඒවගේම මෙවරත් සර්වජන පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් කණ්ඩායමත් සමග කටයුතු කරමින් අපිට ලැබුණු මන්ත්‍රීධුර දෙකෙන් එකක් පළමු මන්ත්‍රීධුරය තීන්දුකරපු අපේ මන්ත්‍රී ආසන සංඛ්‍යාව කොට්ඨාශ දින්නේ නැත්නම් අපේ මන්ත්‍රීවරු අපි ලබාදෙන්නේ ගන්න ඡන්ද ප්‍රතිශතය අනුව තියලා ඒ අනුව පළමු ස්ථානයට මා පත්කිරීම වෙනුවෙන් සර්වජන පක්ෂයට ඡන්දය දුන්න හැමදෙනාටම මාගේ ගෞරවනීය ස්තූතිය පුදකරනවා.ඒවගේම මාත් සමග සභාව නියෝජනය කරන්න තේරී පත්වූ සුරේෂ ප්‍රේමකුමාර මන්ත්‍රීතුමාටත් මාගේ සුභාශිංසන පුදකරනවා.අපේ පක්ෂයේ නායක දිලිත් ජයවීර මැතිතුමා නව දේශපාලන දැක්මක් සහිතව මෙරට වැටී තිබෙන ආර්ථික තත්ත්වයෙන් ගොඩගන්නට අවශ්‍ය කරන දැනුම සහ අවබෝධය තිබෙන නායකයෙක් වශයෙන් අද සමස්ථ රට යම් මට්ටමකට පිළිඅරගෙන කටයුතු කරනවා.එතුමා අපිට දේශපාලනඥයෙක් වශයෙන් අපි බලාපොරොත්තු වෙනවා වැටී තිබෙන ආර්ථික තත්ත්වයෙන් ගොඩගන්නට එතුමා තුල ශක්තිමත් වැඩපිළිවෙලක් තිබෙනවා. ඔහු එයට නායකත්වය දෙමින් ඒ වගේම මේ මැතිවරණයෙන් අපිට කරපු කාර්යභාරය සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා.ඒවගේම නිතරම සෙවනැල්ලක් වාගේ අපිට ශක්තිය ලබාදෙන හිටපු වෛද්‍ය අමිතාභ විජිත ජයසුමන මහතාට ස්තූතිය පුදකර සිටිනවා.අපේ දහම් පාසලේ විහාරාධිපති කොළොන්ගල ඉන්ද්‍රවිමල ස්වාමීන්වහන්සේ ඇතුලු මා හිතවත් හැමදෙනාටම මාගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා.අපි හැමදෙනාම බලාපොරොත්තු වෙන්නේ මහජනතාවට සේවයක් කරන්නට ඔබතුමාගෙන් අපි හැමවෙලාවෙම දක්කා සභාව තුලට ඔබතුමා ඇවිල්ලා විපක්ෂය නියෝජනය කරන කාලේ හැමදාත්තෙනම් උත්සාහ කලේ මහජනතාව වෙනුවෙන්ම උදව් කරන්න.ඒවගේම අපේ විපක්ෂයෙන් වශයෙන් විපක්ෂ නායකතුමා,ශේඛර දවියන්ත මන්ත්‍රීතුමා,මැක්සි මන්ත්‍රීතුමා ඇතුලු අපේ කණ්ඩායම අපිත් ඒ සඳහා විශාල කැපකිරීමක් කරපු අය මෙතන නියෝජනය කරනවා.ඒවගේම අපේ කටයුතුත් අපි සභාව තුල ඉෂ්ඨ කරන්නට මහජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම කැපවීමෙන් අපි කටයුතු කරනවා.ඒවගේම ඔබතුමන්ලාගේ හොඳ වැඩවලට සඳහා අපි විපක්ෂයක් විදියට හිතන්නේ නැතුව අපේ සහයෝගයෙන්,අපේ දායකත්වය අපේ කැපකිරීම කරලා ඔබතුමාට ශක්තියක් දෙනවා.අපි පසුපසක් හිතන්නේ නැහැ. ආණ්ඩුපක්ෂයේ සියලු දෙනාටම සාධියක් වෙනවා.ඔබතුමාට මේ සභාව කරගෙනයාමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා කියමින් ප්‍රාර්ථනා කරමින්.මාලිමාවේ සියලුම මන්ත්‍රීවරුන්ටත්,විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ටත්,මන්ත්‍රීවරියන්ටත් ශක්තිය ධෛර්යය ලැබේවා කියමින් ප්‍රාර්ථනා කරමින්,කොමසාරිස්තුමිය ප්‍රධාන ලේකම්තුමා ඇතුලු සියලුම නිලධාරී මණ්ඩලයටත් ශක්තිය ධෛර්යය ලබාදෙමින්,ඒවගේම විපක්ෂයක් විදියට හිතන්නේ නැතුව අපේ කණ්ඩායමටත් ජනතාවට සේවය කරන්න ඔබතුමන්ලාගේ සහයෝගය ලබාදෙන්න කියලා ඉල්ලීම කරමින් සියලුදෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.නිලන්ත් විජේතුංග මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි,නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඇතුලු ජාතික ජනබල වේගය නියෝජනය කරන නාගරික මන්ත්‍රීන් ඇතුලු නාගරික කොමසාරිස්තුමිය,නාගරික ලේකම්තුමා,ආයතන ප්‍රධානීන් ඇතුළු සියලු දෙනාහටම අවසරයි. ඒවගේම මාධ්‍ය නිලධාරීන් ඇතුලු ප්‍රේක්ෂක සහෝදර සහෝදරියන්ගෙන් අවසරයි.මා මුලින්ම ජාතික ජනබලවේගයේ මහජන නියෝජිතයෙක් විදියට කටුබැද්ද දකුණ නියෝජනය කිරීමට ඡන්දය ලබාදුන් සියලු දෙනාට මාගේ ප්‍රණාමය පුදකර සිටිනවා.ඒවගේම ජාතික ජනබලවේගය දිනවන්න කටුබැද්ද දකුණු කොට්ඨාශය තුල හිටපු ඒ වෙනුවෙන් දහදිය ඇද්ද මහන්සි වෙච්ච සහෝදර සහෝදරියන්ට මේ අවස්ථාවේ මා ප්‍රණාමය පුද කර සිටිනවා.අපි ඇත්තටම අවුරුදු ගාණක් මහන්සි වෙච්ච කටුබැද්ද දකුණ සියලුම දෙනාටම මාගේ ප්‍රණාමය පුදකර සිටිනවා.අවුරුදු ගාණක් මහන්සි වුණු ජනතාවගේ අභිලාෂයන් ඉෂ්ට සිද්ධ කරන්න පෙරමුණුගත්තු සාමාජිකයන් හැටියට අද අපි පත්වෙලා තියනවා මොරටුව මහා නගර සභාව නියෝජනය කරමින් ජනතාවගේ අභිලාෂයන් ඔවුන් බලාපොරොත්තු වුණු පරමාර්ථයන් ඉෂ්ට සිද්ධ කරන්න අපි දන්නවා. අපි නවක

මන්ත්‍රීවරු හැටියට මෙතනට ඇවිල්ලා ඉන්නේ.අත්දැකීම් බහුල මහජන නියෝජිතයින් මේ සභාව නියෝජනය කරනවා, ඒවගේම අත්දැකීම් අඩු මහජන නියෝජිතයින් මේ සභාව නියෝජනය කරනවා.අපි බලාපොරොත්තු වෙන්නේ අවුරුදු ගණනක්තුල මහජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්නයි.මහජනතාව තුළ තිබුණ යහපාලනයක් සහිත නගර සභාවක්, අදූෂිත නගර සභාවක්. දැන් ඒ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරන්න අපි හැමෝම බැඳී ඉන්නවා.අපි විශ්වාස කරනවා.මොරටුව ජනතාවගේ බලාපොරොත්තු මල්ඵල ගන්වන්න අපි එකතු වෙමුයි කියලා.අපි මීට ඉස්සර දැකලා තිබුණෙ විවිධ ගැටුම්කාරී තියෙන නගර සභාවක්.මේ ආරම්භ වන ප්‍රථම නගර සභාව ඉඳලා අපි බලාපොරොත්තු වෙනවා මහජනතාවගේ අභිලාෂයන් ඉෂ්ට සිද්ධ කරන සහයෝගයෙන් ඒකරාශිව වැඩකරන මහජන නියෝජිතයින්ගේ කාර්ය ඒ විදියටම ඉෂ්ට කරන නගර සභාවක් තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.මම හිතනවා අපි කාගෙත් අරමුණ යහපාලනයක් සහිත නගර සභාවක් ලස්සන නගරයක් සහිත නගර සභාවක් තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.අනුගියදා පටන් ගත්ත නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආයතන ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් මොරටුව ලස්සන කරන ශ්‍රමදානයක්.ඒක ඉතා සාර්ථකව කෙරුණා. සාමූහිකත්වයෙන් වැඩ කිරීම,නැවත වරක් අපි බලාපොරොත්තු වන ගමන යන්න මොරටුව පුනරුදයක් කර ගෙනයන්න අපි සියලු දෙනාටම ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එල්.මිසක අබේසේකර මහතා</u>**

අභිනවයෙන් මොරටුව මහා නගර සභාවේ ගරු නගරාධිපති වශයෙන් තේරී පත්වුණු ජේ.ඩී.නියාන්ත ප්‍රදීපාන්ද නගරාධිපතිතුමනි,ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමිය, නාගරික කොමසාරිස්තුමිය, ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි.විපක්ෂනායකතුමනි, 2006, 2011, 2018 මහා නගර සභා ඡන්ද වලදී පත්වෙලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් බවට පත්වෙලා ඉඳලා ප්‍රථම වතාවට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්ගේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා මා හට මෙම ස්ථානයට එන්ට සැලැස්වූ මොරටුවැල්ල උතුර ජනතාවට හා උස්වත්ත ජනතාවට මාගේ හද පිරි ප්‍රණාමය පුද කර සිටිනවා.ඒ වගේම පූජ්‍ය පල්ලේවෙල විමලධජ ස්වාමීන්වහන්සේට,මාගේ දෙමාපියන්ට,මාගේ බිරිඳ දූලානිටත්, මාගේ සහෝදර සහෝදරියන්ටත් මට නන් අයුරින් සහයෝගය දුන් අයට ස්තුතිවන්ත වෙන්න මම මේ අවස්ථාවක් කරගන්නවා.ඒවගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහින්ද රාජපක්ෂ මැතිතුමා,සංවිධායක නාමල් රාජපක්ෂ මැතිතුමා,මොරටුව ආසන සංවිධායක ජීවන් මහේෂ් ගමගේ මැතිතුමාටත් මගේ හදපිරි ස්තුතිය පුදකරනවා.නගරාධිපතිතුමනි,කොළඹවරම පුටුවෙ සිට පළවන පුටුවට ඔබතුමා අද ඇවිල්ලා ඉන්නවා.ඔබතුමාගේ පොඩ්ඩක් සද්වල් පාක්ෂිකත්වයේ ලාබාලම මන්ත්‍රීවරයා විදියට මම ඉගෙන ගත්තා.ඒවත් එක්ක තමයි අපි ඔබතුමාට සහයෝගය දීලා වැඩකටයුතු කරන්න වෙන්නේ, හැමතිස්සෙම මම හැමතිසියි වැඩකරන කෙනෙක්ට උදව් කරන්න.අපි කණ්ඩායම කතාකරගෙන තියෙන්නේ ඔබතුමාට සහයෝගය දෙන්න.ඔබතුමත් එක්ක සාකච්ඡා කරලා හැම වෙලාවේදීම ඔබතුමාට කෙරෙන්න තියෙන සියලු දෙයක් අනාගිරිනකලා ඉටු කරන්න අපි නැමැත්ත ප්‍රකාශ කරලා තියෙන්නේ.නගරාධිපතිතුමනි,සොයක් දිනකදී තිබුණා මොරටුවේ සංවර්ධන කමිටු රැස්වීම.එහිදී මොරටුවේ සංවර්ධන සැලැස්ම ගමකිය සාකච්ඡාවට ලක්වුනා.ඒ වෙලාවේදී අපිට දැඩිලෙසම බලපාන කාරණය තමයි මොරටුවේ බස් නැවතුම් පොළේ තිබෙන බස් ගාල් කිරීම.බස් ගාල් කිරීම සම්බන්ධව බස්හිමියන් දැඩිලෙස කනස්සල්ලට පත්වෙලා ඉන්නවා. සහ ප්‍රදේශවාසීන් වන අප දැඩි ලෙස අපහසුතාවයට ලක්වෙලා තියෙනවා මේ බස් ගාල් කිරීම සම්බන්ධව කිසිදු සැලැස්මක් නැහැ.මුත්‍රා කරනවා,කුණු දානවා,සිටින බස් නවත්තන්න ඉඩක් නැහැ,අපි යොදක් උත්සාහ කරා අපිට මෙය නිවැරදි කරන්න බැරිවුනා.ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා නගරාධිපතිතුමා හැටියට මෙයට ප්‍රධාන තැන දීලා මොරටුවේ බස් නැවතුම්පල ලස්සන තැනක් කරන්න.ඔබතුමාට හැකිවේවා කියලා ප්‍රාර්ථනා කරනවා.ඇත්තටම සන්තෝෂයි ඔබ වැනි කෙනෙක් පළවෙනි පුටුවට ඇවිල්ලා නගරාධිපතිධුරය හොබවන එක සම්බන්ධව.මොරටුව නගර සිටුවන්න ඔබතුමාට ධෛර්යය ශක්තිය ලැබේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමිය,නාගරික කොමසාරිස්තුමිය,නාගරික ලේකම් ඇතුළු නිලධාරීන් මණ්ඩලයෙන් අවසරයි.මම මුලින්ම සුබ පතනවා නගරාධිපතිතුමාට දුෂ්කර අවස්ථාවක සිට අවුරුදු විසිපහක් තමා දේශපාලනය කැප කරලා නගරාධිපතිධුරය දක්වා පැමිණීමට හැකිවීම ගැන.ඒවගේම මගේ කොට්ඨාශය වන එගොඩඋයන උතුර හා මධ්‍යම ජනතාවට මා මන්ත්‍රීවරයෙක් හැටියට තෝරාපත්කර ගැනීම ගැන මුලින්ම ස්තූතිවන්ත වෙන්නවා.මට ඡන්ද 1612 ක් ලබාදීලා වැඩි ඡන්ද 1013කුත් ලබාදීලා මන්ත්‍රීවරයෙක් හැටියට නගර සභාවට පත්කරගැනීම ගැන එගොඩඋයන උතුර මධ්‍යම ජනතාවට නැවතත් ස්තූතිවන්ත වෙනවා.ඒවගේම මට උදව් උපකාර කල එගොඩඋයන කොට්ඨාශ සභාවේ සාමාජික සාමාජිකාවන්ටත් ස්තූතිවන්ත වෙනවා.මට නානා අයුරින් උදව් උපකාර කල සියලු දෙනාටමත් ස්තූතිවන්ත වෙනවා. ඒවගේම මාගේ දෙමාපියන්ටත්,මට උගන්වපු ගුරුවරුන්ටත් සිහිපත් කරමින් මාගේ දේශපාලන ගුරුවරයා වූ ප්‍රමිත් පීරිස් මහත්මයත් මතක් කරමින් ඔහු අද ජීවතුන් අතර නැහැ,එය සිහිකිරීමත් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි,ජ්‍යෙෂ්ඨ මොරටුව මහා නගර සභා මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, අභිනවයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරුනි, නාගරික කොමසාරිස්තුමිය,නාගරික ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි.මාධ්‍යවේදීන් සියලු දෙනාගෙන් අවසරයි.මා පළමුවෙන්ම ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ටත් නියෝජ්‍ය නගරාධිපතිතුමියටත් හදවතින්ම සුබ පතනවා. නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට තේරීපත්වෙන්න අපට මෙම අවස්ථාව ලබාදුන්නු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකත්වයට මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට, පක්ෂ මහා ලේකම් සාගර කාරියවසම් මැතිතුමාට සහ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මැතිතුමාටත් නිරන්තරයෙන්ම මොරටුවේ අපිට නායකත්වය ලබාදෙන ආසන සංවිධායක මනෝජ් ගමගේ මැතිතුමන්ටත් පක්ෂයේ ක්‍රියාකාරී සියලුදෙනාටත් සුබ පතනවා.මොරටුව ආසනය තුළ මේ මැතිවරණ කාලයේදී ඔබතුමන්ලාට පුළුවන්කම ලැබිලා තියනවා කොට්ඨාශ වශයෙන් කොට්ඨාශ විසිහයක් ජයග්‍රහණය කරන්න.විපක්ෂයේ අපට කොට්ඨාශ තුනක් තමයි ජයග්‍රහණය කරන්න පුළුවන් වෙලා තියෙන්නේ.ඒ කොට්ඨාශ තුනෙන් එක් කොට්ඨාශයක මහජන නියෝජිතයෙක් හැටියට පත්වෙන්න ලැබීම මා ලැබූ ජයග්‍රහණයක් විදියට සලකනවා.වගේම මෙය අවස්ථාවක් කරගන්නවා ඉදිබැද්ද බටහිර ජීවත් වන ආදරණීය ජනතාවට ආදරණීය දෙමාපියන්,සහෝදර සහෝදරියන්ට,දූ දරුවන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරන්න.ඒවගේම තමයි 2006 ඉඳලා මේ දක්වා මොරටුව මහා නගර සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට ඡන්දයෙන් තෝරාපත් කරගන්න මට ශක්තිය ධෛර්ය ලබාදුන්නු නිරන්තරයෙන්ම මාත් එක්ක හැම කටයුත්තකටම හිටපු මාගේ ආදරණීය බිරිඳට,මාගේ ළමයින් තිදෙනාට මාගේ පවුලේ අයත් මාගේ බිරිඳගේ පවුලේ අයත් මේ අවස්ථාවේ අවංකව සිහිපත් කරනවා.

ගරු නගරාධිපතිතුමනි,ගරු නගරාධිපතිතුමාගේ පක්ෂය දේශපාලන ව්‍යාපාරය,කොට්ඨාශ විසිහයක් ජයග්‍රහණය කරනකොට අපි දැක්කා මේ මැතිවරණයට ඉදිරිපත් වුන හැම අපේක්ෂකයෙක්ම මොරටුවේ ජනතාවට විවිධ බලාපොරොත්තු දීලා තමුන්නාන්සේගේ ව්‍යාපාරයේ ඒ අපේක්ෂකයන් අනෙක් කොට්ඨාශවල නියෝජනය කරපු ඡන්දයට ඉදිරිපත් වෙච්ච සියලුදෙනා අපහාසයට උපහාසයට දෝෂාරෝපණයට ලක්කරලා තමයි තමුන්නාන්සේලා මේ ජයග්‍රහණය ලබන්නේ.අද තමුන්නාන්සේලා මේ වනකොට මොරටුවේ ජනතාවට විශාල බලාපොරොත්තු රාශියක් දීලා තියෙනවා.අපි බලාගෙන ඉන්නවා.ඔබතුමාගේ නායකත්වය යටතේ මේ කොට්ඨාශවල ඉන්න ජනතාවට ලබාදීපු අසීමිත බලාපොරොත්තු ඉටුකරනකන් අපි බලාගෙන ඉන්නවා. මා නියෝජනය කරන ඉදිබැද්ද බටහිර කොට්ඨාශය ඔබතුමාගේ මැතිවරණ ව්‍යාපාරයේ කරපු අය ගෙයින් ගෙට ගිහිල්ලා අපිව දෝෂාරෝපණයට ලක් කලා.මේ තුළ තිබෙන අඩුපාඩු රාශියක් පෙන්නුම් කරන්න ගත්තා අපි හොරුන් හැටියට පත්කලා. ඒ ගැන අපිට කිසි ගැටලුවක් නැහැ.නමුත් ඉදිබැද්ද ජනතාව අපිව තියන්න ඕන තැන තියලා මහජන ඡන්දයෙන් අපිව තෝරාපත් කරලා තෙවන වරටත් අපි

නියෝජනය කරනවා.මා කියන්න යන්නේ එහෙම එකක් නොවෙයි අද ඉදිබැද්ද බංගලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණය සංවර්ධනය කරන්න අපි විශාල උත්සාහයක් ගත්තා. අපේ පාලන කාලය අවසන්වෙන කොටත් මේ ක්‍රීඩාංගණයේ තිබෙන කාණු පද්ධතිය සංවර්ධන කිරීමට අපි මුදල් ප්‍රතිපාදන වෙන්කලා.වෙන්කලාට නිලධාරීන්ගෙ පැත්තෙන වෙච්ච අඩුපාඩුවක් නිසා අපිට එය සංවර්ධනය කරන්න ලැබුණේ නැහැ.නමුත් අපි විශ්වාස කරනවා ඉදිබැද්ද ක්‍රීඩාංගණය ඉතාමත් කඩිනමින් සංවර්ධනය කරන්න ඕන ව්‍යාපෘතියක් හැටියට.අපි මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉදිබැද්ද ප්‍රදේශයට තිබෙන දැවැන්ත ප්‍රශ්නයක් හැටියට මේ ක්‍රීඩාංගණය පත්වෙලා තියෙනවා. ක්‍රීඩාකරන්න එන ක්‍රීඩකයින්ට වැසි කාලයේදී ක්‍රීඩාකරන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියනවා. නමුත් අද ගරු නගරාධිපතිතුමා ඔබතුමන්ලාට අවස්ථාව ලබාදීලා තියනවා ඔබතුමන්ලාගේ කාරුණික අවධානය යොමු කරලා ඉතාමත් ඉක්මණින් මෙම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු කරයි කියලා විශ්වාසය අපි තුලට වඩා ජනතාව තුල තියනවා. ඔබතුමන්ටත් ඔබතුමන්ලාගේ කණ්ඩායමටත් ඒක කරන්න මොරටුව ජනතාවට දීපු පොරොන්දු ඉටුකරන්න සියලුම ධෛර්යය ශක්තිය ලැබෙන්න ඕනා. ඒ වෙනුවෙන් විපක්ෂයක් හැටියට පොදුවේ විපක්ෂ කණ්ඩායමක් හැටියට දෙන්න පුලුවන් උපරිම සහයෝගය අපි කිසිදු අවලාවක දෙන්න පැකිලෙන්නේ නැහැ. මොකද අපි මෙතනට ඇවිල්ලා තියෙන්නේ ජනතාවට සේවය කරන්න.ගරු නගරාධිපතිතුමන්ලා ඡන්දය අරන් තියෙන්නෙත් මහජනතාවට සේවය කරන්න. ඒ නිසා අපි තමුන්නාන්සේලාත් එක්ක එකතුවෙනවා කියන එක පොරොන්දුවක් දෙමින් කාල වේලාව සීමිත නිසා වැඩි වෙලාවක් ගන්නේ නැතුව නැවත වාරයක් ඔබතුමන්ලාගේ පාලනයට සුබ පතමින් අදට වඩා හෙට මොරටුවේ ජනතාවට සේවය කරන්නට තමුන්නාන්සේලාට ශක්තිය ධෛර්යය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.ජේ.සුරංගන් පිලිප්පියන් ප්‍රනාන්දු මහතා</u>

මොරටුව මහා නගර සභාවේ නගරාධිපති සේ.ඩී.නිශාන්ත ප්‍රනාන්දු සහෝදරයාට ඉදිරි වසර හතර මෙම සභාව මෙහෙයවල හොඳින් ඒ කාර්යභාරය ඉෂ්ට කරන්න හැකිවේවා කියා සුබ පතනවා.ඒ වගේම අපේ උප නගරාධිපති,ප්‍රභාෂිණී වික්‍රමසිංහ සහෝදරියටත් සුබ පතනවා එතුමියගේ ඒ කාර්යභාරය අවුරුදු හතර තුල හොඳින් භාරගෙනයාමට හැකියාව ලැබේවා කියලා. මෙම නගර සභාවේ නාගරික කොමසාරිස් ඇතුලු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි,මෙතනට පැමිණි සියලුම අපේ නාගරික මන්ත්‍රී සහෝදරයන් සහෝදරියන්ගෙන්ද අවසරයි. සියලුදෙනාටම සුබ පතනවා මේ වසර හතර ඇතුලේ ඔබතුමන්ලාගේ සහයෝගය නගරාධිපතිතුමාට ලැබෙන්න කියලා.අපි මන්ත්‍රීවරුන් හැටියට පත්වෙලා ආවේ එකම අරමුණක් යටතේ වැඩ කරන්න.හොඳ නගර සභාවක් නිර්මාණය කරන්න. මම නියෝජනය කරන්නේ කඩලාන කොට්ඨාශය.මාගේ දේශපාලන වටපිටාව මගේ දෙමාපියන් එක්සත් ජාතික පක්ෂිකයො අපේ ගෙදර කාර්යාලයක්.මට කුඩා කාලයේදීම අදහසක් ඇතිවුනා වාමාංශික අදහස් දරණ සමාජයක් බිහිකරන්න.අද අපේ වැඩිහිටියෝ නැහැ.ඒ අය නිවනට සංතෝෂ වෙනවා මම නගර සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන එකට.මාව නගර සභාවට පත්කරලා එව්ව කඩලාන කොට්ඨාශයේ ජනතාවට මම ස්තූතිවන්ත වෙනවා.ඒවගේම කඩලාන දේවස්ථානයේ පාලක පියතුමාටත් නානා සොහොයුරියන්ටත් මම ස්තූති කරන අතරම,කඩලාන ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කරගෙන යාමට ඔබතුමාගේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - හර්ෂ චන්දන පිලානාවිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමා,නාගරික කොමසාරිස්තුමිය ඇතුලු නිලධාරීන් මණ්ඩලයෙන් අවසරයි.මොරටුව මහා නගර සභාවට අභිනවයෙන් තේරීපත්වූ ගරු නගරාධිපතිතුමාටත්,උප නගරාධිපතිතුමිය ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ටත් මාගේ සුභාශිංසනය පලකිරීම සඳහා මෙය අවස්ථාවක් කරගන්නවා.පසුගිය පළාත් පාලන මැතිවරණයේදී සමගිබලවේගයට ඡන්දය ප්‍රකාශ කරමින් සහාය දැක්වූ මොරටු ජනතාවට කෘතඥවෙමින් ප්‍රණාමය පුදකර සිටිනවා. මෙවන අවස්ථාවක් කරගන්නවා.මොරටුව නගර සභාව නියෝජනය කරමින් මන්ත්‍රීවරයෙක් විදියට කටයුතු කරන්න අවස්ථාව ලබාදුන් සමගිජන බලවේගය නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් අපගේ විපක්ෂ නායක මේනකා දිසානායක ද සිල්වා මහතාටත් මාගේ හෘදයාංගම ස්තූතිය මේ අවස්ථාවේ පල කරනවා.පසුගිය ඉතිහාසයකට උරුමකම් කියන මේ අභිමානවත් පුරවරයේ මේ මහා නගර සභාව තුලින් අපට ඉටුකිරීමට පැවරී ඇති වගකීම් සහ වගවීම

හඳුනාගනිමින් ඉන් මොරටුව ජනතාවට ඉටු කළ යුතු සේවය අවංක භාවයකින් හා විනිවිදභාවයකින් ඉටු කිරීම සඳහා අපි සැම දෙනා නියමිත එම වගකීම මූලික කරගත් කාර්යභාරයක් හැටියටයි මා දකින්නේ. එනිසා මේ මොරටුව පුරවරය කුසල,ලයාගම, ඥාන ආදායම් ඇති ජනසංස්කෘතියක් සහිත ජනාකීර්ණ නගරයක් හැටියට කාලීන සමාජ අවශ්‍යතාවලට ගැලපෙන සංවර්ධනයක් සඳහා ගමන් කිරීම සඳහා අවශ්‍ය කරන වැඩපිළිවෙළක් ඉලක්ක කරගත් වැඩපිළිවෙළකට ගමන් කිරීමේ අවශ්‍යතාවය මේ කාලීන අවශ්‍යතාවයක් හැටියට ගමන් කිරීමට ඉස්මතු වී තිබෙනවා.ඒ අවශ්‍යතාවයන් හඳුනාගෙන මේ පුරෝගාමී නගරය ආලෝකමත් කරන්න පුළුවන් ලෙස නගරයට සංවර්ධනයේ අරුණලු දකින්න පුළුවන් කෙටි දවසක් උදා කරන්නට හැකියාව හා අවස්ථාව මේ සභාවට උදාවේවායි ප්‍රාර්ථනා කරමින් ශක්තිය හා ධෛර්යය ඒවගේම කුසලතාවය අත්දැකීම සහ පරිණතභාවය ඇති මන්ත්‍රීවරු ගණනාවක් මහා නගර සභාව සඳහා තේරී පත් වී තිබෙනවා.එනිසා ගරු නගරාධිපති ඔබතුමා මේ සභාව වියත් විශිෂ්ටයන් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අද මේ සභාවේ මුල් පුටුව හොබවීමට අවස්ථාව උදාවෙලා තියෙනවා.මේ නගරය අලුත් තැනකට ගෙනයන්න පුළුවන් සියලුදෙනාගේ සහයෝගය ලබාගෙන මහා නගර සභාවේ මොරටුව පුරවැසියන්ට ඉටු විය යුතු  සමාජ සෞඛ්‍ය සේවාවන් කාර්යක්ෂමව විධිමත්ව ඉටු කිරීමට මේ සභාවට අවශ්‍ය ශක්තිය හා හැකියාව උදාවේවායි පතමින් මා නිහඬ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියනි,නාගරික කොමසාරිස්තුමිය,නාගරික ලේකම්තුමා ඇතුළු සියලුම මහා නගර සභාවේ නිලධාරීන්ගෙන් අවසරයි.එසේම සභාවට තේරී පත් වූ සියලුම සභිකයන්ගෙන්ද අවසරයි.මම නියෝජනය කරන්නේ කටුබැද්ද උතුර කොට්ඨාශයයි.මම කොට්ඨාශයෙන් ඡන්ද ලැබිලා මාව ජනතාව තෝරාපත් කර එවපු කටුබැද්ද උතුර කොට්ඨාශයේ ජනතාවට මම මේ වෙලාවේ මාගේ ප්‍රණාමය පුදකර සිටිනවා.මේ වෙලාවේ විශේෂයෙන් කිවයුතු කරුණක් හැටියට මම දකින්නේ මම දේශපාලනය අලුත් මගේ දේශපාලන ජීවිත අවුරුදු දෙකක් තුනක් වගේ කාලසීමාවක්. මම වෘත්තියෙන් නීතිඥවරියක්. මම ඉපදුනේ මොරටුවේ අධ්‍යාපන ලැබුවේ මොරටුවේ.එනිසා මොරටුවේ ජනතාවත් එක්ක ලොකු සම්බන්ධතාවයක් තියෙනවා. දේශපාලන වශයෙන් මාව ජනතාව ගෙනඒම සම්බන්ධව තමයි විශේෂයෙන් කියන්න තියෙන්නෙ.ජාතික ජනබල වේගය පක්ෂය නායකත්වයට මම විශේෂ ප්‍රණාමයක් පුදකරනවා.මම සමාජ සේවාවල අඛණ්ඩව යෙදිච්ච කෙනෙක්.මට නගරයේ පුද්ගලයන් එක්ක ලොකු සම්බන්ධතාවයක් තියෙනවා. ඒ සම්බන්ධතාවය හඳුනාගෙනම වෙන්න පුළුවන් අපේ පක්ෂයේ නගරාධිපතිතුමා ඇවිල්ලා මට ආරාධනා කරා කටුබැද්ද කොට්ඨාශය නියෝජනය කරන්න.ඒ වෙලාවේ මගේ ඉතාම කැමැත්තෙන් ඒක භාරගත්තෙ.මම හරිම කාර්යබහුල උනත් ඒක භාරගන්න එකට විශේෂ හේතුවක් තිබුනා.හේතුව තමයි ජාතික ජනබල වේගය පක්ෂයක් හැටියට දේශපාලන අතහැරුමේ ඉතාමත්ම අසීරු අභියෝගාත්මක කාර්යයක්.උද්ඝෝෂ බලය ගමින් කරන ගමනක් අපි යන්නේ රටේ විධායක ජනාධිපති ඇතුලු ජාතික ජනවිතම අපේ සහෝදරයො ඇතුලු නගරාධිපතිතුමාටත් ඉතාමත්ම අසීරු අභියෝගාත්මක කාර්යභාරයකට මුහුණ දෙන්න සිදුවෙනවා.ඒක අපිට තේරෙනවා.ඒ වෙලාවේ මම හිතුවා මට මොන ආකාරයෙන්ද ශක්තියක් වෙන්න එකතු වෙන්නෙ.එන්න ඒ වෙලාවේ කාරණාව මුලුවට අරගෙන තමයි එතුමා මට ඉල්ලීමක් කරපු ඒක පිළිගත්තෙ.මම සන්තෝෂ වෙනවා අපි අද නියමිත තැනක හිටගෙන සිටිනවා කියන එක.මට වැඩිපුර කථාකරන්න දෙයක් නැහැ.අපිට තියෙන්නේ නගරාධිපතිතුමා,නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඇතුලු අපේ ඒ අභිලාෂයන් ඉෂ්ට කිරීමට මට හරි සන්තෝෂයි අද දවසේ ජාතික ජනබල වේගය නොවන අනෙක් පක්ෂ වලින් සැහෙන සහයෝගාත්මක කථාවක් කෙරුණ සභිකයන්ගෙන්.මම හිතනවා ඒ සභිකයන්ගෙ සහයෝගයත් එක්ක සමගාමීව නගරාධිපතිතුමා හැටියට තිබෙන අභියෝගයන් ටිකක් ලිහිල්වෙන්න පුළුවන්. ඒ ගමන ඉස්සරහට යන්න කියලා ප්‍රාර්ථනා කරමින් සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - වී.එම්.සුරින් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, කමිටු බෙදීමේදී මහා නගර සභා ආඥා පනතේ 26.3 ට ඔබතුමාගේ අවධානය යොමු කරනවා.නගරාධිපතිවරයා හැර සෑම සභිකයෙකුම යටත් පිරිසෙයින් ස්ථාවර කමිටු එකකටවත් තෝරාපත්කරගනු ලබන අතර ස්ථාවර කමිටු එකකට වැඩි ගණනකට සභිකයින් වලට තෝරාපත්කරගනු ලැබීමට ඒ කිසිම සභිකයෙක් සුදුස්සෙක් නොවන්නේය.තවද ඒ කිසිම සභිකයෙක් ස්ථාවර කමිටු දෙකකට වැඩි ගණනකට තෝරාපත්කරගනු ලැබීමට කොසේවත් සුදුස්සෙක් නොවන්නේය.ගරු නගරාධිපතිතුමා මේකෙ කියන්නේ ඔබතුමා කමිටු නමයක් යෝජනා කරලා තියනවා අපිට.ඒ කමිටු නමයට අපේ මන්ත්‍රීවරු අටකට බෙදුවට පස්සේ ඉතුරු වෙනවනෙ මන්ත්‍රීවරු දෙන්නෙක්.එතකොට අටවරක් තමයි.දෙපැත්තට බෙදුවට පස්සේ.එතකොට ගරු නගරාධිපතිතුමා තුන තුන බෙදාගෙන ඉවරවුනාම අටවරක් තුන විසිහතරයි. එතකොට දෙදෙනෙක් ඉතුරු වෙනවා.ඒ දෙන්නා අනිවාර්යයෙන්ම මුදල් කමිටුවට දාන්න වෙනවා.එහෙම නැතුව එක කමිටුවකට දාන සභිකයෙක්ව ඊට උඩින් තියන තව කමිටුවකට දාන්න බැහැ.ඒක නීත්‍යානුකූල නැහැ.ඒක මහා නගර සභා ආඥා පනතේ පැහැදිලිවම 26.3 කියලා තියනවා.ආයෙත් එයාට යන්න පුළුවන් මුදල් කමිටුවට තමයි.කමිටු අටේ ඉන්න දෙන්නෙකුට පුළුවන් මුදල් කමිටුව නියෝජනය කරන්න .හැබැයි ඒ දෙන්නාට බැහැ වෙන කමිටුවක් නියෝජනය කරන්න.උදාහරණයක් විදියට ආයතන කමිටුව නියෝජනය කරන ඔට බැහැ සෞඛ්‍ය,කමිටුව,ක්‍රීඩා කමිටුව,කර්මාන්ත කමිටුව නියෝජනය කරන්න.එතකොට මෙතන පොඩි නීත්‍යානුකූල ප්‍රශ්නයක් තියනවා. ක්‍රීඩා කමිටුව සහ සෞඛ්‍ය කමිටුව රංගන ප්‍රනාන්දු මන්ත්‍රීතුමා නියෝජනය කරනවා.සෞඛ්‍ය කමිටුව සහ කාර්මාන්ත කමිටුව නියෝජනය කරනවා ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා.ඒක නීත්‍යානුකූලව කරන්න බැහැ.අර දෙන්නාට පුළුවන් මුදල් කමිටුව නියෝජනය කරන්න.ඒ සම්බන්ධයෙන් ඉතික නිවැරදි කිරීමක් කරගෙන යමු කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු නගරාධිපති - එස්.වී.නියාන්ත පුදීකාන්ත මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,අපි සභාව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන් අනිවාර්යයෙන් ස්ථාවර කාරක සභාව නියෝජනය කරන්න ඕනා.එවගේම සමහර මන්ත්‍රීවරුන් දෙපලකට පුළුවන් ස්ථාවර කමිටු දෙකක් නියෝජනය කරන්න.ඔබතුමන්ලා සමග සාකච්ඡා කරලා සම්මුතියකට ඇවිල්ලා ඔබතුමන්ලා දීපු සියල්ල ඒ විදියටම දාද්දී මුදල් කමිටුව ඇතුලෙ විතරක් මම ඉල්ලීමක් කරා.මේ බෙදීම වචන් නිවැරදියි.ඔබතුමා කියපු පිළිවෙල සභාවේ මීට පෙර නැදිවෙ පිළිවෙලක් නෙමෙයි.ඔබතුමන්ලා කියන එක හරි. නීත්‍යානුකූල පිළිවෙලක් තිබුනා.මීට පෙර ඒක සලකලා නෙමෙයි දිගටම කමිටු පවත්වාගෙන ගියේ.මම නියෝජනය කරපු කමිටු කීපයක් තුබුනා. ඒක නිසා මට ඒකෙ දැනෙන්නේ නැහැ ලොකු ගැටලුවක් තියනවා කියලා. ඔබතුමන්ලාගේ එක මන්ත්‍රීවරයෙක් මේ වෙනකොටත් සභාව නියෝජනය කරන්නෙ නැහැ.එතුමාටත් ඉඩක් තියලා තියෙන්නෙ.

**මහා නගර සභා මන්ත්‍රී - වී.එම්.සුරින් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා අපේ මිතුරෙක්.රංගන මන්ත්‍රීතුමා අපි ආදරය කරන මන්ත්‍රීවරයෙක්.ඒ දෙන්නා මේකෙ ඉන්නවට අපට එහෙම ගැටලුවක් නැහැ.හැබැයි ප්‍රශ්නෙ තියෙන්නේ ඔබතුමා නගරාධිපතිවරයා හිටියාට අද පළවෙනි දවසෙම ඔබතුමා මේ මහා නගර සභා ආඥා පනත උල්ලංඝනය කරනවා.ඔබතුමාට පුළුවන් ඒ මන්ත්‍රීවරු දෙපලව එකතින් අයින් කරලා මුදල් කමිටුවට දාන්න පුළුවන්.කිසි ගැටලුවක් නැහැ.මොකද අපේ තේරුණ.උගත් මන්ත්‍රීවරු දෙපලක් කිසි ගැටලුවක් නැහැ.

<u>ගරු නගරාධිපති - ජේ.ඩී.නිශාන්ත පද්මලාල් මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,මේකෙ නීතිමය ගැටලුවක් නොවන බව තමයි මගේ තීන්දුව.ඊ සම්බන්ධයෙන් ලතාවට වගකියන නාගරික ලේකම්තුමාට පැහැදිලි කිරීමක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>නාගරික ලේකම් - එම්.ජේ.ඩී.තුෂාරා මුණසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,කමිටුවලට සභිකයන් පත්කරගැනීමට අදාළ ගෙනෙන සීමා මහා නගර සභා ආඥා පනතේ 26 වගන්තියේ පැහැදිලි කරලා තියනවා.ඒකෙ සීමා දෙකක් තියනවා.පළමුවන සීමාව තමයි නාගරාධිපතිවරයෙක්ට ජන්දයෙන් කමිටුවකට පත්වෙන්න බැහැ. එතුමා නිලබලයෙන් මුදල් කමිටුවේ සභාපතිවරයා හැටියට පත්වෙනවා.ඔබතුමාව අයිනකරලා තමයි කමිටුවලට සභිකයෝ පත්කරන්න වෙන්නෙ.දෙවැනි සීමාව තමයි සෑම සභිකයෙක්ම එක් කමිටුවකට හෝ තේරීපත්වෙන තෙක් වෙනත් සභිකයෙකුට කමිටු දෙකකට තේරීපත්විය නොහැකියි කියන එක.එතකින් එහාට ඒ සීමාව කොයිකට පත්වෙලා කොයිකට පත්වෙන්න බැරිද කියලා එහෙම සීමාවක් නැහැ.එතකොට අපි දකින දීර්ඝකාලීන ප්‍රායෝගික භාවිතාවෙන් අපේ සභාවේ එහෙම ගැටලුවක් මතුවෙලා නැහැ. මන්ත්‍රීවරු විසිනමය ඉන්න කාලේ කමිටු හයයි තිබුනේ.එක් මන්ත්‍රීවරයෙකුට තේරී පත්විය හැක්කේ කවර කමිටුවලටද අනුපිළිවෙලක් හෝ එහෙම එකක් තියනවද කියන එක පනතේ නියම කිරීමක් නැහැ.නමුත් දක්වා ප්‍රායෝගිකව භාවිතා කරලා තියෙන ක්‍රමයක් ඒකයි. පියවුම් මන්ත්‍රීවරු අවම වශයෙන් එක කමිටුවකට හෝ නියෝජනය කළ යුතුයි.ඒක තමයි ඒකට අදාල අපි භාවිතා කරපු ක්‍රමවේදය.

<u>මහා නගර සභා මන්ත්‍රී - සී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා ලේකම්තුමියගේ උපදෙස අපි පිළිගන්නෙ නැහැ.ලේකම්තුමියගේ ප්‍රකාශය අපි ප්‍රතික්ෂේප කරනවා.මොකද ලේකම්තුමි නිලධාරියෙක් හැටියට කියනවා මේ වගන්තිය උල්ලංඝනය කරන්න කියලා. සමස්ත විපක්ෂය සටහන් කරගන්න, අපි ගෞරවයෙන් ඉල්ලීමක් කරා ගරු නගරාධිපතිතුමාගෙන් 26.3 වගන්තිය බලලා ක්‍රියාත්මක කරන්න කියලා.ඔබතුමා ඒකට අනුව කටයුතු කරන්නේ නැත්නම් අපි උසාවි ගියොත් ඔබතුමා පළමුවෙනි දවසේම බලය අතික්‍රමනය කරපු නගරාධිපතිවරයෙක් හැටියට පත්වෙනවා.අපිට අවශ්‍යතාවයක් නැහැ.අපි ඔබතුමත් එක්ක ගොඩාක් සුහදවම කටයුතු කරන්නෙ අපි මේක පෙන්නුවේ ඔබතුමා ඒක දකින්නේ නැතිව ඇති කියලා. අපි හැමෝම සර්ව සම්පූර්ණ මිනිස්සු නෙමෙයිනෙ මහා නගර සභා ආඥා පනත කටපාඩම් නැහැනෙ.ඒ නිසයි මේක පෙන්නුවෙ ඔබතුමා පිළිගන්නවද නැද්ද කියන එක ගරු මූලාසනයේ වැඩක් ඒක ඔබතුමාට භාරයි.

<u>ගරු නගරාධිපතිතුමා - ජේ.ඩී.නිශාන්ත පද්මලාල් මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,බොහොම ස්තූතියි, ඉපන්වාදීපු එක පිළිබඳව මම විශ්වාස කරනවා මේ නීතියේ කිසිම ලෙසකින්වත් කඩකිරීමක් සිද්ද වෙලා නැහැ කියන එක තමයි මගේ පිළිගැනීම ඒ අනුව ස්ථාවර කමිටු ඒ ආකාරයෙන් පවත්වාගෙන යනවා මේකෙන් කිසිම බාධාවක් නැහැ. අපේ සභාවක් ලෙස යන කටයුතු වලට අපි කවුරුත් පොදු එකඟතාවයකින් ඉන්නේ ඉතාම හොඳින් ඇහුම්කන්දීලා කටයුතු කරන්න සූදානම්.අපි මේ වෙලාවේ අදාළ පනත ඉතා හොඳින් කියවගත්තම මේකෙ ගැටලුවක් නොවන බව තමයි මගේ තහවුරුව.තවදුරටත් නොතේරෙන තැනක් තියනවානම් අපිට කමිටුවකදී සාකච්ඡා කරගන්න පුළුවන්.දැන් මේ වෙලාවේ සංශෝධනය කිරීමට මම එකඟ වෙන්නෙ නැහැ.මොකද මම තහවුරු කරගෙන තියෙන්නෙ මේ නීතිය ඇතුලේ සහ මට අවශ්‍ය උපදෙස් ගන්න තිබෙන්නෙ අදාල නිලධාරීන්ගෙන්.ඒගොල්ලො තමයි ඊට වගකියන්නෙ.ඊට මූලික වගකියන ලේකම්තුමියගෙ පැත්තෙන් පැහැදිලි කිරීමක් කරගෙන තියෙනවා. බියවෙන්න එපා ඔබතුමන්ලා දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීතුමන්ලා අත්දැකීම් ගොඩක් තියෙනවා.ඒ නිසා කිසි ලෙසක බියවෙන්න එපා.කාටවත් අයුක්ති සහගත අසාධාරණ නීතියක් කඩාගෙන යන එකක් වෙන්නෙ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුරේන් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අවුරුදු විසිහතරයක් වගේ දීර්ඝ කාලයක් මන්ත්‍රීධුරය දරලා ඔබතුමා මොරටුව මහා නගර සභාවේ හිටපු පෙරමුණ පෙළේ දේශපාලනඥයා හැටියට මෙහි නගරාධිපතිධුරයට පත්වීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම දේශපාලන පක්ෂ භේද වලින් තොරව අපි ඔබතුමාට සුබ පතනවා.හේතුව අනෙක් නගර සභාවල්දීත් විලක්ෂණ මොරටුව නගර සභාවේ අපිට සතුටු වෙන්න පුළුවන් කාරණයක් තියනවා අපේ කෙනෙක්ව නගරාධිපතිවරයා විදියට නම් කරලා පත්කරලා තියනවා. මම අපේ පක්ෂයක් කියලා දෙපැත්තේ කතා කරේ විපක්ෂයේ අපිත් එක්ක සහය වෙනුවෙන් කතා කරපු,අසාධාරණයට විරුද්ධව කතා කරපු කෙනෙක් අනීතික ක්‍රියාවලට එරෙහිව කතා කරපු කෙනෙක් නගරාධිපතිවීම සුභදායක දෙයක් හැටියට අපි දකිනවා. ඒනිසා අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමා නගරාධිපතිවරයා හැටියට තමා පාලන කාලයේ යම් කිසි වෙනස්වීම සිදුකරයි කියලා.හැබැයි නගරාධිපතිතුමනි,විශේෂයෙන් කියන්න ඕනා ඔබතුමාට උපදෙස් දෙන්න අපට හැකියාවක් සහ අපට අවශ්‍යතාවයකුත් නැහැ.ඔබතුමා අත්දැකීම් වලින් පරිපූර්ණ වූ මනුස්සයෙක්,දේශපාලඥයෙක්.ඒ නිසා ඔබතුමාගේ අත්දැකීම් එක්ක අපිට තර්ක කරන්න බැහැ.මොකද අපේ වයසෙත් භාගයෙන් තුනක් ඔබතුමා මන්ත්‍රීකම දරල තියනවා.ඒ තරම් ඔබතුමා මේ නගර සභාවේ හතරමුල්ල හොඳට දන්න කෙනෙක්.හැබැයි ඔබතුමා නගරාධිපති වුනාට පස්සේ අපි බලාපොරොත්තු වෙනවා ඒ පසුගිය කාලයේ නගරාධිපතිවරුන්ට සිදුවෙච්ච උපහාසාත්මක වලට නගරාධිපතිවරයා හැටියට ඔබතුමා මුහුණ නොදෙයි කියලා බලාපොරොත්තුව අපිට තියෙනවා.මොකද ඔත්තුව අත්දැකීම් වලින් සම්පූර්ණ වෙච්ච කෙනෙක් හැටියට.එසේ කියන්නේ ගරු නගරාධිපතිතුමනි,විශේෂයෙන්ම මා දකින දේ තමයි දේශපාලනඥයා කොච්චර පිරිසිදු පුද්ගලයෙක් වුනත් දේශපාලනඥයා තමාගේ හොඳ සාක්ෂියට එහා වැඩකටයුතු බොහොම පිරිසිදුව කරනවා කියලා තමන්ගේ හොඳ සාක්ෂියට පොරොන්දු වෙලා ආවත් අපි දකිනවා බොහෝ තැන්වල දේශපාලනඥයාව වෙනස් කරන්න අං බිලපු පිරිසක් ඉන්නවා. නිශාන්තත් අං ගිලලා ඉන්නෙ කියලා අපි දන්නවා. හැබැයි නිශාන්ත ප්‍රදීපාන්ද කියන චරිතය දැන් නගරාධිපතිවරයා, බර වැඩියි, මුළු මොරටුවේ ජනතාවගේ බර කන්දරාව නිශාන්ත ප්‍රදීපාන්දගෙ කරේ තියලා තියෙන්නේ. ඒනිසා ඔබතුමා වැඩිනරගෙන යනකොට ඔබතුමාට විවිධ උපදෙස් දෙන පිරිස් ඉන්නවා.ඔබතුමා නිලධාරීන්ගෙන් පරිස්සම් නොවුණොත් ඔබතුමාටත් වෙන්නෙ අනෙක් පිරිසට වෙච්ච දේම තමයි.කොච්චර ඉස්සරහට යන්න හැදුවත් ඔබතුමාට ඒ ගමන නිවැරදිව යන්න හැකියාවක් නැහැ.මොකද හේතුව අපි අත්දැකලා තියනවා.පොහොට්ටු ආණ්ඩුව තියන කොට පොහොට්ටුවේ පාට ඇඳගෙන පොහොට්ටුවට කඩේ ගිය නිලධාරීන් පොහොට්ටුව වෙනුවෙන්ම කැපවෙලා පොහොට්ටුවෙන් බිහිවෙලා හිටපු නිලධාරීන්, මාලිමා ආණ්ඩුව ආපු ගමන් සාටයේ පාට වෙනස්කරගෙන ඩයි එකේ පාට වෙනස්කරගෙන පස්සෙන් යනවා අපි දැක්කා. ඔබතුමාගේ සභ අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර ඇමතිතුමාගේ පස්සෙන් යනවා අපි දැක්කා.අපිට ප්‍රශ්නයක් නැහැ අපිට කාගෙ පස්සෙ ගියත් හැබැයි ගරු නගරාධිපතිතුමනි,ප්‍රශ්නෙ තියෙන්නේ පසුගිය අවුරුදු දෙකකට වඩා වැඩි කාල සීමාවක් තුල දේශපාලඥයන්ගෙන් තොරව මොරටුව මහා නගර සභාව පාලනය කරා. දේශපාලනඥයන්ගේ වාහනයක්වත් ඇතුලට දාන්න දුන්නේ නැහැ. තනිකර ඒකාධිපති පාලනයක් මෙතන ඇතුලෙ තිබ්බේ.හැබැයි නගරාධිපතිතුමනි, ඔබ විශ්වාස කරන නිලධාරීන්ව එරෙහිව අපි අල්ලස් කොමිසමට ගිහිල්ලා තියනවා. අල්ලස් කොමිසම සාක්ෂි පිටින් දීලා තියනවා මේ දූෂණය වංචාව කරපු නිලධාරීන් සම්බන්ධයෙන්. හැබැයි මොරටුවේ මිනිස්සුන්ගෙ අභාග්‍යයට අල්ලස් කොමිසමෙන් කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.මොරටුව මූලස්ථාන පොලීසියේ පැමිණිලි පිට පැමිණිලි දැම්මා මෙහි තියන වැරදි අඩුපාඩු පිළිබඳව මෙහි තියන දූෂණ සම්බන්ධව පැමිණිලි පිට පැමිණිලි දැම්මා.අද වෙනකම් එක පැමිණිල්ලක් විභාග කරේ නැහැ. දේශපාලන බලයෑම් දාලා මේ නගර සභාවෙන් කුණු ටික ඇදලා දාලා.නගර සභාවෙන් කරන්න ඕන ටික පොලිසියට දීලා පොලිසිය ඉන්න කරගෙන අඩුම තරමින් එක පැමිණිල්ලක් විභාග කරන්නේ නැති තැනට පත්වුනා. නගරාධිපතිතුමනි, අද වනවිට ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ යුනිෆෝම් එක. ප්‍රධාන මහජන පරීක්ෂක නගර සභාවෙන් දීමනාව ගන්නවනම් සභාවට යුනිෆෝම් එක අඳින්න බැරිද. මම උදාහරණයක් කිව්වේ ඒ නිසා මේ නිලධාරීන් ඔයාව අමාරුවේ දානව දානවමයි. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලනවා අත පුරවගෙන්න එපා. විශ්වාස කරන්න යන්න එපා.ඔබතුමා බණ කියන්න අපිට අවශ්‍යතාවයක් නැහැ. හැබැයි අපිට යම් කිසි අත්දැකීමක් හා වගකීමක් තියනවා කියන්න

පුදීනාන්ද කියලා කියන්නෙක් මේ මහජන්ඩලයෙන් මතුවෙච්ච නායකයෙක්. ඒනිසා මතුව දේශපාලනයේ කුහකකම් නැතුව අපිට කියන්න තියෙන දේ කියලා වැඩේ පටන් ගන්නකම් හොඳයි නිපුණ අපිට අදහස ආවා. ඒ නිසා පැහැදිලිවම කියනවා මහා නගර සභා මන්ත්‍රීවරුන් ළඟට ගිය ගමන් කොමසාරිස්වරිය හදාගන්න තමන්ගේ නිල නිවසක. ලක්ෂ ගණනක් නිල නිවාසයට වියදම් කලා අමුරිට පසක් ගන්නා.නියෝජ්‍ය නගරාධිපති කාර්යාලයේ තිබ්බ ලී බඩු ටික ගෙනිච්චා ඒවා ගෙනියලා සුඛෝපභෝගී මාලිගාවක් හදාගන්නා. හැදුවා ඒකරයි පාවිච්චි කළේ නැහැ.තමන්ගේ නිල රථයෙන් කුරුණෑගල ගෙදර යනවා.ඉස්සරහට ගව හව ගේව්ල් තියනවා. ඔක්කොම එකට කිව්වොම අගයක් නැහැ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි,මේ ඉන්නේ හොරකමින්,වංචාවෙන්,දූෂණයෙන් පිරිච්ච නිලධාරීන් ඇලුන්නියක් එක්ක තමයි ඔබතුමාට වැඩ කරන්න වෙලා තියෙන්නේ.ඒ නිසා අපි ඉතාමත්ම ගෞරවයෙන් ඔබතුමාට කියනවා.ඔබතුමා දන්නවා අපි හැමදාම මේකෙ තියන දූෂණ,වංචා වලට විරුද්ධ වුනා.ඒක නිසා කවුරු හරි නිලධාරියෙක් කිව්වොත් මමනම් පිරිසිදුයි කියලා මම එකින් එක කියන්නම් කරපු හොරකම් ටික.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි.පැහැදිලිවම අපි අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා.ඔබතුමාගේ පළමුවෙනි යෝජනාව හැදුවද දන්නෙත නැහැ. විධායක බලතල දෙන එක,ඔබතුමාව රවට්ටන්න බැහැ කියලා මම දන්නවා. නිලධාරීන් බලෙන්ගේ තමන්ගේ බලය වැඩිකරගෙන හැමදාම කරේ අපේ අහිංසක සේවකයන්ට පාරි එක දාන එක, අහිංසක සේවකයන්ව කලලා තමන්ගේ වැඩේ කරගන්න එක.මම අදත් කියනවා,අදත් මේකෙ ආපු යන්නෙ නැද්ද අදත් මේකෙ හෙට යන්නෙ නැද්ද ඔබතුමා පත්වුනාට පස්සෙත් තාමත් යනවා. අපි ගෞරවයෙන් ඉල්ලනවා මේ නිලධාරීන්ට වගකීම් පවරලා ඒ වගකීම හරියට වෙනවද කියලා ඔබතුමා පෞද්ගලිකව අධීක්ෂණය කරන්න. එහෙම නැත්නම් ඔබතුමා බලාපොරොත්තු වෙච්ච, ඔබතුමාලා ප්‍රාර්ථනා කරපු ලස්සන කොළඹක් හදන්න වෙන්නෙ නැහැ.අපි පැහැදිලිව කියනවා අපිට කුහකකමක්, වෛරයක්, ක්‍රෝධයක් නැහැ ඔබතුමාලාත් එක්ක ඔබතුමාලාට ජනතාව වැඩි ආසන සංඛ්‍යාවක් දීලා තියනවා. ප්‍රතිශතයක් ගත්තොත් ඔබතුමාලාට සියයට හතලිස් හයයි විපක්ෂයට සියයට පනස්හතරයි ඒනිසා ගරු නගරාධිපතිතුමනි,ප්‍රතිශතය ගත්තොත් විපක්ෂයට වැඩි බලතලය තියෙන්නෙත හැබැයි ආසන ටිකයක් ඔබතුමාලා දිනලා තියනවා.ඒ ගෞරවය අපිට තියනවා ඒ නිසා තමයි ව්‍යවස්ථාව අනුව ඔබතුමා නගරාධිපති වෙන්නෙත.ඒනිසා ගරු නගරාධිපතිතුමනි, අපිට විශ්වාසයි විශ්වාසයි හිටිය කියලා ඔබතුමාගේ තීරක ඡන්දය පාවිච්චි කර කර ඔබතුමාව අපහසුතාවයට පත්කරන්න අපිට අවශ්‍යතාවයක් නැහැ.නාමිදෙට අපි දෙපාරක් හිතන්නේ නැතුව අනිවාර්යයෙන්ම සහයෝගය දෙනවා.ඒකෙ තර්කයක් නැහැ.සැකයක් තියාගන්න එපා.ඔබතුමා කරන හිතාම හොඳකට අපිට කිව්වොත් අපි ඒ දේ කරනවා.අපිට සහයෝගය දෙන්න කියල කිව්වොත් අපි දෙපාරක් හිතන්නේ නැතුව අපේ කණ්ඩායම සූදානම් ඒ සහයෝගය ලබාදෙන්න.හැබැයි ඔබතුමා කරන පළමුවෙනි වරද පළමුවෙනි අවස්ථාවේදිම විවේචනය කරන්නත් ඒ වරදට විරුද්ධව කරන්න පුලුවන් උපරිම දේ කරන්නත් අපිට කොන්දක් තියනවා කියන එකත් පැහැදිලිවම කියන්න ඕනා.මේ නිලධාරීන්ට විරුද්ධව අවශ්‍ය කටයුතු ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වෙනවා.නිලධාරීන් කරපු හොරකම් වංචා ටික අපි දැක්කා අපි දන්නවා.ඒවායේ සාක්ෂි එකතුකරමින් ඉන්නවා. අපි දැන් කිව්වෙ නැති වුනාට අපි ඉස්සරහට කියන්නම්.ඒවාට විරුද්ධව අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙනවා.පොදු දේපල අවභාවිතාව දැවිලෙස මේ නගර සභාවේ සිදුවෙනවා. කාරුණිකව ඒ සම්බන්ධයෙන් හොයලා බලලා ඒවාට තීන තියලා.ඒවා නවත්තලා මේ කොළඹ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න.මිනිස්සු දකින්නෙ දේශපාලනඥයා තමයි හොරා, වංචාකාරයා, දූෂණකාරයා හැමදාම දේශපාලනඥයන්ට තමයි ඇඟිල්ල දික්වෙන්නෙ. ඔබතුමා අලුත් නිසා සමහ ඇඟිල්ල දික්වෙන්නෙ නැති වෙන්න පුලුවන්. හැබැයි මේක කරගෙන යනකොට යම් යම් අඩුපාඩුකම් වුනාට පස්සෙ ඔබතුමාටත් ඒ ඇඟිල්ල දික්වෙයි. හරියට බැලුවොත් දේශපාලනඥයන්ට වඩා දහසුගණයකින් නිලධාරීන් දූෂිතයි.නිලධාරීන්ගේ කටයුතු දූෂිතයි.මම ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමා දැන් පටන්අරන් තියෙන ප්‍රවේශය හොඳයි.අපි එය අගය කරනවා.අපි දැකපු නැති නිශාන්ත ප්‍රදීනාන්දව අපි දැන් දකින්නෙ.ඔබතුමා යන ප්‍රවේශය සාධනීයයි ඒනිසා අපි ඒකට උදව් කරනවා.ඒනිසා පරිස්සමින් යන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරමින් මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරයා හැටියට අපිට ආසන දෙකක් දිනාගැනීමට ඡන්දය පාවිච්චි කරපු කොළඹ ජනතාවටත්,අපිත් එක්ක ඉදිරිපත් වෙච්ච ඒ අපේක්ෂක කණ්ඩායමටත්,විශේෂයෙන් පොදුජන එක්සත් පෙරමුණේ මහ ලේකම් හිටපු අමාත්‍ය ලසන්ත අලහියවන්න මැතිතුමන්ට,ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති නිමල් සිරිපාල සිල්වා මැතිතුමන්,මහ ලේකම් දුමින්ද දිසානායක මැතිතුමන්,මහින්ද අමරවීර මැතිතුමන් ඇතුළු මේ සියලු දෙනාටමත්

විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික් නායක ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මැතිතුමන්ටත්,මොරටුව ජනතාවටත් ස්තූතිය පුදකරමින් මා නිහඬ වෙනවා.

<u>ගරු නගරාධිපති - එන්.ඩී.නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,මා ඉතාම නිහතමානීකමින් මේ සභාවෙන් ඉල්ලා සිටිනවා.එතුමන්ගේ ප්‍රකාශය ඇතුළේ යම් තැනක තියෙනවනම් එදා දැකපු නිශාන්ත ප්‍රනාන්දුව නොවෙයි අද දකින්නේ ඒ විශේෂම නමයි එදා දැකපු නිලධාරීන්ව නොවෙයි අපි දකින්නෙ, ඕනෑම කෙනෙකුට වෙනස් වෙන්න අයිතියක්. ඉඩක් තියෙනවා.එදා දැකපු සුජීත් ප්‍රශාන්තකුමාරව නොවෙයි මම අද දකින්නෙ.මේ ගමන මට යන්න වෙන්නෙ මේ හැමදෙනාම එක්ක.ඉතිහාසයේ එක එක කාල වකවානුවල මේ ආයතනයේ උපනගරාධිපතිතුමා,මන්ත්‍රීවරයෙක් විදියට ඔබතුමා හිටියා.ඒ කාල වකවානුවල මේ කටයුතු කරන හැමදේම සිද්ධ වුණා. ඒනිසා එවැනි ආකාරයෙන් මා ඇත්තටම නගරයාවුව පළ කරනවා නිලධාරීව ඇත්තටම අධිසාවුකාම ඇති දුර්වලතා ඇති මම අනාගත වෙනස්කමින් කියනවා.ඉතිහාසයේ සිද්ද වෙච්ච හැම භාරකාමක්ම,හැම වංචාවක්,හැම දූෂණවලට එරෙහිව යහපාලන ඉහළම ක්‍රියාමාර්ග ගන්නවා.මේ ආයතනයේ නැවත මහාරකාම සිද්ද වෙන්න බැහැ.වංචා දූෂණ වෙන්න බැහැ.අක්‍රමිකතා වෙන්න බැහැ.හැබැයි ඒවා බලය තාක් මොහොතේ සක්‍රීයෙන් වෙනුවෙන් නතර කරගත හැකි ඒවා නොවෙයි.ඒවා මෙතරම් වැඩිවීම පිළිබඳ ලෙස නගර අපේ දුටුවූ ඒවා.ඒවාට අදාළ යම් යම් ක්‍රියාමාර්ග දැනටමත් අරගෙන තියෙන්නේ.මන්ත් විටක තිබුණු තැන නමයි ක, මොර දීම නමුත් ඒවාට පිළිතුරු ලැබෙන්නේ නැති බව පස්සේ පත්‍රිකා ගත්තා.ප්‍රකාශයට පත්කරන්න හොඳයි. මාධ්‍ය වලට යන්න හොඳයි.නමුත් නැහැ.අපි මේ නිශ්චිත සංවාදයක් සාකච්ඡාවක් ඇතුළෙ වලක්වන්නෙ කොහොමද? හැම කෙනාටම ආත්මගෞරවයක් තියෙනවා.හැම කෙනාම කැමතියි තමන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරගෙන කටයුතු කරන්න.ඒ නිසා සැලකිලිමත් වෙමු.ජාතික ජනබලවේගයේ පාලනයේ ආරම්භයේදීම තිලකසිරි මන්ත්‍රීතුමාට ඇතිවෙච්ච අපහසුතාවයක් කළින් දැනුනා.ඒ වෙලාවේම සම්මත කරගන්න ප්‍රකාශයක් කරා.මම කියන්නේ අඩුපාඩු,වැරදි වෙයි.හැබැයි පහර දීලා මෙය වෙනස් කරගන්න බැරිවෙයි කියලා අදහස මට තියෙන්නේ.අපි පුළුවන් කාලයක් අනාගතයම නිහඬතාවයකින් විදියට හැමදෙනා එක්කම අනාදීන් මොරටුවේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ පැරණි නගර සභාව නෙවෙයි.ඔවුන් බලාපොරොත්තු වෙනවා වෙනසක්.ඒ වෙනසට යද්දි මට තිබෙන හොඳම අවිය,හොඳම සවිය ඔබ.ඔබතුමා ගොඩනගන ඒකාත්මය හරහා මට මේ ගමන යන්න පුළුවන්.එකට සිතා නොකරමින් අපි වුවමනා සමගිවෙලා අපි කවුරුත් ඒකාගතාවයකින් කටයුතු කරමු.මේ මංගල සභාව ඔබට හොඳින් දේවල් කියන්න ඇති.ඒවා කිව්වා කියලා විසඳෙන්නෙ නැහැ.ඒවා විසඳෙන සාක්ෂිය ව්‍යාපාර නම්බු, ඒවගේම පෞද්ගලිකව හමුවෙලා උපදෙස් ගන්නාම මම.එහෙම කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.එම්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, නාගරික කොමසාරිස්තුමියනි, නාගරික ලේකම්තුමනි,සභාවේ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගෙන් සහ නාගරික මන්ත්‍රීතුමියන්ගෙන් අවසරයි.විල්ලෝරාවත්ත නැගෙනහිර කොට්ඨාශය නියෝජනය කරමින් මොරටුව නගර සභාවට තේරීම් සම්බන්ධයෙන් මා විල්ලෝරාවත්ත නැගෙනහිර කොට්ඨාශයේ ජනතාවට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කර සිටිනවා.දස මසක් කුස දරාගෙන ලේ කිරි කර පොවා මා මෙලොවට බිහිකළාවූ මාගේ ආදරණීය මෑණියන් වන ජීවමානත්‍රිගේ යාමිලී දේවිකා ප්‍රනාන්දු මාගේ මව්තුමියට මා මේ මොහොතේ සිහිකරන අතර, ඇය මා වෙනුවෙන් කළාවූ සියලුම දේවල්වලට මගේ ස්තූතිය පුදකරනවා.එලෙසින්ම දිවා රෑ නොබලා වෙහෙසිලා මා වෙනුවෙන් මාහට නොඅඩුව සියලුම දේ ලබාදෙමින් මාහට නිසි අධ්‍යාපනයක් ලබාදීමට වෙහෙසුනු මාගේ දයාබර පියාණන් වන කුමරගේ වත්තගේ ආනන්දසිරි ප්‍රනාන්දු වන මාගේ ආදරණීය පියාණන්ට ස්තූතිය පුදකර සිටිනවා.මෙලොව දේපළ නැති වූ දිනයේ පටන් අප රැක බලාගනිමින් අපගෙනෙරහි තමන්ගේ දිවියම කැපකළාවූ අපට යෝධ ශක්තියක් වූ මාගේ ආදරණීය මහප්පා කුමරගේවත්තගේ ධර්මපාල කුලසිරි ප්‍රනාන්දු මහතුමන්ට මාගේ ස්තූතිය හා ප්‍රශංසාව පුද කරනවා.නවක මන්ත්‍රීවරයෙකු ලෙස මා හඳුනාගනිමින් මාහට දේශපාලන දැනුම සහ දැනුමුතුකම් අත්දැකීම් ලබාදුන්නා වූ මාගේ දේශපාලන දිවියේ ගුරුවරුන් වන

ඇලෙක්සිස් කුරේ සහෝදරයාටත් ගරු නිශාන්ත ප්‍රනාන්දු නගරාධිපතිතුමන්ටත් සිහියක් කරන අතර ඔවුනට මාගේ විශේෂ ස්තූතිය සහ ප්‍රණාමය පුදකර සිටිනවා.

ජාතික ජන බල වේගය ආණ්ඩුවක් යටතේ මේ මොරටුව කියන අනාගතවාදිය නගරය සුන්දර කිරීම සඳහා ජාතික ජනබලවේගය කෙරෙහි විශ්වාසය තැබූ ජාතික ජනබලවේගයේ ආන්තිකයන්ට සහෝදර සහෝදරවරුන්ට මම මේ අවස්ථාවේ දී ඔවුන්ගේ තිබූ දැඩි කැපවීම සහ උනන්දුව මතක් කර සිටිනවා.තමන්ගේ කාලය,ශ්‍රමය,ධනය කැපකරමින් සශ්‍රීක රටක් තනා ගැනීම සඳහා අපට ලබාදුන් ජයග්‍රහණය තුලින් අප බලාපොරොත්තු වූ නිවැරදි ගමන්මග සකස් ලබාදුන් ආශිර්වාදය අමිල මහඟුමක් කරමි.ජාතික ජනබලවේගයේ සහෝදර සහෝදරවරුනි,මාගේ ශීර්ෂ ප්‍රණාමය ඔබටයි.මොරටුව මහ නගර සභාවේ ලාබාලතම මන්ත්‍රීවරයෙක් වන කුමරගේවත්තගේ සඳුන් චාමර වන මා මේ සභාවේ සිටින්නාවූ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන්,මන්ත්‍රීවරියන්ගෙන් ඉල්ලා සිටින්නේ මාගේ ඉදිරි වැඩකටයුතුවලදී ඔබතුමන්ලාගේ ආශිර්වාදය සහ සහයෝගය ලබාදෙන ලෙසයි.ඔබතුමන්ලා මාගේ අඩුපාඩුවක් දුටු විට ඒවා පෙන්වා දෙන ලෙසත් මා ඒය නිහතමානීව භාරගන්නා බවටත් මේ සභා ගර්භය තුලදී ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.ලස්සන රටක් සශ්‍රීක දේශයක් තනාගැනීමට තරුණ පුද්ගලයන් වශයෙන් අපට අයිතියක් තියෙනවා. රටතුල පැවති දූෂිත පාලනයන් මේ රට මුදවාගෙන ජාතික ජනබලවේගය කෙරෙහි ජනතාව තැබූ විශ්වාසය ඉදිරියට ගෙනයාම සඳහා අපගේ කාලය,ධනය,ශ්‍රමය හැකි ආකාරයෙන් කැප කරනවා.ජනතාව තැබූ විශ්වාසය කෙරෙහි ඔබතුමාගේ කාර්යභාර්ය කරගෙනයාමට මා සෑම මොහොතකම මාගේ කාලය,ශ්‍රමය කැප කර දෙනවා.ආර්ථික වශයෙන්,සමාජීය වශයෙන් හා සංස්කෘතික වශයෙන් පිරිහුණු ශ්‍රී ලංකාව පුනරුද යුගයක් සඳහා ගමන් කරවීමට සිදු වූ පරපුරක් ලබාදීමට ලැබීම සම්බන්ධයෙන් මා තුල ඇත්තේ නිහතමානී ආඩම්බරයක්.සභාවේ සිටින මන්ත්‍රීවරුන් , මන්ත්‍රීවරියන්ට මාගේ ප්‍රණාමය පුදකර සිටින අතර ඉදිරි වැඩකටයුතු කරගෙනයාමේදී අපි සියලු දෙනා පක්ෂ,පාට භේද නොබලා අපේ නගරය දක්ෂ ක්‍රීඩකයන් දක්ෂ කලාකරුවන් බිහිවුණු පිරුණු මොරටු පුරවරය සුන්දර නගරයක් බවට පත්කරවීමටත් දූෂණයෙන් වංචාවෙන් තොරවූ නගර සභාවක් බවට පත්කරවීමට ඇපකැප වී කටයුතු කරමු.එසේ නම් ඔබ සැමට ස්තූතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී – සී.සචින් දමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ප්‍රථමයෙන්ම අභිනවයෙන් පත්වූ ඔබතුමාට වසර විසිගණනක් පත්දැකීම් එක්ක මේ පුටුවට අද දවසේ කාර්ය භාරය භාරගැනීම සම්බන්ධව ඔබතුමාට ප්‍රථමයෙන් සුභපැතුම් පුදකරනවා.එවගේම නියෝජ්‍ය නගරාධිපතිතුමියට,විපක්ෂනායකතුමන් ඇතුළු සියලුම පක්ෂවල නායක මන්ත්‍රීතුමන්ලා,ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා ඇතුළු නවක මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි.එවගේම කොමසාරිස්තුමිය,ලේකම්තුමා ඇතුළු නිලධාරීන් සියලුදෙනාගෙන් අවසරයි.ගැලරිය මනාලේ වැඩ සිටින අපගේ ආදරණීය හිතවතුනි.එවගේම මොරටුවේ නියමින ජන සම්පතට ගෞරවය ආදරණීය මාගේ හිතවතුනි,ඔබ සියලු දෙනාගෙන්ම අවසරයි.විශේෂයෙන්ම නගරාධිපතිතුමන් ඇතුළු සෑම දෙනාටම මගේ හෘදයාංගම සුභාශිංසන පුද කරන්න මෙවැනි අවස්ථාවක් බවට පත්කරගන්නවා.මෙවර ස්වාධීන මන්ත්‍රීවරයෙක් විදියට නගර සභාවට පාගයන් එන්නට එපිට එකතුවූපෙලා වැඩකරපු සියලුම මගේ කණ්ඩායමේ සියලුම අපේක්ෂකයන්ටත්,එක්දහස්පන්සිය විසිදෙකක් වන ඡන්දය ලබාදුන් සියලුම ඡන්ද දායකයන්ටත් මාගේ ප්‍රණාමය පුදකරන අතර,විශේෂයෙන් මේ සම්බන්ධව දායකත්වය ලබාදුන් අපේ දෙමාපියන් මාගේ බිරිඳ මේ සියලුම දෙනාටත් මගේ කෘතඥතාවය පිරිනමන්නත් අවස්ථාවක් බවට පත්කරගන්නවා.මේ කටයුත්ත කරගෙනයාමේදී අපහසුතාවලට ලක්වුනා.ඒ අපහසුතාම මගහරින්නට අපට උදව්කරපු හිතවතුන්ටත් මේ අවස්ථාවේ මගේ ස්තූතිය පුද කරනවා.ගරු නගරාධිපතිතුමනි,මෙවැනි හොඳ සභාවක් අපි ප්‍රාර්ථනා කරපු එවගේම ඔබට ඉදිරියට යන්නට අපි හැමදෙනාම ශක්තියක් ලබාදෙන සභාවක්.මොරටුවේ මිනිස්සු ගැන මට මතක් වෙනවා එක්තරා අවස්ථාවකදී අශෝකමෙත්තා ගුරුතුමා ලියපු කවි පන්තියක්

පුත මම ජාතික වස්තුවකි - දුව මම ජාතික වස්තුවකි
එක ගෙවතක් යට එක්සත් වනු මැන - ඒවල මහිමය ඔබ සුරකී
වට්ටුවක් විලසට සමගි වෙලා - පටු තැති පදනම් බිඳ දමලා
ලොව එකසේසත් කල මැන මහඳින - ගුණකම් ඉවුරු කොට නොපිරිහෙලා

ඒ ප්‍රශ්නම අප හිතනවා ගරු නාගරාධිපතිතුමනි, ඔබතුමන් ඉෂ්ට කරන්න මහන්සි වුනා.නිලධාරීන්ගෙන් අඩුපාඩු පෙන්වා දෙමින්,ඒවගේම සමාජයේ අඩුපාඩු පෙන්වාදෙමින්,පාලන තන්ත්‍රයේ අඩුපාඩු පෙන්වා දෙමින් කටයුතු කරා.ඒවගේම අපිටත් පුලුවන් කමක් ලැබුනා මේ කාලය තුල කවුරුත් බලාපොරොත්තු නොවුන නොවිච්ච විදියට අමාත්‍යාංශවල ආයතන ලාභ කරන මට්ටමට ගේන්න.ඒ මුදල් වලින් තමයි අපි මේ මොරටුව සංවර්ධනය කරන්න යන්නෙ.ඒ නිසා ගරු නාගරාධිපතිතුමනි, අපි අපේ කාලය තුල අපිට පුලුවන් වුනා, එක පැත්තකින් කෝටි හාරදහස් පන්සියයක් පාඩුවෙච්ච නාගරික සංවර්ධන අධිකාරියේ කෝටි හාරදහස් පන්සියයේ පාඩුව පියවලා බිලියන තිස්නමයක් ලාභ කරලා ඒක මුළු රටේ සංවර්ධනයට යොදන්න.ඒවගේම එදා ඒ ප්‍රතිඵල විදියට තමයි අපට මේ ඉදිරිපිට තියන පුරන්අප්පු පිළිරුවට ගෞරව කරන පුරන්අප්පු උද්‍යානය හා චතුරශ්‍රය ගේන්න පුලුවන්කමක් ලැබුනේ.පාඨලී චම්පික රණවක මැතිතුමාගේ දායකත්වය අපට ඒවගේම ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමා දායකත්වය ලැබුනා.

අනෙක් පැත්තෙන් අපිට පුලුවන් වුනා කටුබැද්ද ටෙල්ප්‍රයාය එදා ඩීජ් මුව කියන පොහොත් ගාමිණී ඩී මහත්තයා එහි පුරවශේෂණය කියනවා.එතුමාටත් ගෞරවයක් කරලා අපට පුලුවන් වුනා ඒ ගං වතුර පාලන කලාපය කරන ඒ ඓතිහාසික කටයුත්ත ඉෂ්ට කරන්න.නාගරික සංවර්ධන අධිකාරියේ අමතරව ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව අපි භාරගන්නකොට බිලියන එක්දහස් පනස්පහක් පාඩුයි.අපිට පුලුවන් වුනා දෙදහස් පන්සිය ගාණකමක් ලාභ කරලා ඒ මුදල් ගේන්න.ඒත් එක්කම කටුබැද්ද තිබුන වෙළඳපොළ කඩන් වැටෙන්න ඔන්න මෙන්න තිබුනයි අර බිලියන තිස්නමය ප්‍රතිඵලයක් විදියට තමයි ව්‍යාපෘතිය ලැබුනෙ. ඔබතුමා දන්නවා සැහැල්ලු දුම්රිය ජපානයේ ආධාර මත 0.01 පොලියට මේක කොහොමහරි මොරටුවේ ඇදලා කැළණිය දක්වා යන්නෙ කියලා.අනෙක් පැත්තෙන් මාකුඹුර මධ්‍යස්ථානය විදියට මොරටුව සංවර්ධනය කරන්න ඒ සැම එකටම අපිට මුදල් තිබ්බා.ඒ විතරක් නෙමෙයි දකුණු කලාපයේ අද තියනවා ප්‍රශ්නයක් අඩවිනම් කළමනාකරණයක් නැද්ද කළමනාකරණයක් මේක අපට ඇනලයිස් කරලා අපට පුලුවන්කමක් ලැබුනා හදනාගෙන ඒකට අවශ්‍ය කරන මේ කාණු පද්ධතිය යතාත් කරන්නත් අපි එයට අවශ්‍ය කරන සියලු සම්පාදන කටයුතු කරලා තිබුනා.ඊට පෙරත් සැලසුම් සකස් කරලා තිබුනා.ඒත් එක්කම ධීවර නිවාස සංකීර්ණය විනාශ වෙලා මිනිසුන්ට වැසිකිලි උතුරලා ගිහිල්ලා ප්‍රශ්නයක් තිබුන වෙලාවක අපිට පුලුවන් වුනා ඒක කතා කරලා අලුත් සභා අමාත්‍යාංශයෙන්.අමාත්‍යාංශයෙන් රජයෙනුත් මුදල් අරගෙන ඓතිහාසික විදියට කටයුත්ත කරන්න.ඒ නිසා අපේ කාර්යභාරය නිසාට ඉෂ්ට කරා කියලා අපි විශ්වාස කරනවා.ඒ වගේම අනාගතයේදීත් ඒ සඳහා අවශ්‍ය කරන කටයුතු වලට ඔබතුමාට අපි සහයෝගය දෙන්න බලාපොරොත්තු වෙනවා.විශේෂයෙන් අපිට මතකයි අපේ හිටපු නාගරාධිපතිතුමියගේ සහභාගීත්වයෙන් එකවරක් අපේ ගෞරවණීය පෝල්රාජ් මැතිතුමිය කසල කළමනාකරණය සම්බන්ධයෙන් යම් මතයක් ගෙනිච්චා.ඒ වෙලාවේදී මගේ මතය වුනේ සමන්ලාල් නාගරාධිපතිතුමා එතන ඉන්නකොට විපක්ෂයේ හිටියත් මගේ දායකත්වය ලබාදෙන්න ඕන කියලා.ඒ අනුව අපි යෝජනා කරා මේ කසල කළමනාකරණ මධ්‍යස්ථානය. ජපානයේ දූපත් හතරක් තියනවා. එක දූපතක තියනා නගරයක් ආදර්ශයට ගේන්න අපි යෝජනාව කරලා අද හොඳ ස්ථාවරයකට පත්වෙලා තියනවා.අද හොඳ ආදායම් උත්පාදනය කරන තත්ත්වයකට පත්වෙලා තියනවා.අද පුලුවන්කමක් ලැබුනා අපේ කොමසාරිස්තුමියට ඉන්දුනීසියාවේ පැවැත්වූ ඒ උත්සවයට ගිහිල්ලා ඒ කුසලතා සම්මානයක් ගන්න තැනට අපේ අදහස් ඉදිරිපත් කරන්න පුලුවන් කමින් ලැබුනා.

ගරු නාගරාධිපතිතුමනි, නාගරික ගරාජයේ අපේ වැඩ පිටට දුන්නෙත්.මම හිටපු කොමසාරිස්තුමාට කිව්වා මම ඵලදායිතා කළමනාකරණය ඉගෙනගෙන තියනවා.මම එතුමාට කිව්වා මට තියනවා අදහසක්.ඒ තමයි කොහොමද පුහුණු ලාභ ලබන කේන්ද්‍රස්ථානයක් හදන්නෙ ඒකට මෙට්‍රික්ස් ස්කිල් කියන සිස්ටම් එක මම ඉදිරිපත් කරා.ඒ අනුව අපි මිල්ලට කියන තරුණයාව බඳවා ගත්තා,ඔහුට ලෙජර් කොලිෆිකේෂන් තිබුනෙ නැහැ.හිටපු කොමසාරිස්තුමා ඇහුවා කොහොමද ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්නෙ කියලා.මම එතුමාට කිව්වා ජර්මන් ටෙක් එකට,නයිටා එකට දාලා අපි විශේෂ එකක් කළ ලකුණු හැත්ත හයක් අරගෙන පාස්වුනා.අද ඒ තරුණයා කෝටි පනහලවක් විතර මේකට ඉතිරි කරලා දීලා තියනවා.ඊට පස්සේ ගාමිණී කියන තරුණයෙක් එක්ක එකතු වෙලා මේක සැලසුම් කරලා අද වෙනකොට ආරක්ෂක අමාත්‍යාංශයේ රුපියල් ලක්ෂ හැත්ත හයක වැඩක් කරලා

හදන්න.මේන අලුත් ආදායම් මාර්ගයක් උත්පාදනය කරන්න ලැබුනා.ඒක තමයි අපේ තියන හැකියාව.හැමදෙනාටම හැකියාවන් තියනවා,ඒක එකතු කරලා කටයුතු කරන්න කියලා මම කියනවා.

ගරු නගරාධිපතිතුමනි,මාගේ පළවෙනි මන්ත්‍රීවරුනිකපන් මාසයට රුපියල් සංවිධානයෙන් අවුරුද්දක් වව අඩුලාන සුමනාරාම දහම් පාසලේ ළමුන්ට කිරි වීදුරුවක් ලබාදුන්නා. 2008 සිට 2010 දක්වා ලැබුණු මන්ත්‍රී වැටුප් සෝමසිරි සරණකීර්ති නමින් හදලා දුන්නා කල්දෙමුල්ලේ නිවාසයක්,ලුනාව ජර්හලේ මාතෘ සායනයක් තිබුනේ නැහැ, මම සද්ධන කරපු සල්ලිත් එකතු කරලා රුපියල් ලක්ෂ අදහනමාරක් විතර දාලා ලක්ෂ පහක් විතර වියදම් කරලා මාතෘ සායනයක් හැදුවා. එගොඩඋයන ලක්ෂ පහළවක මුදලක් දාලා ලක්ෂ තිස්අටක සුහුරු ග්‍රාමසේවක නිලධාරී කාර්යාලයක් හැදුවා.අදවරත් ඵලදායීතා සම්මානය ලැබුනා.ඒ නිසා මේකට ඔබතුමාට සහයෝගයක් ලබාදෙන්න සූදානම්.එනිසා ගරු නගරාධිපතිතුමනි අපොහන් පැත්තෙන් ගමාරද්ධාවේ ජනතාව නමත් පුරන්අප්පු ව්‍යායාමශාලා ජර්මනියෙන් ගොනාපු ගොඩ වාහන උපායින්ට් එකක් සවි කරලා තියනවා.අද ඒක පාවිච්චි කරන්නේ නැහැ,ආදායම් උත්පාදනය කරන මාර්ගයක් අද වෙනකොට ඔබතුමා බලන්න කඩිබැද්දේ තියන මංසිරුව.අද කවියට මේක පාලනය වෙන්නේ නැහැ,අද ඒක හොඳ මාර්ගයකට ගන්න.ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවකට නැත්නම් නගර සභාවෙන් කරනවානම් ඒක හොඳයි.අපේ ගෙළවල හැදිච්ච නිවාස සංකීර්ණය අපිට විශාල අධාර ලැබුනා.අපිට මේක ලබාගන්න කඩිනම් කියලා අවුරුදු අදහමාරක් ගියා.කව එකහමාරක් ගියා මේකෙ තියන බැරකලාහ වර්ග ඉවත් කරන්න.මේ ව්‍යාපෘතිය ක්‍රමක්‍රමයෙන් පටන් ගත්තා.එනිසා අද ජපානයෙන් ලැබිච්ච ආධාර වලින් මුලින්ම හත්සිය නැත්ත අටක් හදන්න තිබිය.ඊට පස්සේ පන්සිය හැත්තෑපහට අඩුවුනා රත්මලානෙන යුවන් පට්ය තියයන නිසා.ගරු නගරාධිපතිතුමනි,අපි ඔබතුමාට හදවතින් උදව් කරනවා වගේම හදවතින් ඔබතුමාට සුභාසිංහනය පිරිනමනවා.ඔබතුමා දැන් හොඳ තැනක ඉන්නවා ඒ තමයි වදා නිලධාරීන් එක්ක හැදිච්ච හැදිච්ච ඔබතුමා අද මේගොඩ තැනට ඉන්නවා කියන්නේ විලග සභාවට එන නගරාධිපතිවරයාටත් ජේය පහසු වෙනවා මේක කරගෙන යන්න. නගරාධිපතිතුමනි,මේක හරියට යනපාලිත නානායක්කාර මහතාගෙ රන ආගාරයක් සීනා ආකාරයක් විත්‍රපටය විශ්ලේෂණය කරලා තියනවා.එනිසා අද හර්ෂණ මහතාත් හිටියනම් මම කැමතියි.ඔබතුමාට එතුමාගේ විත්‍රපට ගේළිය තමයි රඟ දක්වන්න වෙන්නෙ.ඒක හරියට කරමු.ඒ තමයි ඔබතුමාට තිස්හතරදහසක ඡන්දයක් ලබාදීලා ඔබතුමාව නගරාධිපති කරලා පිහිස්සු කියලා තියනවා.වැඩ බැරිනම් වැඩක් නැහැ වැඩ පෙන්නන්න කියලා.ඔබතුමා එදා පතුරු යවපු සී.පී.එච්.අයි මහතාත් එක්ක ඔහේ කටයුතු කරන්න සිද්ද වෙලා තියනවා.හොඳ තහඩ සෙල්ලම්.ඔබතුමාට ආවරණ අනුමැතිය පටන්ට කටයුතු කරන්න සිද්ද වෙනවා.එදත් කිව්වා බෙල්ල ගහලා මියන් මම නගර සභාවේ ආවරණ අනුමැතිය ගන්නෙ නැහැ කියලා.මබතුමා ඒක ගන්න. ඒක තමයි අපයි බයයි කියන විත්‍රපටය.නගර සභාවේ අදවෙනකොට ඇස්තමේන්තුගත ආදායම් මිලියන තුන්සිය හැත්ත හතරක් තියනවා,ඒකෙන් මිලියන හයසිය හැත්ත හතරක්ම ගණකාධිකාරීතුමා බලාපොරොත්තු වෙන්නෙ අපිට ලැබෙන වරිපනම් වලින්,තව තුන්සිය හැටක් බලාපොරොත්තු වෙනවා මුද්දර ආදායම් වලින්,දඩ ආදායම් වලින් මිලියන තිහක් බලාපොරොත්තු වෙනවා.සියයට විස්සක්වත් මේක පුලුණ කරගන්න පුලුවන් වුනාද.අනාගතයේ තියෙන අභියෝග තමයි ගරු නගරාධිපතිතුමනි,අපට වැටුප් පුතිපූරණය කරන්න හම්බවෙන්නෙ සියයට හැටයි.මේකත් අපි පාලනය කරලා තමයි යන්න වෙන්නෙ.අපට ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් වලට ගන්න වෙන්නේ එකකොට මේවා එක පවනස් කරන්න වෙනවා.ඒක ක්‍රියාත්මක කරනන ඔබතුමාට විසර්ජන පනතකින් නැවත වතාවක් අවසර අල්ලන්න සිද්ද වෙනවා අන්න අභියෝග ඒනියා එහෙම කරගෙන යනකොට අපේ ලක්සනට හිනාවෙලා ඉන්න කොමසාරිස්තුමිය,තාප්‍රමවත් වගේ ඉන්න අපේ ගණකාධිකාරිතුමාගේ ඔලුව සිසිල ගිනි ගනී වෙනවා.ඒක නිවන්න අපිට ගිනි නිවීමේ ඒකකයක් උදව් ගන්න වෙනවා.ඔබතුමා ජනතාවගේ අභිලාෂයන් ඉෂ්ට කරන්න අවශ්‍ය වෙනවා.එහෙම වුනේ නැත්නම් සිංහලුනේ ජිවිත ජනතාවට තමයි සිහසුනෙන් පන්නන්නෙ.ගිනි අවි සහ ගිනි කෙළි විත්‍රපටය ඊලගට එන්නෙ.මේක කරගන්න බැරිවුනොත් එහෙම මේ අවුරුදු .පහ ගත කරන්න වෙන්නෙ නැව ලියුනාත් බැන්දුන් කියන විත්‍රපටයෙන්.ඔබතුමා අවුරුදු විසිහතකට පෙර මේ නගර සභාවේ හිටියා විශේෂයේ ගොඩමයන මිනිසෙක් විදියට හැඬුයි ඒ ගොඩමියන මිනිසාව මියන මිනිසෙක් බවට පත්කරන්න නැතුව අපි මේ මෙහෙරදුවේ වර්ග කිලෝමීටර විසිතුනයි දශම හතරේ ඉන්න මිනිසුන් ටික අපේ ආදරණීය ජනතාව වෙනුවෙන් අපි මන්ත්‍රීතාම වැඩිහෙයා මන්ත්‍රීතාම රජවරු කරන්න ඔබතුමාට උදව් කරනවා කියන

පොරොන්දුව ලබාදෙමින්,ගරු නගරාධිපතිතුමනි.වැස්ස වලාහක සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ ආකාර හතරකින් විග්‍රහ කරනවා.

න ගජ්ජිතා වස්සති,සමහර වැහි තියනවා වැහි වලා නැවයි ගිගිරුම් වහින්නෙත් නැහැ ගොරවන්නෙත් නැහැ.සමහර වැහි තියනවා ගජ්ජිතා වස්සති වහිනවා ගොරවනවා වගේම,තව සමහරු තුන්වනවා ගජ්ජිත න වස්සති ගොරවනවට වහින්නේ නැහැ.සමහර වැසි තියනවා. න ගජ්ජිත වස්සති සමහර වැහි තියනවා ගොරවන්නේ නැහැ වහිනවා.පාලිය අවුරුදු පිරිනමන්නේ තුළ ඔබතුමාට විපක්ෂයේ ඉඳලා ගොරවන්න පුලුවන් වුනා.වැස්සක නැති වුනත්,නැබැයි අනාගතයේදී ඔබතුමාට අපිට පුලුවන් වුනා ගොරවනව නැති වුනත් වැස්ස වගේ වැඩ කරන්න.එනියා මම ඔබතුමාට ප්‍රාර්ථනා කරනවා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් සියලු දෙවිනාවුන් වහන්සේලාගේ බ්‍රහ්ම දෙවිනාවුන් වහන්සේලාගේ ශේෂ නාගරාජයාගේ සියලු දෙනාගේ පිහිට ආරක්ෂාවෙන් මේ කටයුත්ත කරන්න. වැස්ස වගේම ගොරවන කණ්ඩායමක් වෙන්න කණ්ඩායමට හැකියාවක් ලැබේවා කියමින් ප්‍රාර්ථනා කරමින් නවතිනවා.

<u>ගරු නගරාධිපති - එස්.බී. නිශාන්ත පුදිනාන්ද මහතා</u>

ගරු මන්ත්‍රීතුමා. මාත් ප්‍රාර්ථනා කරනවා නැවත නැවතත් කරුමක්කාරයෝ තාම බලන්න නොලැබේවා කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි ඔබට ද අවසරයි. නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, ඔබතුමියගෙන්ද අවසරයි. කොමසාරිස්තුමියගේ හා සභා ලේකම්තුමාගෙන්ද, රාජ්‍ය අංශ විධායක නිලධාරීන්ගෙන්ද මෙතෙක් පත් වූ අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන්ද, ඒ වගේම අපි වගේම අළුත අපගේ නවක මන්ත්‍රීවරුන්ගෙන්ද අවසරයි. මම සභාවට කතා කරන්න නාමිකිරීමකොට අවසන් කාලේ බුදු බණකින් නිසා මට හිතෙනවා මෙහෙම කියන්න. අපේ බුදුහාමුදුරුවෝ දේශනා කාලේ පුද්ගලයෝ දිහා බලලා ඔවුන්ට ගැලපෙන ධර්මය මොකක්ද කියලා හිතුවා. දේශනා කල්පනා කරලා බුදු බණ දේශනා කළා. මම හිතන්නේ ඔබත ඉතිහාසයට ගැලපෙන ධර්ම දේශනාවක් ඔබතුමා කළා. මම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා ජාතික ජන බලවේගයේ නවක මන්ත්‍රීවරයෙක් හැටියට මාව මෙම සභාවට පත් කරපු මගේ විල්ලෝරාවත්ත ආදරණීය ජනතාව සිහිපත් කිරීමටත්, දේශපාලනයේ අත්පොත මට මුල් වතාවට දුන්නේ 1997 දී. මම දේශපාලනය කලේ නැහැ, මට දුන්න පොත අම්මා. ඒ වගේම මට මෙතනට එන්න අපේ පක්ෂයේ ගොඩක් අය උදව් කළා. දේශපාලන දැනුම ලබා දුන්නා. ඉතිං ඒ ගමන කෙළවරක් වුණේ මේ මොරටුව නගර සභාවට පිවිසෙන්න. ඉතිං මාව මෙතනට පත් කාලේ තර්ක විතර්ක වලට පණ පොවන පිරිසක් බවට පරිවර්තනය කරන්න නොවන බව මම හොඳ හැටිම දන්නවා. මා ප්‍රායෝගික මිනිසෙකු හැටියට මේ සභාවට එවලා තියෙනවා මාගේ ජනතාව. සභාව තුළ සක්‍රීය දේශපාලනයක් කරන්න මිදියයි මා සිතනවා. තර්කය තුළින් බිඳ වැටී තර්කයක් ගොඩනැගෙන සමාජයක මාගේ ජාතික ජන බලවේගය පොළව තුළ, පොළොවේ හදගැස්ම තුළ, පොළොවේ ක්‍රියාකාරිත්වය තුළ, මාව මිනිසෙක් බවට පරිවර්තනය කරලා පිළිබිඹු කළා, හැදුවා. මම විල්ලෝරාවත්ත ජනතාවට ඒ පොළවට පතිත කරමින් පවතිනවා. ඉතිං මාව මෙතනට පත් කරපු ජනතාවගේ අවශ්‍යතාවය වුනේ මේ නගර සභාවේ හිටපු මන්ත්‍රීවරු කියපු විදියටම දූෂණයකින් තොරව නගර සභාවකට පත් වෙලා ඒ නගර සභාවේ කටයුතු කරන්න අපි පෙනී සිටිනවා. මා විතරක් නොවෙයි අපේ 26 දෙනාම දූෂණයෙන් තොරව කටයුතු කරන්න පුළුවන් කියලා. දැන් පසුගිය දූෂණය ගැන කතා කරපු මන්ත්‍රීවරුන්ටත්, වර්තමානයේ දූෂණය ගැන කතා කරන්න ඉඩක් නැතිවෙයි කියලා අපි හිතනවා. අපි ඒක මහත් ආඩම්බරයෙන් ප්‍රසිද්ධ ප්‍රකාශ කරනවා. හරි අපි එහෙම තමයි. අපි දූෂණයෙන් තොරයි. අනාගතයේ ඔබට කතා කරන්න වෙන්නේ දූෂණයෙන් තොර නගර සභාවක් කියලා අපේ හදවත තුළ තියෙනවා. අභිමානයෙන් යුතුව තියෙනවා. ඒ වගේම මම පොඩ්ඩක් හරි කණස්සලු වෙනවා මහා නගර සභා ආඥා පනතේ 175 (1) වගන්තියේ විධිවිධාන යටතේ අපි මෙතන සාකච්ඡාවක් වුණා. නැතැයි අපි නවක මන්ත්‍රීවරු හැටියට මෙතනට එනකොට උදාර කරපු නිලධාරීන් විශාල පිරිසක් හිටියා. මා නගර සභාවේ අත්පොතවත් නොකියපු මෙතනකොට ඒ නිලධාරීන් සෞඛ්‍ය අංශයේ හෝ වෙනත් විදුලි අංශයේ හෝ වේවා සියලු නිලධාරීන් අපිට සහයෝගය

දැක්වූවා. ඒකට හදවතින්ම මා ස්තූතිවන්ත වෙනවා. ඔබගේ සහයෝගය ඉදිරියටත් අපිට නොඅඩුව ලැබේ කියයි විශ්වාස කරනවා. අපි ඒ විශ්වාසය තුළ තවත් ක්‍රියාත්මක වෙනවා. අපිට ඔබ විශ්වාසයි සමිතතින් එකට ගරු නගරාධිපතිතුමා කියපු විදිහට ඒ සියලු කටයුතු සිදු වෙයි. ඒ වගේම සංවර්ධන කටයුතු ගැන කතා කළොත්, මීට දේශපාලන පාලනයෙන් පුළුන්, මේ මොරටුව නගරය අපේ විල්මල්ලෝරුවත්ත ප්‍රජාශාලාව වගේ අක්‍රීය මට්ටමක තිබුණේ. කිසිම පැහැදිලි කාර්යක් නොතිබුණු මේලාවක අපි මේ සභාවට එන්නේ. මම කියන්නේ සක්‍රීය දේශපාලනය කියන්නේ ඒකයි. සභාවට එන්න ඉස්සෙල්ලා අපි ඒවා පිරිසිදු කරන්න ශ්‍රමදාන පැවැත්වූවා. මම ඔබතුමන්ට විශේෂ ආරාධනයක් කරනවා. මාගේ දේශපාලනය තුළ මගේ කොට්ඨාසයේ මට දිනුම් පැරදුම් වූ අපේක්ෂකයෙක් නැහැ. ඔවුන්ට මං හා සමානව මම සලකනවා. අපේ සියලුම දේවල් වලට විපක්ෂය ජය පරාජයෙන් තොරව, අපේ සියලුම කටයුතු වලට සහයෝගය දක්වන ලෙසින්. අපිත් එක්ක ගම හදමු, ගම ගොඩනගමු. ඔබට විශ්වාසයි අපේ භූමිය. අපිත් එක්ක උරෙන් උර ගැටෙන්න. අපිත් එක්ක සම්බන්ධ වෙන්න, අපි දන්නවා අපේ නගරාධිපතිතුමා කියන්නේ ප්‍රදීනාන්ද මහතාට මහත් ඔප්පු පැවරී තිබෙනවා කියලා. ඒ හැකීම අපිට සභාව තුළින් ආවා. අපි දන්නවා ඒ බර. ඒ බර දැරෙන තමයි අපි 26 දෙනාම පාසල වලට අපේ කියලා විශ්වාස කරනවා. මේ 26 දෙනා අපේ ගරු නගරාධිපති, කියන්න ප්‍රදීනාන්දගේ බර සමසාතිකව අප උර මත තියීම අවිවාදිත් තොරව පරමාගත යනවා කියන විශ්වාසයෙන් මා ඔබ සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුජේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ මම උභතෝකෝටිකයකට ලක් වෙලා තියෙන වෙලාවක්. තමුන්නාන්සේ ඔබතුමාට නියෝජ්‍ය ප්‍රදීනාන්ද සහෝදරයා කියලා ආමන්ත්‍රණය කරනවා ද, එහෙම නැත්නම් ගරු නගරාධිපතිතුමා කියලා ආමන්ත්‍රණය කරනවා ද, කියලා උභතෝකෝටිකයක ඉන්නේ. ඇයි මම එහෙම ඉන්නේ, ඔබතුමාගේ සහෘද සත්කාරය. ඔබතුමා එවා නැත්නම් නියෝජ්‍ය ප්‍රදීනාන්ද සහෝදරයා කියන ආමන්ත්‍රණයට කියලා මම දන්නවා. නමුත්, මේ සභාවේ තිබෙන ගෞරවනීය බව හා සම්ප්‍රදාය සලකා බොට් ගෙන, මම ඔබතුමාට ගරු නගරාධිපතිතුමා කියලා ආමන්ත්‍රණය කරනවා. ගරු නගරාධිපතිතුමනි, මෙවර සභාව දුකමත් විවිතුවන් සභාවක් ලෙස මම දකිනවා. ඒ විවිතුවක් ලෙස මම දකින්නේ, මට මතකයි ඒ කාලේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා නිතරම අපිට කියපු කතාවක් තිබෙනවා. ඔහු නිතරම කිව්වා අපේ ජීවිතය වෙනස් කිරීමට ප්‍රථමව, ඒ වෙනස තමා තුළ ඇති කර ගන්න කියලා. එතුමාගේ පදනීය කාලපරිච්ඡේද සති දෙක තුන තුළදී, එතුමාගේ හැසිරීම හා එතුමාගේ භාවිතාව කලින්ට සංයෝජනය විල්වින් සිල්වා කියපු ඒ වෙනස ඔබ තුළ ඇති කරගෙන යයි කියන හැඟීම මට ප්‍රත්‍යක්ෂ වුණා. ඔබතුමා පදනීය සති දෙක තුන ඇතුළේ ප්‍රසස්ථ භාවිතාවක නිරත වෙන බව මට පේනවා. ඒ නිසා ප්‍රථමයෙන්ම ඔබතුමාට මගේ සුභ පැතුම් පිරිනමනවා. ඉදිරි වසර හතර සඳහා ඔබතුමා ඇතුළු මේ ඔබතුමාගේ කණ්ඩායම මේ පරිවර්තනය, මේ වෙනස මොරටුව තුළ ඇති කරන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා. ඒ වගේම විපක්ෂ නායකතුමා ඇතුළු අපේ සියලුම මන්ත්‍රීතුමියන්ලා තුමන්ලා, ඒ වගේම කොමසාරිස්තුමිය, නාගරික ලේකම්තුමා නාරක මහත්තයා, ඒ වගේම නාගරික ගණකාධිකාරීතුමා ඇතුළු සියලුම නිලධාරීතුමන්ලා අපේ මාධ්‍යවේදී මිතුරන්. ගැලරියේ සිටින මොරටුවේ ආදරණීය ජනතාවගෙනුත් මම අවසර පතනවා.

ගරු නගරාධිපතිතුමනි, සම්ප්‍රදායානුකූලව අපි විපක්ෂයේ තමයි හැබැයි මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට වඩා මගේ භූමිකාව ඉටු කර ගන්න මම සූදානම් නවත්තේ, විකල්පයේ මන්ත්‍රීවරයෙක් ලෙස, ජාතික ජන බලවේගයට විකල්ප මන්ත්‍රීවරයෙක් ලෙස තමයි මම මගේ භූමිකාව ඉටු කරන්න බලාපොරොත්තු වෙන්නේ. ගරු නගරාධිපතිතුමනි, අපි අහලා තියෙනවා ප්‍රිට් කියලා දෙවියෙක්. ඒ ප්‍රිට් කියන දෙවියා හඳුන්වන්නේ, පිරිසිදු බවේ සංකේතය. ඊට පසුව කියනවා තව දෙවියෙක් ගැන, ඒ දෙවියා පහළ වෙන්නේ ප්‍රිට්ගේ හිසින්. මේ ප්‍රිට්ගේ හිසින් පහළවෙන දෙවියාට කියනවා මිනර්වා කියලා. මිනර්වා කියන්නෙත් සුපිරිසිදු බවේ සංකේතය. ප්‍රිට් පිරිසිදුයි, මිනර්වා සුපිරිසිදුයි. දැන් ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඇතුළු ඔබතුමාගේ කණ්ඩායමට තිබෙන අභියෝගය. ඔබතුමන්ලා ජනතාවට කියපු කාරණා, කියපු දේවල් එක්ක ගත්තම ප්‍රිට්ගේ හිසින් පහළ වෙච්ච මිනර්වා වගේ පාලනයක බලාපොරොත්තුව තමයි අපේ රටේ ජනතාවට දුන්නේ, දැන්

ඔබතුමිලාට තිබෙන අභියෝගය අන්න ඒ සුපිරිසිදු පාලනය, ඒ ජනතා අභිලාශය, ඔබතුමාලා ප්‍රායෝගිකව භාවිතාව තුළ ක්‍රියාවට නංවන්න. ඒක සුවිශේෂී අභියෝගයක් ගරු නාගරාධිපතිතුමනි. ඒ නිසා මම ප්‍රකාශ කරනවා අනිවාර්යයෙන්ම ජාතික ජන බලවේගය විදියට, ඔබතුමාගේ රජය ආණ්ඩුව රටට එරෙහිව සිදු කරනු ලබන කදින්ම ඒ විරුද්ධත්වය වගේම මහනුවර ජනතාව වෙනුවෙන් මේ ඔබතුමාගේ නායකත්වයෙන් ජාතික ජන බලවේගයේ මේ කණ්ඩායම කරන සියලුම සාධනීය කටයුතු වලට විවේචනය විතරක් නොවෙයි ක්‍රියාවෙනුත්, ඔබතුමා ඇතුළු මේ කණ්ඩායමට සහයෝගය අප කරනවා. ඒ සහයෝගය පළ කරන්න ගරු නාගරාධිපතිතුමනි, ප්‍රධාන හේතුව අපිත් මේ මහනුවර ජනතාවට වගකියන, වගකිවයුතු මහජන නියෝජිතයන් නිසා. ඒ නිසා පළමුවෙන්ම මම ස්තූතිවන්ත වෙනවා. අපේ පක්ෂයේ ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ සහෝදරයාටත්, අපේ පක්ෂයේ දේශපාලන මණ්ඩලයටත්, අපේ පක්ෂයේ මට්ටම කමිටුවත්, ඒ වගේම පසුගිය ගිය මැතිවරණයෙන් අපහසුවෙන් අමාරු තත්ත්වයක් යටතේ නාම යෝජනා ලබාදීලා, නාම යෝජනා ලබා දීපු අපේක්ෂක සහෝදර සහෝදරියන් 51 දෙනාටත්, ඔවුන්ගේ සියලුම මහන්සියේම ප්‍රතිඵලයක් විදියට තමයි අපිට මේ මන්ත්‍රී ධූරය ලැබුණේ ඒ වගේම මහනුවරුවේ ජනතාව උඩුගම්බලා විනාපු ආංවාශුයටට ඡන්දය දීපු ඒ ජනතාවටත් මගේ ගෞරවනීය ස්තූතිය පළ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ නිසා ගරු නාගරාධිපතිතුමනි, මේ අවස්ථාවේ අපි දන්නවා විපක්ෂයක් විදියට ජාතික ජන බලවේගයට සැලකිය යුතු ඡන්ද ප්‍රමාණයක් අඩු වුණා මෙම මැතිවරණයේදී. හැබැයි අපි උදේම අනාගතයට විපක්ෂය විදියට ලක්ෂ විසිතුනක් අඩු වුණා කියලා විපක්ෂය විදියට අපි හරියට ඒක කියව ගන්නේ නැහැ. ලක්ෂ විසිතුනක් අඩු වුණාට ඒ ලක්ෂ විසිතුන විපක්ෂයට ආවේ නැහැ. එයින් කියනා කාරණය තමයි මේ රටට අලුත් බලවේගයක, නැවුම් බලවේගයක, අලුත් නායකත්වයක අවශ්‍යතාව, චින්තනය තිබෙනවා. අන්න ඒ නිසා ඒ නැවුම් බලාපොරොත්තු වන වන්ධනය, ව්‍යාපාරය, නව ලිබරල් වාදයට එරෙහිව ඒ ජාතිවාදය, දේශප්‍රේමී, වාමවාදී, ප්‍රගතිශීලී ව්‍යාපාරය ගොඩනැගීම වෙනුවෙන් මගේ මන්ත්‍රී ධූරය ජාතිකව මම පාවිච්චි කරනවා. මහනුවර ඇතුළේ ඔබතුමා කිව්වා වගේ ඔබතුමාලා කරන යහපත් දෙයට ප්‍රායෝගිකව, ක්‍රියාකාරීව මගේ දැනුම සියල්ල දෙන්න මම සූදානම්. මට අදාළ නෑ ගරු නාගරාධිපතිතුමනි, ඒ වාසිය ජාතික ජන බලවේගයේ මහනුවර මහා නගර සභාවේ ඒ කණ්ඩායම ගත්ද, ඔබතුමා ගත් ද ඔබතුමාට ලැබුණු යයි ද එය මට අදාළ නෑ. මගේ හැකියාව, මගේ දැනුම මගේ නිර්මාණශීලී බව මේ සියල්ල රටට දවසේ මහනුවර ජනතාව වෙනුවෙන් මම ලබා දෙන්න සූදානම්, ඔබතුමාලා ලබා ගන්න කැමතිනම්. ඒ නිසා ගරු නාගරාධිපතිතුමනි, අපි මන්ත්‍රීවරු මෙතැන 52 ඉන්නවා ඔක්කොම. අද 51 වුණාට 52 ක්ම ඔක්කොම. පසුගිය අවුරුදු දෙකහමාරක ඇතුළත මහජන නියෝජිතයෝ හිටියේ නැහැ. කොමසාරිස්තුමියගේ නායකත්වයෙන් මේ මහා නගර සභාව පවත්වාගෙන ගියා. අඩුපාඩු තියෙන්න පුළුවන්. හැබැයි සභාව පවත්වාගෙන ගියා. දැන් ගරු නාගරාධිපතිතුමනි, කොමසාරිස්තුමියගේ ඒ පාලනයට ඉහළින් මේ සභාව පිහිටුවා, මන්ත්‍රීවරු 52 ක් ඉන්නවා. ඔබතුමාගේ නායකත්වයෙන්. හැබැයි නව අවුරුදු හතරකින් පසු කරන්න වෙන්නේ, අර අවුරුදු දෙකහමාරක යටතේ වූ සභාවක් නම් කොයි පක්ෂයේ වුණත් මහජනතාව අපිව තෝරාපත් කර එහෙනම් මෙතැනට එවීමෙන් වැඩක් වෙන්නේ නැහැ. ප්‍රතිඵලයක් නැහැ. ඒ නිසා අපි සියල්ලන්ගේම වගකීමක් තියෙනවා මේ සභාව ඊට වඩා අඩි ගාණක් ඉහළින ස්මාර්ට් සභාවක් බවට පත් කරන්න. අන්න ඒ සඳහා ගරු නාගරාධිපතිතුමනි. මම නැවත වතාවක් කියන්නේ, මට කරන්න පුළුවන්, මට තිබෙන හැකියාවෙන් අඩුව, එයට දායක වෙන්න මම සූදානම්. ඒ නිසා අවසාන වශයෙන් ගරු නාගරාධිපතිතුමනි, මම මේ කාරණ කියලා මම නිහඬ වෙනවා. මම ජාතික ජන බලවේගයට සපුරා විරුද්ධයි. හැබැයි ගරු නාගරාධිපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණට මම අදටත් ආදරෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශන පලිහේන්ඩ්‍ස් මහතා</u>

ගරු නාගරාධිපතිතුමාගෙන්, ගරු නියෝජ්‍ය නාගරාධිපතිතුමියගෙන්ද, නාගරික කොමසාරිස්තුමිය, නාගරික ලේකම් ඇතුළු සියලුම නිලධාරින් සහ මෙතැනට පැමිණ සිටින සියලුම සහෝදර මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගෙන්ද, ගැලරියට පැමිණ සිටින මහජනතාවට, ඒ වගේම මාධ්‍ය සහෝදරවරුන් සියලුම දෙනාගෙන්ම අවසරයි. මා නියෝජනය කරන්නේ උයන උතුර කොට්ඨාසයයි. ප්‍රථමයෙන්ම මම ස්තූතිවන්ත වෙනවා උයන උතුර ජනතාවට. මම 2021 වගේ පමණ තමයි දේශපාලනයට අවතීර්ණ වුණේ. දේශපාලනයට එන්න කිසිම උවමනාවක් තිබුණේ නැහැ. නමුත්, මෙච්චර කාලයක් තිබුණු පරණ සිස්ටම් එක, දූෂණය. වංචාව බල බල ඉන්න බැරි කමට තමයි

අපි මේ විදියට ඉදිරිපත් වුණේ විශේෂයෙන්ම ස්වෙච්ඡාවෙන්. අපිට අවශ්‍යතාවය තිබෙන්නේ සත පහක්වත් තමයින් අර ගන්නවත්, සත පහකවත් ලාභ ප්‍රයෝජනයක් ගන්න නෙමෙයි. මේ ගම, මේ රට මේ තියෙන තත්ත්වයෙන් ඉහළට ගන්න අඩුම ගානේ අපේ දරුවන් වෙනුවෙන්වත් ඉතාම සුහදායි ස්ථානයක් කිරීම තමයි. ඒ වෙනුවෙන් මට කරන්න පුළුවන් සියලුම කැපවීම්, ක්‍රියා මාර්ග කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් පුනාව කියන ප්‍රදේශයේ පුනාව කැලෑබුමෙන්, පුනාව ව්‍යාපෘතියට අදාළ විනාශ වෙලා තියෙන ගොඩනැගිල්ලක් තියෙනවා, ඊට අමතරව ආදාහනාගාරයක් තිබෙනවා, මම හිතන්නේ එය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඊට අමතරව ජනතාව දුගී දුප්පත් ජනතාවක් ඉන්නේ. ඉතාම අමාරුවෙන් වැඩ කටයුතු කරන්නේ, ප්‍රශ්න ගොඩක් තිබෙනවා එක උඩියනින් ගොඩ ඔසවා තැබීමට මේ අවුරුදු හතර ඇතුළත මට අවස්ථාවක් ලැබෙයියි මම විශ්වාස කරනවා. ඒ ප්‍රදේශයේ විපක්ෂ මන්ත්‍රීවරුන්, වර්යන් සිටිනවා. ඔවුන්ගේ සහයෝගය සහ මෙහි සිටින අපගේ සියලුම මන්ත්‍රීවරුන්ගේත්, සියලුම නිලධාරීන්ගෙන් සහාය මට ලැබෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වගේම සියලු දෙනාටම සුබ කාලයක් උදාවේවායි කියලා මම විශ්වාස කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - වූ. සුදත් තුෂාන්ත ඉපපේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, විපක්ෂ නායකතුමනි, ඒවගේම ජ්‍යෙෂ්ඨ මහා නගර සභා මන්ත්‍රීවරුන්ගෙන්ද, නවක මන්ත්‍රීවරුන්ගෙන්ද, නාගරික කොමසාරිස් ඇතුළු සියලුම නිලධාරීන්ගෙන්ද අවසරයි. මම පොදු ජන පෙරමුණෙන් කලින් තරග කරලා තිබුණේ. නමුත් මේ පාර සමගි ජන බලවේගයේ මහා සභා මන්ත්‍රීවරයෙක් විදිහට පත් වුණා. මම පොදු ජන පෙරමුණෙන් අයින් වුණා ඒ ගැන්තුව ගරු නගරාධිපතිතුමාත් දන්නවාත් ඇති. ඒ තිබුණ නගරාධිපතිතුමා දූෂිත පාලනයක්, පාලනය කළේ. අනිකාද ඒ පාලනය අපිට හරි ගියේ නැහැ. නමුත්, ගරු නගරාධිපතිතුමා දූෂණයට විරුද්ධව කලාපු හඬක් නැගලා, මේ සභාවේ ෆයිල් පොළොවේ ගහලා එළියට ගිහිල්ලා තියෙනවා. දූෂිත දෙයකට මොරටුවේ ජනතාව වෙනුවෙන් කථා කරන්න බැහැ. එහෙම නගර සභාවක් තිබුණේ. එයට අපි ශ්‍රීවෙනුවෙන් ගොඩක් මම විරුද්ධ වුණා. මම කියන්නේ නැහැ සියලුම නිලධාරීන් දූෂිතයි කියලා. දූෂිත නිලධාරීන් පුරුදු කළා. පුහුණුවීම් දුන්නා. මම නැති කාලේ, නගරාධිපතිතුමා එයාට ඕන විදියට දූෂිත නිලධාරීන් පුරුදු කරලා, ප්‍රයෝජනයට ගත්තා. මේ මොරටුවේ ජනතාවට ලොකුම දූෂිත පාලනයක් තිබුණේ. මමත් අවුරුදු දහයක් වෙනවා මහා නගර සභා මන්ත්‍රීවරයෙක් විදිහට. අපි දූෂිතයින්ට කථා කළා අපි නැගී සිටියා. නමුත්, ඒ වගේ දූෂිත නගර සභාවක් මෙමගේ තිබුණේ. ගරු නගරාධිපතිතුමා ෆයිල් පොළොවේ ගහලා යන්න ගියා. වැඩක් කර ගන්න බෑ මුදල් නොදී. වැඩක් කර ගන්නවානම් මුදල් ඉස්සර කරන්න ඕනා. ඒ වගේ නගර සභාවක් වැඩක් නෑ. දැන් ගරු නගරාධිපතිතුමාගේ නවක පාලනය යටතේ, මම හිතනවා ගරු නගරාධිපති ජේ.ඩී. නිශාන්ත ප්‍රදීපචන්ද්‍ර යටතේ පාලනය, දූෂණයෙන් තොර පාලනයක් වෙයි කියලා. ඒ වගේම මට ලැබෙන දීමනාව මිණුම්කාට දාලා, හැම අවුරුද්දේම තවත් ලක්ෂ 5 ක් වියදම් දාලා යමේ දුප්පත් දරුවන්ට පාසල් පොත් ලබා දෙනවා. ලොකු වැඩ සටහනක් කරන්නේ. ඒ වගේම සමගි ජන බලවේගයේ මට මේ අවස්ථාව ලබා දුන්න අපේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ගොඩක් ස්තුතිවන්ත වෙනවා. මම ගරු නගරාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, දූෂිතයෝ කියලා සියලුම දෙනා නොවෙයි කොටසක් ඉන්නවා. ඒ පාලනයේ පුරුදු කරපු කට්ටියක් ඉන්නවා. ඒ පුරුදු කරපු කට්ටියගෙන් පරිස්සම් වෙලා නගර සභා පාලනයේ කටයුතු කරන්න කියලා මම නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, නාගරික කොමසාරිස්තුමියනි, ලේකම්තුමා ඇතුළු සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි. ඒ වගේම මේ මොහොතට පැමිණි මාධ්‍යවේදීන්ගෙන් අවසරයි. ඒ වගේම පත් වූ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. කොරළවැල්ල නැගෙනහිර කොට්ඨාශයෙන් තරග කරලා මහා නගර සභා මන්ත්‍රීවරයෙක් හැටියට මාව පත් කරන්න මා හට සහයෝගය ලබා දුන්න, ඡන්දය ලබා දුන්න, කොරළවැල්ලේ ජනතාවටත්, මොරටුව ජනතාවටත්. ජාතික ජන බලවේගයට බලය ලබාදීම සඳහා සහයෝගය ලබා දුන්න මොරටුවේ ජනතාවට මේ මොහොතේ මාගේ ස්තූතිය පුද කර සිටිනවා. ගරු නගරාධිපතිතුමනි, අපි ගත්තොත් පසුගිය දේශපාලන කාලය තුළ බලනකොට සභාවට ඇවිල්ලා

මන්ත්‍රීවරයෙක් විදියට, කණ්ඩායමක් හැටියට අපි හතර දෙනෙක් ඉන්නකොට අපිට ප්‍රදේශයට වැඩක් කර ගන්න සැලකෙන ප්‍රයත්නයක් දරන්න වුණා. විවිධ ලාභප්‍රාප්ත දමා ගන්න වුණත් අපිට සැලකෙන සටන් කරන්න වුණා. නමුත්, අපිට දැනගන්නට අපේ නිශාන්ත ප්‍රදීපානන්ද ගරු නගරාධිපතිතුමා, සියලුම පක්ෂවල සැමීණ මන්ත්‍රීවරුන්ට සාකච්ඡා වලදී කිව්වේ මහනුවරලෝ එකතු වෙන්න එන්න අපිත් එක්ක වැඩ කරන්න අපි පක්ෂ ද, විපක්ෂ ද කියලා තියන්නෙ නැ සැම කෙනෙක්ටම අපි උදව් කරනවා. සෑම කෙනෙක්ගෙම අභිලාෂය මොකක්ද මොරටුවේ ජනතාවට සේවය කරන්න. ඒ මොහොතේ මමත් හිටියා ඒ ආප්ප මන්ත්‍රීවරුන්ට, කණ්ඩායමට කිව්වේ, අපි උදව් කරගෙන යමුය කියලා. සැලකෙන ගරු වැඩ තිබෙන ගමන්. ඒ නිසා අපි මෙය පොඩිකාලා මොරටුවේ ජනතාවට අපි සේවය කරමු කියලා ඔබතුමා එදා ප්‍රකාශ කළා. ඒ දේ ඉෂ්ට වෙනවා. පක්ෂ ද විපක්ෂ ද බලන්නේ නැතුව හැමෝගේම ප්‍රශ්නවලට. ඔබතුමාගේ උදව්වෙනුවට ගරු නගරාධිපතිතුමා මැදිහත් වෙලා ඒ දේ ඉෂ්ට කරනවා. ඒ වගේම අතීතය කාලේදී අපි මන්ත්‍රීවරු හතරක් ඉන්නකොට සැලකෙන ප්‍රයත්නයක් දරලා අපේ ප්‍රසාදණීය වික්‍රමසිංහ ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමිය මෙවදා රසායනාගාරයක් අපේ සභාවට ස්ථාපිත කර ගන්න පුළුවන්කම ලැබුණා. නමුත්, ඒ සඳහා අවශ්‍ය දේ අපිට ලබා දුන්නේ නැහැ ඒ කාලයේ තුළ. මේ වෙනකොට අපිට ඊට අවශ්‍ය දේවල් ක්‍රමක්‍රමයෙන් ගොඩනගා ගෙන යනවා. ඒ වගේම අතීතය කාල කරපු මන්ත්‍රීවරයන්ගෙන් ප්‍රකාශ වුණ කාරණාවක් තමයි මොරටුව දකුණු කලාපය ගත්තොත් විශාල ලෙස වැසි ජලයෙන් මාවත් යටවෙලා, දරුවන්ට පාසල් නොයා සිටීමට තරම් මාර්ග විශාල ප්‍රමාණයක් යට වෙනවා. ගරු නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ඔබතුමාගේ මැදිහත්වීම යටතේ අළුත්ම කොරළවැල්ල විද්‍යාපත්තරිය හන්දිය ඒ මාර්ගය නිසි ලෙස ප්‍රයෝජනයට අරන් නගර සභා කොට්ඨාසයින්ගේ, විශේෂයෙන්ම නාගරික කොමසාරිස්තුමිය, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උදගස් ඇතුළු ගරු නගරාධිපතිතුමාගේ මඟපෙන්වීම යටතේ අපි එය කළා. දකුණු කලාපයේ වැසි ජලය බැසයාම ඒ හැඩිරුණු ප්‍රශ්නයක් ලෙස මම දකින්නේ දකුණු කලාපයේ වැසි ජලය සම්බන්ධ ප්‍රශ්නයේදී ඉදිරියේදී පාසල් නොයා අපි ඊට මැදිහත් වෙනවා ඒ නිසා මේ මොහොතේ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ දැනුම අපිට දෙන්න අපිත් ඔබත් සියලු දෙනා එකතු වෙලා මේ ගම මේ මාවත් මේ සියල්ල හොඳින් කළමනාකරණය කර ගෙන ඉදිරියට යමුයි කියා ඉල්ලමින් මගේ මේ කථාව අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, විපක්ෂ නායකතුමා ඇතුළු මහා නගර සභා මන්ත්‍රීවරුනි, නාගරික කොමසාරිස්තුමිය, නාගරික ලේකම්තුමා ඇතුළු අංශ ප්‍රධාන නිලධාරි මහත්ම මහත්මියනි, ගරු නගරාධිපතිතුමනි, මගේ මේ කතිකයෙක් විදියට තුන්වෙනි මංගල සභා රැස්වීම. මම ප්‍රථමයෙන්ම සිහිපත් කළ යුතුයි. මට මන්ත්‍රී ධුරයක් ලැබිලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් විදියට තරඟ වැදිලා. කල්දෙමුල්ල කොට්ඨාසයේ ජනතාව මා කෙරෙහි තැබූ විශ්වාසය හේතුවෙන් තමයි කල්දෙමුල්ල කොට්ඨාසය ජයග්‍රහණය කරලා මාව පත් කළේ. කල්දෙමුල්ල ජනතාවට මම ස්තූති කරනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අපි දන්නවා කලින් විපක්ෂයේ හිටපු පරිණත මන්ත්‍රීවරයෙක්, අද ගරු නගරාධිපතිවරයා බවට පත් වෙලා තියෙනවා. ඔබතුමා මේ කාලසීමාව තුළ අදත් මේ මංගල කථාව තුළ කිව්වේ අපි විපක්ෂයක් විදියට කටයුතු කරන්න අවශ්‍ය නැ එකට ගමනක් යමුයි කියන දේ සභා විදියට ඔබතුමා ප්‍රකාශ කළා. අපි එක්සත් ජාතික පක්ෂය විදියටත්, අපි මොරටුව සංවර්ධනය කරන්න ඕන කට්ටුවක් විදියට නමුව, රටට අපි වැඩ කරන්න ඕන. එම නිසා මෙය අපි සියලුදෙනාගේම පරමාර්ථය වෙලා තියෙනවා. අද ඉදන් වසර හතරක් තුළ අපිට වරමක් ලැබිලා තිබෙනවා ඒ වරම තුළ අපි මහජන ගමට, නගරයට ජනතාවට, විශ්වාසී බදු ගෙවන ජනතාවට බලාපොරොත්තු තවත් ප්‍රතිපත්ති ගමේ හරි කැලැස්මක්. සෞඛ්‍ය වැඩපිළිවෙලක් කර ගෙන යාවි කියන බලාපොරොත්තුව තියෙනවා. අපිට වගකීමක් තියෙනවා අපි විපක්ෂයේ මන්ත්‍රීවරු විදියට අපිට කාර්තව්‍යයක් තිබෙනවා මේ නගරය ගොඩනගන්න මොහොතක අවස්ථාවක් අපි බලාපොරොත්තු. එකතු වෙලා වැඩ කරලා සංවර්ධන වැඩපිළිවෙලකට යන්න. ගරු නගරාධිපතිතුමනි අද ඔබතුමත් දන්නවා මේ මොරටුව ප්‍රදේශය තුළ මදුරු විශාලත්වය ඉහළ යමින් පවතිනවා. අද මොරටුවේ තුළ තමයි චිකන්ගුන්යා රෝගය විශාල ලෙස තියෙන්නේ. රෝහල් තුළ වලින් රෝගීන් විශාල ලෙස ප්‍රතිකාර ලබමින් ඒ ඇදයට මුහුණදෙමින් සිටින වකවානුවක් මේ යන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට වගකීමක් තිබෙනවා, අපිටත් වගකීමක් තිබෙනවා සෞඛ්‍ය

වැඩ පිළිවෙළට කඩිනමින් වැඩ පිළිවෙලක් කර ගෙන යන්න ඕනා කියන දේය. අපි සභාවේ කමිටු නාඩියක් තියෙනවා. ඒ කමිටු නාඩිය තුළ අපි වැඩ කරනවා වගේම මොරටුව සංවර්ධනය කරන්නට. එවගේම අපි ඔබතුමා ගිහිල්ලා ජනතාව වෙනුවෙන් අපිට යම්කිසි දෙයක් කරන්න පුළුවන්නම් ඒ තමයි අපේ හුදකලම සහ අනාගතයට අපි රැගෙන යන දේ. අපි අද වෙනකොට කල්දෙමුල්ල ප්‍රදේශයේ ජල අපද්‍රව්‍ය ව්‍යාපෘතිය පටන් අරන් වසර දෙකක් වෙනවා. අතිශය හොඳ වැඩ පිළිවෙලක්. ඒ ප්‍රදේශයේ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය අවුරුදු දෙකක් තුළ යනවා. කමන්අපේ නිවසේ වැසි වතුර යන්නේ නැතිව අනෙකුත් සියලුම අපද්‍රව්‍ය යන වැඩ පිළිවෙලක්. නමුත් ගරු නගරාධිපතිතුමා මේය කරගෙන යන පිළිවෙල එච්චර හොඳ තත්ත්වයක් නොවෙයි තියෙන්නේ. මෙහි ජනතාව ඉතාම විශාල ලෙස දුක්විඳින තත්ත්වයකට දැන් පත්වෙලා තියෙනවා. අපි විශාල මුදලක් වියදම් කර කාපට් කළා ඊමට් පල්ලේ පාරවත. අද වෙනකොට ඒ කාපට් එක සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ඉවරයි. අවුරුදු දෙකකටත් වැඩියි. තමය තැනින් තැන කඩලා තමයි තියෙන්නේ. වාහන වලට එරබුදයක් වෙලා තියෙනවා වගේම ජනතාවට ගමන් කිරීමත් ඉතා අපහසු තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මම කියනවා මෙහි ඉන්න නිලධාරීන්ට කියලා මෙම ව්‍යාපෘතිය ඉක්මනින් කළොත් තමයි අපිට වගකීම් ගන්න පුළුවන් හැකියාව තියෙන්නේ. සියලුම පාරවල් මේ වෙනකොට කැඩිලා ඉවරයි කල්දෙමුල්ල ප්‍රදේශයේ. ගරු නගරාධිපතිතුමනි, නිලධාරීන්ට කියලා එම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබ සියලු දෙනාටම ස්තූතියි. සමාවෙන්න අපිට වසර දෙකක් තුළ මන්ත්‍රී ධුර නැතිව තිබුණ කාලසීමාවක් තිබුණා අපේ කොමසාරිස්තුමිය, ලේකම්තුමා ඇතුළු නිලධාරීන් නිවැඩු මන්ත්‍රීවරු හැටියට අපිව පිළිගනිමින් වැඩ පිළිවෙල 100% ක් නොවෙන්නත් පුළුවන්. අපිව ඒ කාලසීමාව තුළ මම මේ නිලධාරීන්ට හොඳයි කියනවා නොවෙයි ඒ දේ කරලා දුන්නා. ඉදිරියටත් අපි ඒ දේ බලාපොරොත්තු වෙමින් සියලු දෙනාටම සුබ අනාගතයක් වේවායි බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී</u> - <u>ඩී. දිනූෂි කොෂල්‍යා පෙරේරා මහත්මිය</u>

නෙව් පුබුදිනන උතුම් පැතුම් සිය පතය
නැංවන්නට මොරටුවේ සවිය ඇරඹුමය
නාමය දිනූෂි පොදුජන පෙරමුණය
දැන් දිගු කරමු නැඟුමට හුරුවරය

මොරටුව මහා නගර සභාවට අභිනවයෙන් තේරී පත් වූ ගරු නගරාධිපතිතුමනි,මම නියෝජනය කරන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඒ වගේම මගේ පක්ෂ නායක පස්වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, නාමල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තූතිය පුද කරනවා. මොරටුව සංවිධායක පොදුජන පෙරමුණේ ජීවික මහෝප් ගමගේ මහතා ඇතුළු නිවැරදු නාගරික මන්ත්‍රීවරුන්ටත් වර්තමාන නාගරික මන්ත්‍රීවරුන්ටත් අප වෙනුවෙන් ඡන්දය භාවිතා කළ ඡන්ද දායකයන්ටත් ස්තූතිය පුද කරනවා. ඉදිරියේදී මොරටුව මහා නගර සභාවේ සිදුවෙන හැම කාර්යයක් වෙනුවෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදියට පක්ෂයේ ප්‍රතිපත්ති අනුව ක්‍රියා කරන්න හැකි ප්‍රමාණයෙන් සියලුම ශක්තිය හා ධෛර්ය මොරටුවේ උන්නතිය වෙනුවෙන් ලබා දෙන්න බලාපොරොත්තු වෙන අතර, ඉදිරියට එම කටයුතු සාර්ථක කර ගන්න සභය ඵල කරමින් මාගේ කථාව අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී</u> - <u>එච්. සුජීත් විලංගරෝයි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,පළාත් පාලන මැතිවරණයේ මොරටුව ජයග්‍රහණය කිරීමට අපිට ශක්තිය ධෛර්යය ලබාදුන් මොරටුවේ ජනතාවට ස්තූතිය පුද කරන අතර ලක්ෂපතිය දකුණ කොට්ඨාශයේ ඡන්ද දායකයන් විසින් 62% ක ප්‍රතිශතයකට වැඩි ඡන්ද කොට්ඨාසයකින් ලක්ෂපතිය දකුණ කොට්ඨාශය ජය ගැනීම වෙනුවෙන් එම කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් ස්තූතිය පුද කරනවා. මහා නගර සභාවේ ජාතික ජනබලවේගයේ කණ්ඩායමේ සියලු දෙනාටම ස්තූතිවන්ත වන අතර කොට්ඨාශ භාර සහෝදර සහෝදරියන්ටත් ජාතික ජනබලවේගයට මොරටුව මහා නගර සභාවේ සංවර්ධන කටයුතු ඉටු කිරීමටත් ඇපකැප වෙන ලෙස සියලුම මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වෙනවා. එවගේම අපගේ

මෙහෙයුම් සංවිධායක සුජීව් සහෝදරයාටත් ලක්ෂපතිය දකුණ කොට්ඨාශයේ නෙත්මාල් සහෝදරයාටත් අපේ මොරටුව සංවර්ධනය කිරීමට ඔබ සැමගේ සහයෝගය බලාපොරොත්තු වෙමින් මගේ කතාව අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - අමිලියන් ලිහිණි පුනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, මං හිතවත් ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් මේ සභාව තුළ සිටින නවක සහ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුනි, විපක්ෂය නියෝජනය කරමින් සිටින නවක සහ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුනි, මාධ්‍ය සහෘදයන්ගෙන්ද දයාබරයි. ප්‍රථමයෙන් අද දිනයේ දී මොරටුව මහා නගර සභාවේ අභිනව නගරාධිපති හිටපු ජ්‍යෙෂ්ඨ ජනතා විමුක්ති පෙරමුණේ සභික නියෝජිත ප්‍රදීනාන්දු මහතාට මගේ උණුසුම් සුභාශිංසනය පිරිනමන අතර උප නගරාධිපතිනි ප්‍රසංසනී වික්‍රමසිංහ මැතිණියටත් මාගේ සුභ පැතුම් පිරිනමනවා. විශේෂයෙන් කාන්තා දේශපාලනය කාන්තාවක් නියෝජනය කරමින් කාන්තාවක් උප නගරාධිපතිනියක් මුල් වරට පත්වීම ඇත්තටම නිහතමානීව ඇයට එම තනතුර ලබාදීම පිළිබඳ සතුටු වන අතර ඇයට එම කාර්යභාරය කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්ය ලැබේවා කියලා අපි එකසිතින් ප්‍රාර්ථනා කරනවා. ප්‍රථමයෙන් 2025 පළාත් පාලන මැතිවරණය අවසානයේදී නැවත වරක් මොරටුව මහා නගර සභාවට මන්ත්‍රීවරියක් ලෙස පත්වීමට ලැබීම සම්බන්ධයෙන් මං නිහතමානීව සතුටු වන අතර එම අවස්ථාව ලබාදුන් සමගි ජන බලවේගයේ පක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතාට ද මල්කාන්ති රංජිත් මද්දුම බණ්ඩාර මහතාට ද කාන්තා දේශපාලනය ගැන සෑම අවස්ථාවකම විශ්වාසය තැබූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතාට ද මොරටුව සමගි ජන බලවේග පක්ෂයේ හිටපු පළාත් සභා මන්ත්‍රී සහ අපගේ නායක සේනක දමියන්ත පිල්ලේ මහතාට ද සමගි ජන බලවේගයෙන් පළාත් පාලන මැතිවරණයට තරඟ වැදුනු සියලු දෙනාට ද සමගි ජන බල වේගය වෙනුවෙන් අප පක්ෂය වෙනුවෙන් අප වෙනුවෙන් ඡන්ද පල කල ආදරණීය ජනතාව වෙනුවෙන්ද මාගේ ස්තූතිය පුද කරනවා. හැමදාම ජනතාව වෙනුවෙන් බිම් මට්ටමේ අවංක දේශපාලනයක් කරපු අපි ජනතාව වෙනුවෙන් හැම අවස්ථාවකදීම ජනතාවගේ දුකේදීත් සැපේදීත් පක්ෂ පාට භේද නොසලකා සේවය කරපු අපිව නැවත වරක් විපක්ෂයේ අසුනට වාඩිකිරීම සම්බන්ධයෙන් ඇත්තටම අපි කණගාටු වුනත් සෑම දේශපාලන අවස්ථාවකදීම අපගේ දේශපාලන ව්‍යාපාරය තුළ ඇත්ත ප්‍රකාශ කරමින් දේශපාලනය තුළ ජනතාවට බොරු කියා බලය නොලැබීම පිළිබඳ අපි නිහතමානීව ආඩම්බර වෙනවා.

ගරු නගරාධිපතිතුමනි,මොරටුව ගත්තොත් මොරටුව කියන්නේ පුරෝගාමීත්වයේ නගරයක්. එක් අතකින් බොල්ගොඩ ගඟ ද තව පැත්තකින් මුහුදෙන් ද වට වූ ජන ගහනය 160,000ක් පමණ වර්ග කිලෝමීටර් 23.2ක සියලුම ජාති ආගම් භේද නියෝජනය කරමින් සුවිශේෂී අභිමානවත් වටිනාකමක් ඇති කලාවෙන් හා ක්‍රීඩාවෙන් ඉහළ නමක් දැරූ තැනක් තමයි මොරටුව කියන්නේ. හැබැයි අද ජන ගහනය අධික තැනක් මොරටුව. අනවසර ඉදිකිරීම් වලින් ගහනය වුන තැනක් මොරටුව. අක්‍රමික සංවර්ධනය තුලින් ඉඩම් වල වටිනාකම නැති වෙමින් යන තැනක් මොරටුව.මොරටුව ප්‍රදේශයේ ආර්ථික වටිනාකම අපි මේ වෙනකොටවත් හඳුනාගෙන නැහැ. අද මොරටුව ගත්තොත් මැද කොළඹින් පස්සේ ලංකාවේ ඉහළ දරිද්‍රතාවයෙන් පෙළෙන තැන තමයි. දැඩි ලෙස වාහන තදබදයක් තියෙන, නිවාස අර්බුධයක් තියෙන තැනක් මොරටුව. පසුගිය වසර කිහිපය තුළ කිසිදු නිවාස ව්‍යාපෘතියක් සිදුවෙලා නැහැ. දකුණු කලාපය ගත්තොත් වැස්සක් වැස්සොත් යට වෙනවා. මත්ද්‍රව්‍ය වලින් ගහනය වුන නගරයක්. මෙවැනි නගරයක මුල් පුරවැසියා තමයි නගරාධිපති ඔබතුමා. ඔබතුමා හමුවේ වූ විශාල අභියෝගයක් තියෙනවා. අද මම මෙම කතාව කිරීමට පෙර ඔබතුමා විසින් පසුගිය සභාවේ වාරයේ දී කරන ලද හැන්සාඩ් වාර්තා සමූහයක් මම විසින් පරිශීලනය කරනු ලැබුවා. එම හැන්සාඩ් වාර්තා වලදී ඔබ අසූරු ලෙස මොරටුව සහ මොරටුවේ දේවල් පිළිබඳව ඔබ සතු දැනුම විශාල වශයෙන් මේ සභාවේදී ප්‍රකාශ කර තිබෙනවා. ඉන් යමක් ප්‍රකාශ කරලා වසර ගණනාවක් තුළ විපක්ෂයේ සිටිමින් එවක ආණ්ඩු පක්ෂයට ඔබතුමා දැඩි ලෙස විවේචන කළා. ඔබතුමා දැඩි ලෙස වාග් ප්‍රහාර එල්ල කිරීම ආණ්ඩුවට සිදුකලා. ඔබතුමා මෙම නගර සභාවේ නිලධාරීන් අතින් යම් යම් සුළු වැරදීන් වුනත් ඔබතුමා නගර සභාව තුල නගර සභාව දෙවනත් කරලා ඒ වැරදි පෙන්නලා දෙනවා. පසුගිය පාලන සමයේ දූෂණය නගර සභාව තුල සිද්ධ වුනා වංචා දූෂණ අක්‍රමිකතා පිළිබඳව පමණක් නොවෙයි අයවැය වාර්තා වල පැහැදිලි නැවතුනු සම්බන්ධයෙන් ඔබතුමා ප්‍රකාශ කළා. විගණන

වාර්තා වලින් මතු වූ කරුණු සම්බන්ධයෙන් මෙම නගර සභාව තුළ මිලියන 700කට අධික වරිපනම් බදු එකතු නොකිරීම සම්බන්ධයෙන් හඬ නැගූ පුද්ගලයෙක් ඔබතුමා. ඔබතුමාගේ වාග් ප්‍රහාරවලින් මෙම නගර සභාවේ සිටි මන්ත්‍රීවරු මන්ත්‍රීවරියන් නිලධාරීන් හැම කෙනෙක්වම ඔබතුමා චෝදනා කළා. ඒ චෝදනාවන නිවැරදි කිරීමට ඔබතුමාට අවස්ථාවක් ලැබිලා තියෙනවා. මෙය දෛවය විසින් ලබාදුන්නා ද මහජනතාව විසින් ලබා දුන්නා ද එය ඔබතුමාට ලැබිලා තියෙන මහඟු අවස්ථාවක්. අපි ඉංග්‍රීසියෙන් කියන්නේ දිස් ඉස් අ ඔපර්චූනිටි වන්ස් ඉන් අ ලයිෆ් ටයිම් කියලා. එය කිරීමට ඔබතුමාට ධෛර්ය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ලාගේ දේශපාලන ව්‍යාපාරය ජාතික ජන බලවේගය සමස්ත දේශපාලන යාන්ත්‍රණයම හොරු බවට පත් කළා. විපක්ෂයේ අපි ජනතාවගේ එකද රුපියලක්වත් හොරකම් නොකරපු අපිවත් දේශපාලන ධාරාවෙන් ප්‍රතික්ෂේප කළා. ඔබතුමන්ලා දැනට ශ්‍රී ලංකාවේ තුළ එම ඩීල් දේශපාලනය පැත්තකට දාලා ඔබතුමන්ලා නගර සභා පිහිටුවන කොටත් කිසිම ඩීල් එකක් නොදා ආණ්ඩු කරනවා කියලා ඔබතුමන්ලා ඒ පුරාණ සුපිරිසිදු දේශපාලනය මිහි පොළොවේ යථාර්ථයක් කරන බවට ජනතාවට ප්‍රකාශ කරලා තියෙනවා. දැන් එම මැතිවරණ ව්‍යාපාරය කියපු ඔබතුමන්ලාගේ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන මැතිවරණ ප්‍රකාශයේ කියපු දේවල් යථාර්ථයක් කිරීමට අවස්ථාව ලැබිලා තියෙනවා. එහෙනාව අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමා මොරටුව නගර සභාව තුළ කිසිදු අක්‍රමිකතාවක් නැතිව කිසිදු වංචාවක් කිසිදු ඩීල් එකක් නොදමා මෙම නගර සභාව පිරිසිදු පාලනයක් යටතේ ඉදිරියට ගෙන යයි කියලා අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. එදා මොරටුව නගර සභාවේ නිලධාරී වැටුප පිළිබඳව නිලධාරීන්ගේ දූෂණය හා වංචාව පිළිබඳව ඔබතුමා දිගින් දිගටම චෝදනා කළා. තවමත් ඔවුන් මෙම නගර සභාව තුළ ඉන්නවා. අපි අහන්න කැමති එම නිලධාරීන් වෙනුවෙන් ඔබතුමා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? ඔබතුමා ඔවුන් තවදුරටත් ආරක්ෂා කරනවා ද? නැත්නම් ඔවුන් වෙනුවෙන් යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා ද කියලා අපි බලාගෙන ඉන්නවා නගරාධිපතිතුමනි. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා අනුර කුමාර දිසානායක මහතා කිව්වා මාලිමාවෙන් බලය පිහිටුවන සභාවල් වලට ඇස් පියාගෙන මුදල් අනුමත කරනවා කියලා. අපි බලාගෙන ඉන්නවා නගරාධිපතිතුමනි ඔබතුමාගේ පාලනය යටතේ මධ්‍යම රජය කරනා මොරටුවට කොපමණ මුදලක් ගේනවද කියලා අපි බලාගෙන ඉන්නවා. දැන් ඔබලාට නිදහසට කරුණු කීමට හැකියාවක් නැහැ. විධායකයත් ඔබලාගේ ව්‍යවස්ථාදායකයත් ඔබලාගේ තුනෙන් දෙකක බලයත් ඔබලාගේ පළාත් පාලනයත් ඔබලාගේ එහෙනම් මෙතෙක් කල් මොරටුව නගරයට සිද්ධ වෙච්ච දැවැන්තම සංවර්ධනය කිරීමට ඔබතුමන්ලාට දැන් කිසිදු බාධාවක් නැහැ. අපි කියනවා ඔබ ඇත්තලා එහෙ කළයුතුයි. අපි මේ නගර සභාවේ ඉන්නකොට නගර සභාවේ බජට් එකක් දැම්මා බිලියන 3.3 ක. අපි බලාපොරොත්තු වෙනවා ඔබ ඊට වඩා වැඩි දැවැන්ත සංවර්ධනයක් කරයි කියලා. එදා ඉරාන් වික්‍රමරත්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මොරටුව සංවර්ධනයට විශාල ව්‍යාපෘති ගණනාවක් කළා. අපි අර මධ්‍යම බස් නැවතුම්පොල හදලා මාදිලි මධ්‍යම බස්නැවතුම්පොල නිර්මාණය කිරීමට විශාල පරිශ්‍රමයක් දැරුවා. නමුත් ඒ අවස්ථාවේ රජය තිබ්බත්. අපිට පළාත් පාලන ආයතනය තිබ්බේ නැහැ. අපි ඒ වගේ ප්‍රශ්න ගණනාවකට මුහුණ දුන්නා

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහ නගර සභාවේ තියෙන වෙළෙඳ අපි හැමදාම කතා කරලා තියෙනවා ඔබතුමන් කතා කරලා තියෙනවා. ඒක හදන්න සල්ලි නැතිවට අපිට ඒක හදන්න බැරි වෙලා තියෙනවා. මෙතන සුපර් මාර්කට් එකට ගියොත් ඒක මොරටුව සිටි එකේ තියෙන ලැන්ඩ් මාර්ක් එක අතින් ඉතා වටිනාකමක් ඇති ගොඩනැගිල්ලක්. නමුත් එය අද වනවිට කරාඳියට වැටිලා. එතන එක කඩයක්වත් පුද්ගලයෙක් ගන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමාගේ පරිපාලනය යටතේ ඒ සුපර් මාර්කට් එක අලුතින් නිර්මාණය කිරීමට මධ්‍යම රජයෙන් අවශ්‍ය මුදල් ඔබතුමා ගෙනෙයි කියලා අපි බලාගෙන ඉන්නවා. අපි හැමදාම නගරාධිපතිතුමනි වංචාවට දූෂණයට හඬ නැගුවා. පසුගිය පාලන සමය තුළ ඔබතුමා ප්‍රකාශ කර සිටියා ශ්‍රී ලංකා ඉතිහාසයේ දූෂිතම නගර සභාව කියලා අපි බලාගෙන ඉන්නවා ඒ දූෂිත නගර සභාවටම විරුද්ධව ඔබතුමා එදා සිදුවුන දූෂණ වංචා වලට ඔබතුමා කුමක් කරනවාද කියලා? ඔබතුමා නඩු කීයක් දානවද? ඒ වත්කම් සම්බන්ධයෙන් විමර්ශනය කරනවාද? අල්ලස් කොමිෂමට ගිහිල්ලා පැමිණිලි දානවද ඒ ෆයිල් අරගෙන නැවත

විමර්ශනය කරනවද වංචාව දූෂණයට විරුද්ධව ඒ විනිවිද භාවය, පාරදෘශ්‍ය භාවය කිරීමට ඔබතුමා මොනවද්ද කරන්නේ කියලා අපි බලාගෙන ඉන්නවා.

ගරු නගරාධිපතිතුමනි, නගරාධිපතිතුමනි, ඔබතුමන්ලාගේ රජයේ ප්‍රතිපත්තියක් තමයි ඩිජිටල්කරණය. ඔබතුමා මේ නගර සභාවේ පරිපාලනයට තාක්ෂණය හඳුන්වා දෙනවාද කියලා අපි බලා සිටිනවා. මේ නගර සභාවේ ගෙවීම් කිරීමට ගව් පේ ඇප් එක ඉන්ට්‍රඩියුස් කරලා ඒ ගෙවීම් පාරදෘශ්‍ය භාවයකින් සිදු වෙනවාද නිලධාරීන් අතින් මුදල් එකාට මෙකාට සංසරණය නොවී නමවා හරියට ක්‍රමවේදයක් යටතේ සිදු වෙනවාද අපි බලාගෙන ඉන්නවා.

ගරු නගරාධිපතිතුමනි, ප්ලෑන් පාස් කරන විදිය පිළිබඳ දෙයක්ම විනිවිදභාවයකින් යුතුව සිදු වෙනවාද නීති රාමුව ඇතුලේ සෑම දෙයක්ම සිදු වෙනවාද කියලා අපි බලාගෙන ඉන්නවා. නගරාධිපතිතුමනි කුහක විපක්ෂයක් වීමට අපිට කිසිම අවශ්‍යතාවයක් නැහැ. සාධනීය දේවල් වෙනුවෙන් අසාධාරණයට හඬ නැගීමටත් ඔබතුමන්ලාට ලබා දුන් තුනෙන් දෙකක ජනවරම තුලින් ඔබතුමන්ලාගේ රජය සංවර්ධනය තරහා ඔබතුමාගෙන් මොරටුව සංවර්ධනය කර ගැනීම විපක්ෂයේ අපේ බලාපොරොත්තුව. අවසාන වශයෙන් කියනවානම් ඔබ මේ අවුරුදු 04 ඉවර වෙනකොට ඔබතුමා පාස් වෙන්න ඕන, ඔබතුමා ෆේල් වෙන්න බැහැ. ඔබතුමා ෆේල් වුණොත් මොරටුව නගරය හා මොරටුව ජනතාව ෆේල් වෙනවා. අපිට අවශ්‍ය ඔබතුමා ඒ ජනතාව දිනවීමට හා මොරටුව නගරය දිනවීමට. අපි පක්ෂ පාට නොබලා අපි විපක්ෂයේ ඉදන් සහයෝගය ලබා දෙනවා. අපි කරන ඉල්ලීම් ද සලකා බලා ජනතාවට වගකියන, විනිවිදභාවයෙන් යුතු තාක්ෂණය පදනම් කරගෙන අල්ලස හා දූෂණයෙන් තොරව මෙම නගරය පුරෝගාමීත්වයේ නගරයක් බවට පත්කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අවසාන වශයෙන් නගරාධිපතිතුමනි, ඔබතුමා මේ කමිටු පත් කිරීම සම්බන්ධයෙන් 26.3 වගන්තියේ සුජිත් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට එම වගන්තියේ සඳහන් කරන ආකාරයට මෙම කමිටු 08 ට මන්ත්‍රීවරුන්වරුන් සමිතයන් 48ක් පළමුව පත් කරලා ඉන් අනතුරුව තමයි මන්ත්‍රීවරයෙකුට දෙවන කමිටුවකට පත්කිරීමට හැකියාවක් තියෙන්නේ ඒක තමයි 26.3 වගන්තියේ පැහැදිලිව සඳහන් වෙන්නේ ඉතින් ඔබතුමා පළවෙනි දවසෙම ඔබතුමාව දැනුවත් කිරීමක් කළා. නමුත් ඔබතුමා ඒ පිළිබඳව සලකා බලන්නේ නැතිව කටයුතු කිරීම සම්බන්ධයෙනුත් අපි කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කැමතියි. එසේ කියමින් නගරාධිපතිතුමනි, මාගේ හෘදයාංගම සුභ පැතුම් හා ආශිර්වාදය ඔබතුමාට හා ජාතික ජනබල වේගයේ ආණ්ඩු පක්ෂය වෙත පුද කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.එස්. සුසන්ත ඉරෝෂණ ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමිය, ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් සහ විපක්ෂයේ සියලු දෙනාගෙන් අවසරයි. නාගරික කොමසාරිස් තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මුලින් මොරටුවැල්ල දකුණ හා බටහිර ජන්දය ලබා දුන් හැමට ස්තූතිය පළ කරනවා මාව පත් කිරීම ගැන. ගරු සමන්ත මන්ත්‍රීතුමන්ගෙන් හා නවක මන්ත්‍රී නිළිකා මහත්මියගෙන් ඉල්ලීමක් කරනවා අපි තුන්දෙනාම එකම කොට්ඨාශයක ඉන්නේ අපි තුන්දෙනාම එකතු වෙලා අපේ ඒ කොට්ඨාශ දෙක සංවර්ධනය කිරීම සඳහා සහයෝගයෙන් වැඩ කරමු කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මිත්ති ඔෂිනා බිස්තුර් මහත්මිය</u>

අභිනවයෙන් තේරී පත්වූ ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, ඔබ තුමියට උපහාර සතුට ප්‍රකාශ කරනවා මේ තනතුරට කාන්තාවක් පත් කිරීම සම්බන්ධව අපගේ ඉමහත් සතුට පළ කරනවා. ඒ වගේම ගරු විපක්ෂ නායකතුමනි, මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි අපේ නාගරික කොමසාරිස්තුමිය, නාගරික ලේකම්තුමා හා අනෙකුත් නිලධාරී මඬුල්ලටත් මාධ්‍ය වේදීන් ඇතුලු සියලු දෙනාටත්. මේ සභාවේ සිටින අනෙකුත් සියලු දෙනාගෙන් අවසරයි. මේ ගෞරවනීය සභාවේ මුස්ලිම් ජනතාව ඇතුලු සියලුම ජාතීන් නියෝජනය කිරීමේ අභිමානය මට ලබාදුන් මගේ නායක ජ්‍යෙෂ්ඨ හිටපු ජනපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, කොළඹ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක ගරු සාගල රත්නායක මැතිතුමා ඇතුළු මොරටුව

එක්සත් ජාතික පක්ෂයේ බලය ලත් නියෝජිත හර්ෂ කල්පදීරා මහතාටත් මගේ ගෞරවය මේ අවස්ථාවේ පුදකර සිටිනවා. ඒ වගේම මා නියෝජනය කරන එගොඩ උයන කොට්ඨාසයේ ජනතාවට මා කෙරෙහි තිබූ විශ්වාසයට මගේ ස්තූතිය පුදකරනවා. මහජන නියෝජිතයෙක් වශයෙන් එම කොට්ඨාසයට සේවය කිරීමට ලැබීම මට මහත් ගෞරවයක්. ගරු නගරාධිපතිතුමනි, එගොඩ උයන ජනතාවට පොදු ප්‍රශ්න රැසක් තියෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබේ අවධානය යොමු කිරීම පිළිබඳ මම අගය කරනවා. ඒ කොට්ඨාසයේම මොරටුව ආසනයේ බහුලව වෙසෙන මුස්ලිම් ජනතාව ප්‍රජාව නියෝජනය වෙන්නේ ඔබතුමන් හා මා නියෝජනය කළ එම කොට්ඨාසයේ. එතුමන්ලාගේ පොදු ප්‍රශ්න සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටිනවා. අපේ දේශපාලනයේ නවීනස වින්නන් දේශපාලන භේදයකින් තොරව එකමුතු වී කටයුතු කිරීමයි. එවිට ව්‍යාපෘති පමණක් නොව ජනතාවගේ විශ්වාසයත් දිනාගත හැකි වෙන්නේ. එවිට අපේ ගමත්, මොරටුවත් දියුණු වෙනවා. ඒ වෙනසට මා සූදානම්, ඔබ සූදානම් ද?

<u>මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා</u>

අභිනව ගරු නගරාධිපති නිශාන්ත ප්‍රනාන්දු සහෝදරයාගෙන් ද, උප නගරාධිපතිනී ප්‍රශාන්ති සහෝදරියගෙන් සහ පත් වූ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. එසේම නගර සභා නිලධාරී මණ්ඩලයෙන් සහ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා මගේ රාවතාවත්ත නැගෙනහිර කොට්ඨාසයේ ඡන්ද දායකයින්ට. ඡන්ද 1750කට වැඩි ඡන්ද ප්‍රමාණයකින් මාව මේ තනතුරට එවපු ඒ කොට්ඨාසයේ ජනතාවටත් ඒ වගේම මට හයියක් වෙලා මාව දිරිමත් කරපු මගේ කොට්ඨාසයේ ක්‍රියාකාරීන් සැමටත් ස්තූතිවන්ත වෙන්න ඕන. ඒ අතරම මාව මේ ව්‍යාපාරයට හැඳින්වූ තිලක් සහෝදරයා මගේ යාබද ආසනයේ ම ඉන්නවා. එතුමාටත් මට සතුටක්, ඔබතුමාටත් බොහෝම ස්තූතියි. දැන් අපි මැතිවරණ කාලයේ දී කරපු දේශපාලනය ඉවරයි. දැන් එකතු වෙලා මොරටුව හදමු. මගේ කොට්ඨාසයේ මම ඇතුළුව පදිංචි මන්ත්‍රීවරු ඉන්නවා පස්දෙනෙක්. ඉතින් අපි කට්ටිය එකතු වීනම් අපේ කොට්ඨාසය මොරටුවේ උඩටම ගේන්න පුළුවන්. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියලුම කොට්ඨාස එකතු වෙලා මුළු මොරටුව හොඳ තැනකට ගේන්න පුළුවන් බව මා ප්‍රකාශ කරනවා.

මහා නග<u>ර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම පුරෝගාමීත්වයේ නගරයේ අභිනවයෙන් පත්වූ ගරු නගරාධිපතිතුමා, උප නගරාධිපතිනිය ඇතුළු අපේ සියලුම මන්ත්‍රීවරුන්ට සුභාශිංසනය පුද කරනවා. විශේෂයෙන්ම කාන්තා දේශපාලනය තුළ ඉන්න කාන්තාවක් විදියට කාන්තාවක් අපේ නගර සභාවේ ප්‍රධාන පුටුවක් ලැබීම පිළිබඳ සතුටු වෙනවා. විශේෂයෙන්ම කාන්තාවක් එතනට ගෙන ඒමට ප්‍රගතිශීලීත්වය දැක්වූ ඔබට ස්තූතිය පුද කරනවා. කාන්තා දේශපාලනය කියන්නේ ඉතාම අපහසු ගමනක්. විශේෂයෙන්ම මම නියෝජනය කරන සමගි ජන බලවේග පක්ෂයේ මොරටුව ආසනයේ ප්‍රධාන සංවිධායක, විපක්ෂ නායක සේනක දමියන්ත සිල්වා මැතිතුමාට මාගේ ස්තූතිය පුද කරනවා පක්ෂයක් විදියට කණ්ඩායමක් විදියට අපිව මෙහෙයවමින් කණ්ඩායමක් ම ඉදිරියට ගෙන යමින් අද අපි ඉහළම ස්ථානය කරා රැගෙන ඒම සම්බන්ධවද. සමගි ජන බලවේග පක්ෂයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා සහ එම මැතිණිය ඒ වගේම පක්ෂයේ මහා ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර මහතාට සහ තුෂාර ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත් මේ මොහොතේදී මතක් කරනවා අපිට මේ ගමන ඒමට ඔවුන් ලබාදුන් ආශිර්වාදයට හා අනුග්‍රහයට පිළිබඳ ස්තූතිවන්ත වෙනවා. මාව මේ ස්ථානයට රැගෙන ඒමට කටයුතු කළ මොරටුමුල්ල කොට්ඨාසයේ මගේ ආදරණීය ජනතාව මතක් කරනවා. ඡන්ද 910ක් ලබා ගනිමින් තමයි මාව මේ ස්ථානයට රැගෙන ආවේ. ඡන්දය ලබාදුන් නොදුන් සියලු දෙනාටත් මාගේ සේවය මොරටුව මහා නගර සභාව තුළින් ඉටු කරන්න මම බලාපොරොත්තු වෙනවා. දේශපාලන ගමනට මට ශක්තියක් වුන රොෂාන් කුරේ මගේ සහෝදරයාටත් ස්තූතිය පුදකරනවා. මොරටුමුල්ල කොට්ඨාසයේ සංවිධායක කණ්ඩායමට ප්‍රශංසා කරනවා ඔවුන් මා සමඟ හිටියා ඔවුන් සියලු දෙනාටම මේ මොහොතේදී මාගේ ස්තූතිය හා ගෞරවය පුද කරන්න කැමතියි. අද දවස තුළ මංගල සභා වාරය තුළ අපි දැක්කා ඔබතුමා තුළ ප්‍රගතිශීලී භාවයක් අපි බලාපොරොත්තු වූ දේය යම්කිසි කාලයක අපි අරගල කළා අපි කෑගැහුවා කාලගෝට්ටියක් කළා.නමුත් මම සතුටු වෙනවා මන්ත්‍රීවරයක් ලෙස

ප්‍රතිශීලිත්වය, හැමෝටම සමානාත්මතාවය කියන දේ ඒ වචනෙට මම හරි ප්‍රියයි මොකද අපි සමානාත්මතාවය දක්කිලෙන් නැහැ දේශපාලනය තුළ. නමුත් නගර සංවර්ධනය තුළ නගරය දියුණු කිරීම තුළ අපි කැමති සහයෝගයෙන් වැඩ කරන්න අපි එය අද දවස තුල ඔබතුමා තුලින් දැක්කා. ඉතින් අපි කැමති කටයුතු කරන්න අපි කැමති ඉස්සරහට යන්න පක්ෂයක් විදියටත් ඔබතුමිලාගේ පක්ෂය තුලින් ඔබතුමාලාගේ ලැබෙන සහාය තුලින් එය මොරටුවට යම්කිසි සංවර්ධනයක් වෙනවානම් අපි කැමති ඔබතුමන්ලාට නිරන්තරයෙන් සහයෝගය පල කරන්න කැමති පක්ෂයක් විදියටත් කණ්ඩායමක් විදියටත්. ඒ සහයෝගය ඔබතුමාට ලබා දෙන්න කැමති. ඒ වගේම කාන්තා දේශපාලනයේ වසර 05ක් තුළ මේ සභාවේ ඉන්න කාන්තාවක් විදියටත් කැහැකලා කාන්තා කමිටුවක් හදන්න කොච්චර අරගල කලාද හිටපු නගරාධිපතිවරයා මගේ යෝජනාව තුන් සැරයක් ඩස්ට්බින් එකට දැම්මා. නමුත් මම අද ආඩම්බර වෙනවා අපේ කාන්තා කමිටුව කියන එක අපි සමස්ත ලංකාව පුරාම අපි යෝජනා ඉදිරිපත් කරලා අද ඉෂ්ඨ කරගත්ත යෝජනාවක්. අපි කොච්චරයන් හරි සටනක් තියනවා නමුත් කාන්තා හා ළමා පමණක් නොවෙයි වැඩිහිටියන්ටත් අපෙන් යම් දෙයක් විය යුතුයි. ජීවිතේ සැඳෑ සමය ගෙවන දෙමාපියන්ව අපි හැමෝම ඔතන කියාගත යුතුයි. අපි අද මෙතන ඉන්නේ මම මෙතන ඉන්නේ ඔබතුමා මෙතන ඉන්නේ අපේ දෙමාපියන් අපිව හදලා සලකුණක් කරපු නිසා. හැම වෙලේම අපි භෞතික සංවර්ධනය වගේම මානව සංවර්ධනය හා මානව සංහතියේ දියුණුව හා වර්ධනය උදෙසා කටයුතු කරන්න ඕන කියන එක විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කැමති. මොකද දෙමාපියන් දරුවන් කාන්තාවන් කියන කැටගරි එක ඇතුලේ අපි අපේ කාන්තා කමිටුව ඇල ක්‍රියාත්මක වෙන්න පුළුවන්නම් එය වඩාත් හොඳයි. ඉන් පිටුපසේ අවශ්‍යතා හඳුනාගෙන ක්‍රියාත්මක කරමු කියන දෙයක් මේ වෙලාවේ යෝජනා කරනවා. ඔබතුමා අභිමතාර්ථයන් ඉටුකර ගන්නට ක්‍රියාත්මක වන මේ ගමන සාර්ථකත්වය, නගර සංවර්ධනය, ජනතාවගේ ජීවන ස්ථාවරත්වය ගොඩනගන්න හැකි ඔවුන්ගේ වෘත්තීය පැත්තෙන් හරි ඔවුන්ගේ ජීවන රටාවෙන් හරි ඔවුන්ගේ සමාජ මට්ටමින් හරි ඔවුන්ට කරන්න පුළුවන් සියලු යුතුකම් මේ අදාළ කමිටු 09 තුලට අලුතින් එන හැම යෝජනාවක් ම ඔබතුමාගේ අවධානයට යොමු කරලා සියලු සඳහාටම සමානාත්මතාවයේ අවස්ථාව ලබා දෙමින් මේ ගමනේ ඉදිරියට යන්න ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. නවක මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඔබතුමා කිසියම් පුහුණුවක් ලබා දෙන ලෙස අපි යෝජනා කළා ඒ පුහුණුව අනිවාර්යයෙන්ම ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. මොරටුව නගරයේ උන්නතිය වෙනුවෙන් අපි කටයුතු කරමු. සියලු සැමටම ජය ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අනුගිය පලාත් පාලන මැතිවරණයේදී නාගරික මන්ත්‍රීවරියක් ලෙස මොරටුව මහා නගර සභාවේ නියෝජනය කිරීම සඳහා මා තෝරා මගේ පක්ෂයේ ප්‍රතිපත්තිය පිළිබඳව විශ්වාසය තියලා ජාතික ජන බලවේගය වෙත ඡන්දය ලබා දුන් අපගේ මෝල්පේ කොට්ඨාසයේ සියලුම සහෝදර සහෝදරියන්ට මා මේ අවස්ථාවේදී ස්තූති වන්ත වෙනවා මට අද විශේෂ දවසක් මොකද අවුරුදු 31 ක ගුරු ජීවිතයට පසුපේ අද දවසේ ජාතික ජන බලවේගය එක්ක බැඳිලා මොරටුව නගරයේ මිනිස්සුන්ගේ සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීමට ලැබුණු මහඟු අවස්ථාවක්. මේ එළඹීලා තියෙන පළාත් පාලන යුග කාලයේදී මොරටුවේ සියලුම ජනතාවට සෞභාග්‍යත් රටක් ලස්සන ජීවිතයක් උරුම කරලා දීම වෙනුවෙන් අපිට විශාල වැඩ කොටසක් කරන්න සිද්ධ වෙලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙන සංවර්ධන කටයුතු වලදී ගරු නගරාධිපතිතුමා ඇතුළු මාගේ කණ්ඩායමට නාගරික මන්ත්‍රීවරියක් ලෙස උපරිම සහයෝගය ලබා දෙන බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමතියි. මෝල්පේ කොට්ඨාසයේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී මා වෙත ඡන්දය දුන්, නොදුන් සියලුම මෝල්පේ කොට්ඨාසයේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහාත් සාමය ගැටලු සඳහාත් එකතිනින් කැප වී වැඩ කිරීමට බැඳී සිටිනවා. මෝල්පේ කොට්ඨාසයේ වෙරළ ගතවත් ද ප්‍රවාහන මාර්ගයවත් නැති බිම් කඩක් තියෙනවා ම: කියන්නේ එකට අපි කවුරුත් කියන්නේ සමරකෝන් ඉඩම කියලා. එහි ජීවත් වන මිනිස්සු ගැන බලනකොට අපිට ලොකු කණගාටුවක් ඇති වෙනවා ඒ මිනිස්සු ඉන්න දුෂ්කරතාව දැක්කාම. ඉතා කුඩා වැසි තත්වයක් ඇති වුනත් ඒ ජීවිත ඉතා ඛේදවාචකයක් විදියටයි තියෙන්නේ. මිදුලත් කුණු වතුර ගලාගෙන යන කානුවත් අහදන්ත වෙන්කරලා අඳුනගන්න බැහැ. ඒ ගෙවල් ඇතුලේ ඉන්නවා වියෝවෘද්ධ අය, දයාබර වැඩිවිට අය කුඩා දරුවෝ. සමහර වෙලාවට මට කණගාටුයි ලස්සන මල් වගේ ඉන්න දරුවෝ දැක්කාම හිතෙනවා මේ ළමයි

කොහොමද මෙහෙම ජීවත් වෙන්නේ කියලා. අපිට මෙය බැහැර කරන්න බැහැ. මේක අභියෝගයක් අපට. අපි මේවට එකතු වෙලා මුහුණ දෙන්න ඕන. පසුගිය දේශපාලන කටයුතු සඳහා මේ ස්ථානයට ඇතුලු වූ අපෙන් එයාලා බඩුමළු කිසි දෙයක් ඉල්ලුවේ නැහැ. ඉල්ලුවේ මෙතන ජීවත් වෙන්න පුළුවන් වෙන විදියට වතුර ගලාගෙන යන්න කාණුව හදලා දෙන්න කියලා විතරයි. එයාලා නගර සභාවෙන් එහෙම දෙයක් ඉල්ලුවේ එයාලගේ හදවත හරි පොහොසත්. මෙහි පැමිණ සිටින ඔබ සියලු දෙනාටත් මේ අභියෝගය ජය ගැනීම සඳහා අපට අවස්ථාවක් උදාකර ගන්න පුළුවන් කියලා හිතන්න ඕන. ඒ වගේම මෙම සභාව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගෙනුත්, නාගරික කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරී මහත්මීන්ගෙනුත් මොරටු පුරවරය සංවර්ධනය කරලා මහජනතාවගේ බදු මුදල් ලබා ගන්නා මහා නගර සභාව එම ජනතාවගේ අභිලාෂ ඉටුකිරීම සඳහා අප සමඟ අත්වැල් බැදගන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, ඒ වගේම අද සභාවට අභිනවයෙන් තේරී පත්වූ මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරී තුමියන් හා තුමන්ලාගෙන් අවසරයි. මගේ මැතිවරණ ක්‍රියාවලියේදී උදව් උපකාර කල සියලු දෙනාටම ස්තුතියි කිරීමට අවස්ථාවක් කර ගන්නවා. මාගේ පක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමන්ට මොරටුව ආසන සංවිධායක ගරු විපක්ෂ නායක සේනක දමයන්ත සිල්වා මැතිතුමාට මා හට ඒ නාම යෝජනා ලබා දීමේදී ඒ තිබුණ ගැටළුකාරී තත්වයන් සහ අභියෝග මඟ හැරවාගෙන මාහට මේ අවස්ථාව ලබා දීම ගැන. ඉඳිබැද්ද සුධර්මරත්නාරාම විහාරස්ථානයේ සියලුම හිමිවරුන් හට ද ඉඳිබැද්ද ශුද්ධ වූ බිලාසියුස් දේවස්ථානයේ ගරු ප්‍රධාන පියතුමා ඇතුළු සහයක පියතුමන්ලා හට හා කනායා සොහොයුරියන් හට මා ස්තුතිවන්ත වෙනවා මාහට ඉදිරියට යෑමට ලබාදුන් දිරිගැන්වීම පිළිබඳ. ඒ වගේම මම මතක් කරන්න ඕන මගේ පවුලේ සාමාජිකයින් සත්සර ක්‍රීඩා සාමාජයේ මා නියෝජනය කරන සියලුම සාමාජික සාමාජිකාවන්, ඉඳිබැද්ද බිලාසියුස් පල්ලියේ ත්‍රීරෝද රථ සංගමය, එක්සත් ක්‍රීඩා සමාජය ඉතාමත් ලොකු කාර්යයක් භාර්යයක් කරමින් මගේ මේ මැතිවරණ ක්‍රියාවලියේදී මට ගොඩක් සහය වුනා. මා හට මනාප 843 ක් ලබා දී ඉඳිබැද්ද නැගෙනහිර කොට්ඨාසයෙන් මා මේ සභාවට තේරී පත්කර දුන් සියලු දෙනාටත් මාහට ඡන්දය ලබා නොදුන් සියලු දෙනාට ද ස්තුතිවන්ත වෙනවා. ගරු නගරාධිපතිතුමනි, මගේ සහෝදර මන්ත්‍රීවරයෙකු ප්‍රකාශ කර සිටියා ඉඳිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගනය මේ වනවිට තිබෙන තත්ත්වය එය මේ වනවිට මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ තෝතැන්නක් බව. යහපාලන රජය විසින් එය සංවර්ධනය කළත් අපි වගේ තරුණයන්ගේ අතට එය තාම පත්වෙලා නැහැ. ඔබතුමා අද ආවත් බලාගන්න පුළුවන් එයට අත්වෙලා තියෙන ඉරණම පිළිබඳ. හරිහැටි කාණු පද්ධතියක් නොමැතිව ඒ මාර්ගයෙන් ගලා බසින ජලය ඒ ක්‍රීඩාපිටියට යනවා. මං බලාපොරොත්තු වෙනවා ඔබතුමා ඊට අවධානය යොමු කරයි කියලා. අවසාන වශයෙන් කියන්න කැමතියි. ඔබතුමන්ලා විසින් ගන්නා හොඳ සැම තීරණයකදීම කණ්ඩායමක් වශයෙන් අපි උපරිම සහයෝගය ලබා දීමටත් ගන්නා අහිතකර තීරණ වලදී විපක්ෂයක් වශයෙන් අපි එරෙහිවීමටත් කටයුතු කරන අතර සභාවට පත්වූ සියලු දෙනාටම උණුසුම් සුභ පැතුම් පල කරමින් මා නිහඬ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, උප නගරාධිපතිතුමියනි,පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමියනි, ලේකම්තුමනි, සියලුම නිලධාරී මහත්වරුනි,සේවක මහත්ම මහත්මීණි, මම නියෝජනය කරන්නේ කටුකුරුන්ද දකුණ කොට්ඨාශයේ සියලුම ජනතාව නියෝජනය කරමින් මා මෙම සභාවට පැමිණියේ. අපේ දේශපාලන ගමන ගැන බැලුවොත් ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් ගත කරලා තමයි අපි මෙතනට ආවේ ප්‍රදේශවාසී ජනතාවට සේවය කරන්න. අපිව මේ තැනට ගෙනාව එම ජනතාවට අපි අපගේ ප්‍රණාමය පුද කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිනියනි, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි මුලින්ම මම සුදානම් වෙන්නේ මාගේ සුභාශිංසනය මේ අවස්ථාවේ පිරිනමන්නවා. එක් අවස්ථාවක මට මතකයි මේ ගැලරියේ මා සිටින විට වර්තමාන නගරාධිපතිතුමා සභාවේ කෙළවර අසුනකින් නැගිටලා මෙතන වන සද්දයක් පැවැත්වූවා එදා මට ඒ රූව දකින්න තමයි වුණේ නැහැ. යෙදවමයේ සරදයක් හැටියට මං හිතන්නේ අඩු තැනකින් ඇවිත් ඒ කියන්නේ ඉතාමත් පුංචි මහ පොළොවෙන් මතුවෙලා මේ වගේ විශාල තැනකට ආපු ඔබතුමා ලොකු ජයග්‍රහණයක් ලබලා තියෙනවා. ඔබතුමා උඩුගං බලා පීනා ආපු ගමනක් අවුරුදු 29ක් විපක්ෂයේ ඉඳලා මේ වගේ තැනකට ඇවිල්ලා ඉතාමත් සතුටු විය හැකි කාරණාවක්. ඒ වගේම කොමසාරිස්තුමිය පිළිබඳ වචනයක් කියන්නට ඕන මං හිතන්නේ මේ ගරු සභාව නොවැති අවස්ථාවක අපි කවුද මොනවද කරන්නේ කියලා හොයන්නේ බලන්නේ නැතුව එතුමියගේ කාර්ය මණ්ඩලයට භාර දුන් ලිපි සඳහා කටයුතු කළා. අතුලානේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ විශාල සහයෝගයක් ලබා දුන්නා එම ප්‍රතිඵලයක් විදියට තමයි අපි අද මෙතන ඉන්නේ. ඒ වගේම ස්තූතිවන්ත වෙනවා එක්සත් ජාතික පක්ෂය නැත්නම් අද මම මෙතන නැහැ. ඒ නිසා මගේ පක්ෂයේ නායක හිටපු ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, කොළඹ දිස්ත්‍රික් නායක සාගල රත්නායක මැතිතුමා එතුමා විශාල කාර්යභාරයක් කළා මාව මේ පුටුවට රැගෙන එම සඳහා. එක්සත් ජාතික පක්ෂයේ අලියා ලකුණට වැඩිම ඡන්ද ලබා ගත්තේ කැල්දමුල්ල කොට්ඨාශයේ අනුරසිරි ජයලාල් මැතිතුමා දෙවන ස්ථානය ලබා ගෙන සිටියේ මම. ගැටලුකාරී තත්ත්වයක් එතනෙත් ඇති වුනා. නමුත් ඉන්ද්‍රනීලයක් වගේ මා වෙනුවෙන් අතේ ඉඳලා මට මේ අවස්ථාව ලබාදුන් මොරටුව ප්‍රධාන සංවිධායක කවිදු කල්දේරා මැතිතුමාටත් ආදරයෙන් සිහිපත් කරනවා. පුද්ගලයෙකු හැටියට විශාල ඡන්ද ප්‍රමාණයක් ලබාදුන් අතුලාන ජනතාවට මා විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා. මගේ දයාබර බිරිඳ ඇතුළු දරුවන් හතර දෙනා විශාල ශක්තියක් වුනා මට. මම නියෝජනය කරන පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමාගේ සංකල්පය තමයි කොන්දේසි විරහිතව උපන් බිමට සේවය කිරීම. අපි විපක්ෂයේ හිටියත් හැම අවස්ථාවකම මේ නගරය සංවර්ධනය කිරීමට සහයෝගය ලබා දෙනවා. ඒ වගේමයි අතුලාන ජනතාව ගැන වචන ස්වල්පයක් කතා කරන්න ඕන. මගේ ගම අතුලාන. ඉතාමත් දුප්පත් විශාල ප්‍රශ්න රාශියක් තියෙන කොට්ඨාශයක් අපේ කොට්ඨාශයට වාසනාවට මන්ත්‍රීවරු දෙදෙනෙකු පත් වෙලා සිටිනවා. නමුත් මම හිතන්නේ අතුලානට තව මන්ත්‍රීවරු දුසිමක් හිටියත් මදි. ඒ තරමට වැඩ තියෙනවා. ඔබතුමාට විශේෂයෙන් මතක් කරනවා දේශපාලන පක්ෂ භේදයකින් තොරව ආණ්ඩු පක්ෂයේ අය එපෙන් පහළ ඉල්ලනවා අපේ පැත්තෙන් කොන්දේසි විරහිතව ඒ සහයෝගය අපි ලබා දෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා මේ කොට්ඨාස 29 න්ම අමාරුම කොට්ඨාසය තමයි අතුලාන කියන්නේ. එය නගාසිටුවන්න ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවන්න යටිතල පහසුකම් දියුණු කර ගන්නට කුඹුරු කපල ටික ඇඳ ගන්න. කාණු ටික සුද්ධ කර ගන්නට තණකොළ ටික කපාගන්න ඔබතුමාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලමින් ඔබතුමාට මේ තියෙන තත්ත්වයෙන් මේ නගරය ඉහළ තැනක තබන්නටත්. ඔබතුමාට ශක්තිය ධෛර්ය හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. ජේ. ප්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, උප නගරාධිපතිතුමියගෙන්ද කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරී මහත්ම මහත්මීන්ගෙන්ද අභිනවයෙන් පත්වූ මන්ත්‍රීවරුන්ගෙන් ද විපක්ෂයේ අසුන් ගෙන සිටින මා හිතවත් මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අපිට තම උරුම වෙලා තියෙන්නේ හොඳ නගරයක්ද නරක නගරයක්ද කියන එක අපි මේ පාරක ඇවිද්දාම මේ කාණු ටික දැක්කාම සහ අපේ දරුවන්ට ක්‍රීඩා කරන්න තිබෙන ක්‍රීඩාංගන ටික දිහා බැලුවාම ඇයි මෙච්චර කාලයක් බැලුවාම ඇයි අම්පෙණ කාලයක් වගේ හොඳ දේශපාලන වාතාවරණයක් තිබුණත් අපි වගේ දේශපාලන කණ්ඩායමක් බලයට පත් කළේ කියන කුතුහලය මා තුළ නැගෙමින් පවතිනවා. කලින් කතා කළ මන්ත්‍රීතුමිය දැඩි වාග් ප්‍රහාරයක් එල්ල කළා අපේ නගරාධිපතිතුමාගේ හැන්සාඩ් වාර්තා කටපාඩමින් කියමින් ඒ බොරු වලට සහ එතුමා ඒ දවසේ ඉදිරිපත් කළ චෝදනා වලට දැඩි වාග් ප්‍රහාරයක් එල්ල කරමින් සහ අපි දේශපාලනය කරන කාලය තුළ අපි විසින් ගෙනියන ලද බොරු ප්‍රකාශ නිසා ඔවුන්ට විපක්ෂයේ අසුන් ගැනීමට සිදුවිය හැකි ද යන

බව. ඇත්තටම මට එය අහලා දුක හිතුනා. පුදුම චිත්ත සන්තානයක් ආවා. මෙච්චර මොරටුවට වැඩ කරපු අපිට යන්න තියෙන්න හොඳ පාරවල් ටිකක් හදලා දීපු අපිට හොඳ කාණු පද්ධතියක් හදලා දීපු සැබෑ සංවර්ධනයක් තියෙන නගරයක් උරුම කරලා දීපු කණ්ඩායමක් ඇයි මේ විපක්ෂයේ තියලා තියෙන්නේ කියලා, ඉතින් ඒකට පිළිතුරු මේ ඡන්දයෙන් අපිට ලැබිලා තියෙනවා. ඔවුන් අපිට උරුම කරලා දුන්නේ කුමන වගේ නගරයක්ද කියලා හොඳටම වැටහුනා දුවිලි පිරිච්ච වටපිට බැලුවම පේනවා. මම සැමවිටම සැලසුම් සහගත දේශපාලනයක් අනුගත මගේ විශ්වාසය කියලා තියෙනවා. ඒ විශ්වාසය තුළ අපි දැක්කා අපේ ප්‍රාදේශීය සංවර්ධන කමිටු තුළ අපි සාදා කලා නගර සංවර්ධන සැලැස්මක් පිළිබඳව. ඒ සැලැස්ම බොහෝම හොඳයි. අපි අනාගතයේදී නගර සංවර්ධනය කරන්නේ කියලා ඒ අකුරු වලින් අපි දැක්කා. හොඳ විදියට පොයින්ට්අවුට් කරලා තිබුණා අනාගතයේදී මේ නගර සැලැස්ම අපි දියත් කරන්නේ කියලා අපේ නගරය සංවර්ධනය කිරීමේ කටයුත්තේදී. නමුත් මම එහි දැකපු ඒක දුර්වලතාවයක් තියෙනවා. මම දැරදීනම් ඒව නිවැරදි කරන්න එහි මම නිවැරදි කාලවකවානු දැක්කේ නැහැ. එය විග්‍රහය කරලාත් නැහැ. අපි නිවැරදි සැලැස්මක් ඉදිරිපත් කිරීමේදී අපිට නිවැරදි කාලවකවානු අවශ්‍ය වෙනවා. අපි 2026 දී කොහැනද තියෙන්න ඕන 2027 දී කොහැනද මේ නගරය තියෙන්න ඕන 2028 දී මොරටුව මහා නගර සභාව කොහැනද තියෙන්න ඕන කියන එක ඒ සැලසුම් වල අනිවාර්යයෙන් ඇතුලත් වියයුතුයි. මම දන්නේ නැහැ ඒ සැලසුම් වල වර්ෂයෙන් වර්ෂයට අපි මෙතැනයි අපේ නගරය තැබිය යුත්තේ කියලා සඳහන් කරලා තියෙනවාද කියලා. ඇත්තටම විග්‍රහය කරලා තියෙන එකෙන් මම අදහස් කරන්නේ අපි ඕන කෙනෙක් දන්නවා අපේ කුඩා දරුවෙක් අම්මා තාත්තාගේ කුසට ආවාම අපි ලස්සන චිත්‍රයක් එල්ලනවා අපේ කාමරයේ. මගේ දරුවන් වෙනුවෙනුත් මම එහේ කරලා තියෙනවා. ඒ චිත්‍රය කොච්චර අපේ හිත ඇලෙට කාවදිනවාද කියලා තියෙනවානම් හොඳ නිරෝගී දරුවෙකු බිහි කිරීමට ලස්සන දරු උපතක් ලබා ගැනීමට ඒ චිත්‍රය ඉවහල් වෙනවා. එයාගේම නිවැරදිව විග්‍රහය කරපු අපේ නගර සැලැස්මක් අපි හැමෝටම බලා ගැනීමට මේ නගර සභාව තුළ එකින් ගෙනවයි ඉතින් පිටත විවේකාගාරවල, වැඩ කරන කාර්යාලයේ, අපි වැඩ කරන වර්ක්ෂොප් එකේ මේ සැම දෙයක්ම සටහන් වෙලා තියෙනවානම් ඒ තුළින් තමයි අපට ඉලක්කයක් හදා ගන්න පුළුවන් අපේ නගර මෙන්න මේ වගේ තමයි බලාපොරොත්තු වෙන්නේ කියලා. එවැනි සැලසුමකින් තොරව මම හිතන්නේ නැහැ අපිට නගරය අපි හිතන ආකාරයෙන් සංවර්ධනය කර ගන්න ලැබෙයි කියලා. නමුත් අපිට හොඳ නියමුවෙක් ඉන්නවා.නිවැරදි නායකත්වයක් තියෙනවා. ජනවිඥාණයෙන් වැඩ කරන්න හැකි මන්ත්‍රී මණ්ඩලයක් ඉන්නවා. මම හිතනවා එවැනි වූ මන්ත්‍රී කණ්ඩායමකුත් විපක්ෂයේත් අසුන් ගෙන ඇති කියලා.මම ඔවුන්ට ආරාධනා කරනවා අපි සමග මේ නගරය ගොඩනැගීමේ කාර්යයේදී මම දන්නවා ඔවුන්ගේ සහයෝගය නිතැතින්ම අපිට හිමි වෙනවා කියලා. නමුත් මේ විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් මට කිසිකෙනෙක් අමුත්තන් නොවෙයි. ඔවුන් අපිට ලබැඳිව ආශ්‍රය කරපු අප එක්ක එක තොටේදී කතා කරන අප හැම විටම හාදයාංගමව අපි හඳුනන පුද්ගලයෝ. විශේෂයෙන් පුජිත් මන්ත්‍රීතුමා සජිත් දුමින්ද මැතිතුමා. ඉතින් ඔවුන්ගේ දක්ෂතාවයන් අපි අපගේ නගරය දියුණු කිරීමේ කාර්යය වෙනුවෙන් මම ඔවුන්ට ආරාධනා කරනවා ඔබලාගේ ශක්තිය, දැනුම ලබා දෙන ලෙසින්. ඒ වගේම මට මේ අවස්ථාව ලබා දුන් මාගේ ජනතාවට මට අමතක කරන්න බැහැ. 1394 ක් වගේ ඡන්ද ප්‍රමාණයක් මට හිමි කර දී ඡන්ද 484 ක වැඩි ඡන්ද ප්‍රමාණයක් මට හිමිකර දී මාව බලයට පත් කරපු මාගේ සහෝදර මාගේ කොට්ඨාශයේ ජනතාවට මා ස්තුතිවන්ත වෙනවා. මගේ නගරයට සේවය කරන්න අවස්ථාවක් ලබාදීම පිළිබඳ.අපි මේ දේශපාලනයට සපැමිණියේ තියාන්න ප්‍රදීප්නාද වැනි දේශපාලඥයන්ගේ දේශපාලන ගමනක දැකලා. පරණ, හිටපු දේශපාලනයේ දේශපාලඥයන්ගේ විරිය දැකලා මට දේශපාලනය එපා වූ වකවානුවක තමයි අපි ඒ දවස් වල ගෙනගෙළ්. නමුත් මම කිසිදා පක්ෂීය දේශපාලනයේ නිරත වූවෙක් නොවෙයි. ඉතින් එවැනි දේශපාලකයන්ගෙන් ලැබුණු ගුරුහරුකම් නිසා අද මාට මේ මන්ත්‍රීවරයෙකු ලෙස පත්වීමට මට අවසර දීලා තියෙනවා. මා පසුපසින් සිටින ඒ නායකයන්ට ස්තූතිවන්ත වෙමින් ඔබ සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - එස්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා**

ගරු නාගරාධිපතිතුමනි, නියෝජ්‍ය නාගරාධිපතිතුමිය, විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. කොමසාරිස්තුමිය, ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයෙන්ද අවසරයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දේශපාලන වශයෙන් මුලින් අත්පොත් තබා සමාජ මෙහෙවරක අරමුණ මා මෙවර මොරටුව මහා නගර සභාව සඳහා සර්ව ජනබල පක්ෂයෙන් උයන කොට්ඨාසය නියෝජනය කරමින් තේරී පත්වුණා. අප පක්ෂය ලද ආසන 02න් 01ක් මා නම් කර පත්කරන ලදි. එම මන්ත්‍රීධුරය ලබා ගැනීම සඳහා මා කෙරෙහි විශ්වාසය තැබූ මාගේ උයන උතුර ග්‍රාමයේ ජනතාවටත් අප සර්ව ජනබල පක්ෂය කෙරෙහි නැඹුරුව ප්‍රකාශ කිරීම සඳහා පෙත්කඩ ලකුණ යටතේ මනාපය පළ කර මොරටුව ආදරණීය ජනතාවටත් ප්‍රණාමය පුද කරනවා. ඒ වගේම මහජන නියෝජිතයෙකු ලෙස පත් කළ සර්ව ජන බලයේ නායක, ව්‍යාපාරික පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිත් ජයවීර මැතිතුමාට හා හිටපු අමාත්‍ය චන්න ජයසුමන මැතිතුමාට ද එසේම ජනතා නිදහස් සන්ධානයේ හිටපු අමාත්‍ය විලංග කුමාරපාල මැතිතුමාට ද මොරටුව සංවිධායක සර්ව ජනබල පක්ෂයේ අපේ නායක සමන්ත පීරිස් මැතිතුමාට ද ගෞරවනීය ස්තූතිය පුද කරනවා. මගේ දේශපාලන ගමනේ මුල් ආරම්භකයා වන ජීවන් කුමාරතුංග ඇමතිතුමාටත් මා පළාත් සභා ලේකම් ධුරය දැරූ පළාත් සභා මන්ත්‍රී රොෂාන් විජේරත්න මැතිතුමාටත් මාගේ ප්‍රණාමය පුද කරනවා. සර්ව ජනබල පක්ෂය සඳහා නගරයේ ආසන 02 ක් ලබා ගතහැකි වුණේ අප සංවිධායකගේ පෙත්කඩ ලකුණින් කොට්ඨාස සඳහා ඉදිරිපත්වූ අපේක්ෂක අපේක්ෂිකාවන් ඒ වගේම ලැයිස්තු අපේක්ෂක අපේක්ෂිකාවන් හා ක්‍රියාකාරීන්ගේ කැපවීම හා සාමූහිකත්වයේ ප්‍රතිඵලයක් බව මා හොඳින් දන්නා අතර ඔබ සියලු දෙනාටම පුද්ගලිකව මාගේ ස්තූතිය පුද කරනවා. මට සහය දුන් මාගේ අම්මා, බිරිඳ, දරුවන් සිහිපත් කරනවා. මා වෙත ලද මේ ජන වරම කිලිටි නොකර ජනතාවගේ විශ්වාසය රකිනා ආකාරයෙන් ලැබෙන අවුරුදු හතර තුළ කටයුතු කිරීමට මා කැපවෙනවා. පොරොන්දු වංචාව දූෂණය අල්ලසින් තොර සැබෑ මහජන නියෝජිතයෙකුගේ මෙහෙවර පක්ෂ පාට භේදයකින් තොරව ජනතාවට ලබා දීමෙන් පිරිසිදු දේශපාලනයක් තුළ, මහජන සේවකයෙකු ලෙස ඉදිරියේ දී කටයුතු කරන බවත්, පාලක පක්ෂයේ නිවැරදි තීන්දු සඳහා මාගේ සහය පළ කරන අතරත් ජනතාවට හිතකර නොවන වැරදි තීන්දු වලට එරෙහිව නිවැරදි ගමන් මඟක යන බවටත් මා ප්‍රකාශ කරනවා. මගේ උයන කොට්ඨාසය ඡන්ද දායකයින් ඉතා ම සුළු පිරිසක් ඉන්න කොට්ඨාසයක්. උයන කොට්ඨාසයේ දුම්රියපොළක්, විහාරස්ථාන 02ක්, පල්ලි 03ක් රෝහලක් තියෙනවා. නාගරාධිපතිතුමනි, ජන කොට්ඨාසය කුඩා වුණාට පරිශීලනය කරන පිරිස ඉහළයි. උයනට උයන ග්‍රාමයට ක්‍රීඩාංගනයක් තිබුණේ නැහැ. උයනට උයන කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩාංගනය තමයි තිබුණේ. අපි පළාත් සභාවේ කටයුතු කරන කාලෙදී දස අවුරුදු සැලැස්ම යටතේ එම පාසලට ගොඩනැගිල්ලක් හදලා දුන්නා. එහිදී අපි පොරොන්දුවක් වුණා ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතා නංවාලීමට එහි ක්‍රීඩාංගනයක් හදලා දෙනවා කියලා එතන පාසලේ. ඔබතුමාගේ අවධානය යොමු කරනවා සංවර්ධන කමිටුවේ දී ඇමතිතුමා කිව්වා අපේ පාසල් ගොඩනැගිලි සම්බන්ධව. ඉතින් පුළුවන්නම් උයන ග්‍රාමයට පාසල් ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශමින් සුජීව මහතා**

ගරු නාගරාධිපතිතුමනි, උප නාගරාධිපතිතුමියනි, කොමසාරිස්තුමියනි, ලේකම්තුමනි, නිලධාරීන් සියලු දෙනාගෙන් අවසරයි. මම නියෝජනය කරන්නේ තෙලවල උතුර හා දකුණ කොට්ඨාසය. අපේ ප්‍රදේශයේ සියලු ජනතාව වෙනුවෙන් පහසුකම් සපයන්න අප බැඳී සිටිනවා. මගේ ප්‍රදේශයේ විහාරස්ථාන 04ක්, ක්‍රිස්තියානි පල්ලියක්, මහල් නිවාසයක් හා ගම්පෝර, නිවාස 02කින් යුත් විශාල ප්‍රදේශයක්. ඡන්ද වලින් 6000කට ආසන්න ප්‍රමාණයක් නියෝජනය වෙනවා. ඒ වගේ ප්‍රදේශයක ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තියෙනවා. අවුරුදු ගණනකින් ප්‍රතිසංස්කරණය කරලා නැහැ. කොමසාරිස්තුමියට ලියුම් දීලා මෑතකදී 7 වන පටුමග ප්‍රදේශයේ එක් තැනක් තිබුණා එය දැන් ප්‍රතිසංස්කරණය කරමින් පවතිනවා. ඒ වගේ ම තෙලවල මහල් නිවාසය එහි ගලි පද්ධති වල ප්‍රශ්න තිබුණා.ඒ සම්බන්ධව අපි නාගරාධිපතිතුමා වෙත ලියුමක් දුන්නා. ඒ ක්ෂණිකව එතුමා ක්‍රියාත්මක වෙලා ඒ ගැටලුව සමනය වෙලා තියෙනවා. මම සතුටු වෙනවා මේ නගර සභාවේ ඉන්න නිලධාරී මණ්ඩලය සහ සේවකයන් සම්බන්ධව.දැන් අප අලුතින් හිතන පතන විදියට පත් වෙලා තියෙනවා ඒ

ගැන මට සන්තෝෂයි අප තියන සෑම අදහසටම එතුමා ඇහුම්කන් දෙනවා. මගේ කොට්ඨාසයේ මා වෙනුවෙන් වැඩ කරපු සැමට, මහන්සි වූ සැමට ස්තූතිවන්ත වෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී – පී.එම්. ජෙයාන් දුලිප් තිසේරා මහතා**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, විපක්ෂ නායකතුමනි, සියලුම මන්ත්‍රීවරුනි. අද දවස මාගේ ජීවිතයේ අමතක නොවන දවසක් මහා නගර සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත්කර ගැනීමට මා හට අවස්ථාව සලසා දීමට කටයුතු කළ විශාල පිරිසක් ඉන්නවා. ඒ සියලු දෙනා අද අවලාවේ සිහිපත් කරනවා. මාව මෙලොවට බිහි කරපු මාගේ දයාබර මෑණියන්වත්, මෙලොවෙන් සමුගත් මාගේ දයාබර පියාණන්වත් මෙම අවස්ථාවේදී මා ඉතාමත් ගෞරවයෙන් සුහුඹ සිහිපත් කරනවා. මගේ සෑම ජයග්‍රහණයකදී වගේම මගේ සෑම කටයුත්තකදීම සෙවණැල්ලක් අයින් මා සමඟ සිටිමින් මා දිරිමත් කරමින් මාගේ දයාබර බිරිඳවත් මාගේ දරුවන් දෙදෙනාවත් මා ආදරයෙන් සිහිපත් කරනවා. ඒ වගේම මාගේ බිරිඳගේ දෙමාපියන්වත් මේ අවස්ථාවේ ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. මාගේ සහ බිරිඳගේ සියලුම සහෝදර සහෝදරියන්ව මතක් කරනවා. මට අකුරු ඉගැන්වූ සියලුම ගුරු මෑණිවරුන්වත් පියවරුන්වත් මේ අවස්ථාවේ මතක් කරනවා. මා කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ දේශපාලනඥයෙකු වශයෙන් ක්‍රියාකාරී දේශපාලනයේ යෙදෙන්න. නමුත් මට දේශපාලනයට පැමිණීමට අවස්ථාව සලසා දුන් මොරටුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායක හිටපු උප නගරාධිපතිවරයෙකු වන සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමාටත් මා ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම මට දේශපාලනයට පැමිණෙන්න ප්‍රධාන වශයෙන් උදවු වූ මාගේ සහෝදරයෙකු ලෙස සලකන නිශාන්ත සංජීව සහෝදරයාවත් ගෞරවයෙන් සිහිපත් කරනවා. අපේක්ෂකයෙකු වූ මොහොතේ පටන් මා හට ශක්තියක් ලබා දෙමින් අද මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙතැනට එන්නට මාව දිරිමත් කළ කටුකුරුන්ද දකුණ ප්‍රදේශයේ ජනතාවගෙන් මාහට ඡන්දය ලැබුණු, නොලැබුණු සියලු දෙනාටම මේ අවස්ථාවේ මතක් කරනවා. මා හට මේ මන්ත්‍රී ධුරය ලැබුණේ පොදු ජන එක්සත් පෙරමුණ පුටුව ලකුණින් ඉදිරිපත් වූ සෑම අපේක්ෂකයෙකුම ලැබූ ඡන්දය නිසයි. ඒ සඳහා ඔවුනගේ කාලය ධනය ශ්‍රමය සියල්ල වැය කළ ඒ සියලු දෙනාවත් ගෞරවයෙන් සිහිපත් කරනවා. මා නියෝජනය කරන්නේ ඔවුන් සියලු දෙනාට බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමතියි. මොරටුව ප්‍රදේශයේ එවන් වන පසුගිය මැතිවරණයේදී අප කෙරෙහි විශ්වාසය තබා පුටුව ලකුණ ඉදිරියෙන් කතිරය සටහන් කළ සියලු දෙනාවත් සිහිපත් කරනවා. ගරු සංවිධායකතුමන් සමඟ මා විපක්ෂ මන්ත්‍රීවරයෙකු වශයෙන් මොරටුව ජනතාවට කළ හැකි උපරිම සේවාවක් ලබා දෙන බවත් මොරටුව ජනතාවට පොරොන්දු වෙනවා. නගරාධිපතිතුමන් ලෙස පත්වූ ඔබතුමන්ටත් උප නගරාධිපති වශයෙන් පත්වූ ඔබතුමියටත් ඇතුලු සියලුම කාර්ය මණ්ඩලයටත් සුබ පතමින්, නවක මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වී මොරටුව ජනතාවට සේවය කිරීමට කාර්ය මණ්ඩලයේ සියලු අනුග්‍රහයන්ම සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලමින් මා නිහඬ වෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී – ඩී. සරෝජනී මැන්ඩිස් මහත්මිය**

අතිනවයෙන් පත්වී පත් වූ මොරටුව මහා නගර සභාවේ ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, සියලුම පක්ෂ විපක්ෂ නාගරික මන්ත්‍රීවරුන්ගෙන් යුත නාගරික කොමසාරිස්තුමියගෙන් හා ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ගෙන් අවසරයි. පළමුවෙන් ම අපව විශ්වාස කරලා පළාත් පාලන මැතිවරණයෙන් ජාතික ජන බලවේගයෙන් අති විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දුන් අපේ මොරටුව පුරවරයේ ජනතාවට මාගේ හදපිරි ස්තූතිය පුද කර සිටිනවා. කටුකුරුන්ද උතුර කොට්ඨාසයෙන් වැඩිම මනාප ලබා දී මාව ජයග්‍රහණය කිරීමට සහය වූ කටුකුරුන්ද උතුර ජනතාවට ස්තූතිය පුද කර සිටිනවා. අපේ නගරාධිපතිතුමන් නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඇතුළු අපේ සහෝදර මන්ත්‍රී කණ්ඩායමට පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා පටු අරමුණක් වෙනුවෙන් යන ගමනක් නොවෙයි මෙය. සුදෙක් ම සාමූහික අපේ අරමුණක් වෙනුවෙන් ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා යන ගමනක් නගර සභාව කියන්නේ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා මිනිසුන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලන සේවා සපයන ආයතනයක්.ඉතින් අපි නගර සභාව වැඩි දියුණු කරලා හොඳ ආයතනයක් බවට පත්කිරීම අප සැමගේ යුතුකමක් වෙනවා. ජාතික ජන බලවේගයේ අප සියලු දෙනා ජනතාවගේ මුදල් වලට වග වෙන හොරකම් වංචාව නාස්තිය දූෂණයෙන් තොර වූ කණ්ඩායමක්. මොරටුව

නගරයේ අභිමානයෙන් යුත් සංවර්ධිත නගරයක් බවට පත් කිරීමට ඔබ සැමගේ සහයෝගය අවශ්‍යයි. මේ මොරටු නගරය දියුණු කිරීම හා නගර සභාව ප්‍රසන්නත ස්ථානයක් කර ගෙන යාමට ඔබගේ සහයෝගය අවශ්‍යයි. මේ මොරටුව නගරය ලස්සන නගරයක් බවට පත් කිරීම සඳහා අපි සියලුදෙනා එකතු වෙලා වැඩ කරමු. ඒ සඳහා අපි හැමෝටම ශක්තිය හා ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා ස්තූතියි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. සමීර ප්‍රසාද් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමියනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරීවරුනි, විපක්ෂ නායකතුමනි, මා සහෝදර මන්ත්‍රීවරුනි, මොරටුමුල්ල බටහිර කොට්ඨාසයේ සමගි ජන බලවේගය නියෝජනය කරන මම එච්නකුවත්ත වුඩගේ සමීර ප්‍රසාද් ප්‍රනාන්දු. මොරටුව මහා නගර සභාවේ නාගරික මන්ත්‍රී ධුරය දරමින් මහජන නියෝජිතයෙකු ලෙස පත් වූ මම මෙහිදී මාගේ ස්තූතිය පුද කරන්න කැමතියි. මාව මේ සඳහා යොමු කළ මාව දිරිමත් කළ විපක්ෂ නායක ජෝනක දමියන්ත මැතිතුමාට. ඒ වගේම මා සමග අත්වැල් බැඳගත් මාව ජයග්‍රහණය සඳහා යොමු කළ මාගේ හිතවතුන් සහ 38% ක ඡන්ද ප්‍රතිශතයකින් මන්ත්‍රී ධුරයේ හිමිකරු මට ඡන්දය දුන් බටහිර මොරටුමුල්ල ආදරණීය ජනතාවට, මගේ ජීවිතයට ආලෝකය දුන් නැණ ගුණය දුන් පුවක්අරම මෙතෝදිස්ත උසස් විද්‍යාල මාතාවට ස්තූතිය පුද කරනවා. විශේෂයෙන්ම මා ස්තූතිවන්ත වෙනවා විපක්ෂ නායක ජෝනක දමියන්ත සිල්වා මැතිතුමාට මහජන නියෝජිතයෙකු වශයෙන් මාව දේශපාලනයට ප්‍රවිෂ්ට වීමට ඉමහත් මාර්ගය සලසා දීම ගැන. සමගි ජන බලවේගයේ පක්ෂ නායකතුමන්ටත් මෙම උත්තරීතර සභාවටත් මාගේ ප්‍රදේශයේ ජනතාවටත් පොදු ජනතාවගේ පිළිසිදු අවංක, යුක්තිගරුක නිහතමානී මහත්මා දේශපාලනයක් කරන මහජන නියෝජිතයෙකු ලෙස කටයුතු කරන බවට. මා ප්‍රකාශ කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කොමසාරිස්තුමියනි, ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයෙන් සහ මොරටුවට පරවුවක් වූ වර්තමාන නගර සභිකයන් වන සහෝදර මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මාධ්‍ය හිතවතුනි. මොරටුවේ ආදරණීය ජනතාවගෙන් අවසර පතමින් වසර ගණනාවක් පිල් වලට බෙදෙමින් මොරටු නගරය ක්‍රමයෙන් අගාධයක් බවට පත් කරමින් තිබෙන විකල්පානුවත ජාතික ජන බලවේගය ජයග්‍රහණය කරමින් කොරළවැල්ල බටහිර කොට්ඨාසය මා ජයග්‍රහණය කිරීමට ශක්තිය දුන් මගේ ගමේ ජනතාවට ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම අපි නගර සභාවට මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වුණේ වැඩ කරන්න. ඒ වගේම අපිට තියෙනවා කොරළවැල්ල ප්‍රාථමික විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තියෙන අලුත් පාර හා පරණ පාරේ තියෙන කානු පද්ධතිය. එම අප සියලු මන්ත්‍රීවරුන් එකතුවෙලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගමට වැඩදායි සැනසීමක් ප්‍රසන්න තැනක් බවට පත්කර ගන්න ඕන. පොදු සුසාන භූමියක් තියෙනවා එය නිසි පරිදි ක්‍රියාත්මක වීමට අපි පෙරමුණ ගන්න ඕන. මොකක් අය කළයුතු දේ නොකළ යුතු දේ ගැන අපි කතා කළා. ඉදිරියේදී මොරටුව මහා නගර සභාව යහපත් මාර්ගයක ගෙන යාමට සැමගේ ශක්තිය නගරාධිපතිතුමාට, නිලධාරී මණ්ඩලයට, සේවක මණ්ඩලයට ලබා දෙන්න ඔබට ශක්තිය ධෛර්ය ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. නවීන්ද්‍රන් හිමාංශා ක්‍රිස්ටල් ශාන්ත මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, නාගරික කොමසාරිස්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම මා හිතවත් මන්ත්‍රීවරුනි, ප්‍රථමයෙන් මා මෙවර පත් වූ මන්ත්‍රීවරුන්ට මාගේ හෘදයාංගම සුභ පැතුම් පිරිනමනවා. මෙම ධුර කාලය තුළ අවුරුදු 04 ක මේ මොරටු පුරවරයට ඔබ සැමන්නාන්සේලාගේ ශක්තිය උපරිමයෙන් ලබා දීමට අවස්ථාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම තමයි මා හට මේ අවස්ථාව ලබාදුන් සමගි ජන බලවේගයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් මොරටුවේ සමගි ජන බලවේගයේ ආසන සංවිධායක වර්තමාන මොරටුව මහා නගර සභාවේ විපක්ෂ නායක ගරු ජෝනක දමියන්ත මැතිතුමාටත් මාගේ කෘතඥතාවය

පල කරනවා. මම 2011 දේශපාලනය එනවිට වසර 15කට පමණ පෙර මට අමතක කරන්නට බැහැ දේශපාලනයට මුලින් ම ආරාධනා කළේ ගරු වර්තමාන විපක්ෂ නායකතුමා එවකට මොරටුව ආසනයේ සංවිධායකතුමා ශේෂාන්ත දමයන්ත මැතිතුමා. එතුමන් සමඟම මට ආරාධනා කරපු අපනාත් අමතක කළ නොහැකි චරිතය තමයි දිවංගත හිටපු පළාත් සභා මන්ත්‍රී ගරු නින්සිරි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. එවකට මට නාම යෝජනා ලබා දුන්නේ 2011 වර්ෂයේ දී හිටපු පළාත් සභා මන්ත්‍රී ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා. එතුමන්ලාවත් මා ගෞරවයෙන් ස්තුතිපූර්වකව සිහිපත් කරනවා. ඒ වගේම හිටපු සමගි ජන බලවේග සංවිධායක හිටපු හිටපු රාජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාවත් ගෞරවයෙන් සිහිපත් කරනවා. මේ සභා දුරකට ඇදිලා ඉන්න මට දැනුම ආකල්ප සිත් සතර තියලා දුන්න මගේ පාසල මොරටුව ශාන්ත සෙබස්තියන් විදුහල අවුරුදු 13 ක් පුරාවට මාව පෝෂණය කරපු පාසල් මාතාවත් ගෞරවයෙන් ස්තුතිපූර්වක සිහිපත් කරනවා. මම උසස් පෙළ කරද්දී හර්ෂ ශාස්ත්‍රය උගන්වපු මගේ ගුරුවරුයෙකුත් අද මෙම සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරනවා මහින්ද පල්ලිආරච්චි සර්. එතුමන්ටත් මා විශේෂයෙන්ම සුභ පතනවා. මගේ දේශපාලන දිවියේ වසර 15ක අභියෝග මැද මා ළඟම සිට මට ශක්තියක්ව සිටි මගේ පියා වන ඩබ්.ඒ.ඩී. ජයකාන්ත මහතාටත් ආදරයෙන් මතක් කරනවා. ඔහුට මාගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම නගරාධිපතිතුමනි, වසර ගණනාවකට පසුව මේ නගර සභාවට අලුත් ම වූ පාලනයක් ඇවිත් තියෙනවා. මම නව මන්ත්‍රීවරයෙකු ලෙස ඒ ජනතා තීන්දුවට ගෞරව කරනවා. මම බලාපොරොත්තු වෙනවා නගරාධිපතිතුමනි, මේ පාලනය තුළ හුදෙක් බලගැටී මාරුවක් නොව ක්‍රමයේ වෙනසක් සිද්ධවීම අවශ්‍ය එහෙත් ඇති වෙයි කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස සභාවෙන් මේ මොරටුව පුරවරයට යහපත් ගන්නා තීරණ යහපත් තීන්දු තීරණ වලදී මගේ උපරිම සහයෝගය ලබා දෙන අතර, මොරටුව පුරවරයට අහිතකර තීරණ ගතහොත් ඒ වෙනුවෙන් සක්‍රීයව විරෝධතාවය පළ කිරීමටත් කටයුතු කරන බැව් මා ප්‍රකාශ කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා</u>

නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, කොමසාරිස්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි. ජාතික ජන බලවේගය විදියට අඟුලාන කොට්ඨාසය නියෝජනය කරන්නේ මම, මට ඡන්දය ලබාදුන් ඒ සියලු දෙනාටම මගේ ස්තුතිය පුද කර සිටිනවා. මේ අවස්ථාවේ දී, අඟුලාන ගැන පොඩ්ඩක් කතා කරන්න ඕන. මගේ මිත්‍ර දිලිප් මන්ත්‍රීතුමාත් කතා කළා. අඟුලාන කොට්ඨාසයේ සමුද්‍රාසන්න මාවත් නිවාසය පිළිබඳ නගරාධිපතිතුමනි ඔබතුමාගේ අවධානය යොමු කර ඒ වගේ ම තමයි ධීවර ප්‍රජාව පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. මොකද ගොඩක් හැදිලා වලට ද්‍රවුණ දෙන ගමන් තමයි අඟුලාන තියෙන්නේ. ඒ නිසා අප අමුතුවෙන්ම ඒ ගම හදන්න වෙනවා. ඒ නිසා මමයි දිලිප් මන්ත්‍රීතුමයි දෙදෙනාම ඉන්න නිසා අඟුලාන ගමට ඉදිරි අපිට වැඩ කරන්න හරි ලේසියි. මට මේ දේශපාලනයට එන්න කටයුතු කරපු මගේ සහෝදරයා, ප්‍රදේශ ඉන්ද්‍රජිත් සහෝදරයාටත් ස්තුති කරන්න ඕන මොකද අපි පොඩි කාලේ ඉඳන් නිය යද්දී මාව ඉදිරිපත් කරලා අද මේ තත්ත්වයට ආවා කියන එකට මම ස්තුතිවන්ත වෙනවා ඒ සියලු දෙනාටම. ඒ වගේම මොරටුව මහා නගර සභාවේ සේවය කරන ඒ නිලධාරීන් සියලු දෙනාම අඟුලාන ගම පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් මාගේ වචන ස්වල්පය නිමා කරනවා. බොහොම මහන්සිවෙලා එකතුවුණාට අපි ස්තුතිවන්ත වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - පුලස්ත්‍රිකා තිලන්ති ප්‍රනාන්දු මෙනෙවිය</u>

ගරු නගරාධිපතිතුමනි, උප නගරාධිපතිතුමියනි, ගරු විපක්ෂ නායකතුමනි, සියලුම මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමිය ඇතුළු සමස්ත නිලධාරීන්ගෙන් අවසරයි. මෙවර මොරටුව මහා නගර සභා මැතිවරණයේ දී තරුණ අපේක්ෂිකාවක් ලෙසින් උයන කොට්ඨාසයෙන් සමගි ජන බලවේගයෙන් තරඟ කිරීම මා හට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මොරටුව නායක ගරු යේහාන දමයන්ත සිල්වා මැතිතුමාට මගේ හදපිරි ප්‍රණාමය පුද කරන අතර, දීර්ඝ දේශපාලන අභාසයකට උරුමකම් කියන පවුලකින් පැවත එන මා දිවංගත මොරටුව හිටපු මහා නගර සභා මන්ත්‍රී පී. ජේ. යනි ප්‍රනාන්දු නම් ජනතාවාදී දේශපාලනඥයා මගේ සීයා බව ප්‍රකාශ කර සිටින්නේ ඉමහත් සතුටකින්. ඒවගේ ම 2018, 2023 පසුගිය නගර සභා පාලනය තුළ මා නියෝජනය කරන උයන කොට්ඨාසයේ නාගරික මන්ත්‍රීවරිය ලෙස කටයුතු කරමින් මේ සභාව නියෝජනය කළේ මගේ මව වන හිටපු මහා නගර සභා

මන්ත්‍රී සුදර්ශනී ප්‍රියන්තිකා මහත්මියයි. මගේ උපන් ග්‍රාමය උයන කොට්ඨාසයේ වුනත් මම එම කොට්ඨාසයේ ඥාතීන්ගෙන් සහ හිතවතුන්ගේ නිවෙස් වලට ගිහිං තිබුණත් සෑම නිවසකටම හතර පස් වතාවක් ගියේ මෙවර මැතිවරණයට අපේක්ෂිකාවක් ලෙස තරඟ කරන නිසයි. මට මේ මන්ත්‍රීකමට වඩා සමීප ඒ නිවෙස් වලට ගියාම දැනගන්න ලැබුණා. ඒ මගේ පියා ලක්ෂ්මන් සමන්තව සහ මගේ මව සුදර්ශනී ප්‍රියන්තිකාට උයන කොට්ඨාසයේ ජනතාව මොනතරම් ආදරයිද ලෙන්ගතුයිද කියන එක. මා හට වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලැබුණේ ඒ ලෙන්ගතුකම නිසායි. උයන කොට්ඨාසයේ ජනතාව දේශපාලනයෙන් තොරව ඒ ලබා දුන් සහායට මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ඒ වගේම මා කෙරෙහි දැක්වූ විශ්වාසය නොකඩවා අනිද්දාකීම යථාර්ථයක් කර උයන කොට්ඨාසයේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරන බවට ද පොරොන්දු වෙනවා. සමගි ජන බලවේගයෙන් තරඟ කළ ලාබාලතම අපේක්ෂිකාව ලෙසින් නවක මන්ත්‍රීවරියක් ලෙස මේ සභාව නියෝජනය කිරීමට ලැබීම මාගේ භාග්‍යයක් කොට සලකන අතර උයන ශ්‍රී විසුද්ධාරාමයේ විදිලගොඩ පියනන්ද නාහිමිට ද අනුරාධපුරයේ සිරිනන්ද නාහිමිට ද උයන ශ්‍රී ශෛලබිම්බාරාම විහාරස්ථානයේ පොල්ගොඩ සිරි සුමන නාහිමිට ද ඒ වගේම කතෝලික හා ක්‍රිස්තියානි ස්ථානභාර ගරු පූජකතුමන්ලාට ද මාගේ ගෞරවනීය නමස්කාර පූර්වක ප්‍රණාමය පුද කරනවා. මා නාම යෝජනා ලබාදුන් දිනයේ පටන් අපගේ අඩුපාඩු සොයා බලා මැයි මස 06 වන දින මා පරාජය වුවත් මෙවන් ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට අපව නිවැරදි මාර්ගයකට යොමු කළ මාගේ නායක සේනක දමියන්ත මැතිතුමා ඇතුළු අපගේ ආසන සංවිධායකට ද බල මණ්ඩලයේ සියලුම නිලධාරීන්ට ද මෙහෙයුම් කාර්යාලයේ සංජීවනී මහත්මියට ද නැවත වතාවක් ස්තූතිවන්ත වෙමින් මොරටුව මැතිවරණ කොට්ඨාසයේ සියලුම ජනතාවට ද විශේෂයෙන් මාගේ උයන කොට්ඨාසයේ ජනතාවට ද මෙවර පුර සභාවට පත් වූ විපක්ෂ නායක සේනක දමියන්ත මැතිතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට ද ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාට ද සුබ ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, නාගරික කොමසාරිස්තුමියනි, නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමා ඇතුළු නිලධාරී මහත්ම මහත්මීනි, මාධ්‍යවේදී මහත්ම මහත්මීනි, ආදරණීය හිතවතුනි, මොරටුව මහා නගර සභාවේ මෙම සමාරම්භක මහා සභා රැස්වීම ඇමතීමට ලැබීම මා ගෞරවයක් කොට සලකනවා. ඒ වගේම මහා නගර සභා මන්ත්‍රීවරයෙකු ලෙස වැඩි ඡන්දයෙන් මා තෝරා ගැනීමට ඡන්දය ප්‍රකාශ කළ මොරටුවැල්ල උතුර සහ උස්වත්ත ජනතාවට ස්තූති කිරීමටත් මේ අවස්ථාව උපයෝගී කරගන්නවා. ඒ වගේම නවක මන්ත්‍රීවරයෙකු ලෙස මෙම ගරු සභාව නියෝජනය කිරීම සඳහා මට අවස්ථාව සලසා දුන් ජාතික ජන බලවේගයටත් මාගේ ස්තූතිය ප්‍රකාශ කරනවා. මොරටුව නගරය අලංකාර කිරීම ගැන මට පෙර කතා කළ මන්ත්‍රීවරු අදහස් දක්වනතුරු මා සවන් දුන්නා. නගරය අලංකරණය ගැන කතා කිරීමේදී මොරටුවේ බස් නැවතුම්පල ඉතා වැදගත් ස්ථානයක් ගන්නවා. ඒ නිසාම මොරටුව බස් නැවතුම්පල සංවර්ධනය පිළිබඳ යෝජනාවක් මම මොරටුව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවටත් යොමු කළා. හැකියාවක් තියෙනවා නම් මොරටුව බස් නැවතුම්පලට යාබදව තියෙන දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම පවරාගෙන බස් නැවතුම්පල සංවර්ධනය කිරීම යෝග්‍ය බව මගේ අදහසයි. ඒ වගේම අතිගරු ජනාධිපතිතුමාගේ සහ පාර්ලිමේන්තුවේ සහාය මොරටුව නගර සංවර්ධන වැඩපිළිවෙලට ලැබේ යැයි මා බලාපොරොත්තු වෙනවා. ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාවට තෝරී පත් වී සිටින සියලුම මන්ත්‍රීවරු 26 දෙනා නගරය සංවර්ධනය කිරීමේ කාර්යභාරයට සාමූහිකව සහය දක්වන බවට හා අපගේ ප්‍රතිපත්ති වගවීමෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට කැපවන බවට මට විශ්වාසයි. ගරු නගරාධිපතිතුමනි, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, සහෝදර මන්ත්‍රීවරුනි, මම ප්‍රාර්ථනා කරනවා වසර 4 ක් වැනි කෙටි කාලයක් තුළ ජනතාවගේ අපේක්ෂා ඉටු කිරීමට අප සියලු දෙනාට ශක්තිය ලැබේවා කියලා. බොහොම ස්තූතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. පී. රංජලා එස්. ජයතුංග මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි, කොමසාරිස්තුමියනි, විපක්ෂ නායකතුමනි, ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරී මහත්ම මහත්මීනි, මාධ්‍යවේදීන්ගෙන් ද අවසරයි. මා පළමුවෙන් ම අද දින මෙහි පත්වී සිටින ගරු නගරාධිපතිතුමා ඇතුළු ජාතික ජන බලවේගයේ මන්ත්‍රී කණ්ඩායමටත් මාගේ විපක්ෂ නායකතුමාටත් විපක්ෂ කණ්ඩායමටත් මාගේ හදපිරි ප්‍රණාමය පුද කර සිටිනවා. නගරාධිපතිතුමනි, දැනුම තේරුම් ඇති කාලයේ පටන් මම දේශපාලනය කළත් මට මොරටුව මහා නගර සභාවේ නාගරික මන්ත්‍රීවරියක් වීමට වාසනාව ලැබුණේ නැහැ. නමුත් අද මට ඒ අවස්ථාව ලබාදී තියෙනවා මගේ ඒකමත් විපක්ෂ නායක ගරු සේනක දමියන්ත මැතිතුමා. එතුමාටත් මගේ හදපිරි ප්‍රණාමය මේ අවස්ථාවේදී පළකර සිටිනවා. ඒ වගේම හිටපු සමගි ජන බලවේගයේ මොරටුව සංවිධායක ඉරාන් විජුමරත්න මැතිතුමාටත් මාගේ පවුලේ සැමටත්, මාගේ උතුර මධ්‍යම කොට්ඨාසයේ ජනතාවටත් සමගි ජන බලවේගයෙන් ඡන්දයට ඉදිරිපත් වූ සියලුම අපේක්ෂක අපේක්ෂිකාවන්ටත් මා වෙනුවෙන් ඉදිරිපත් වූ සුජීවිත් මහතාටත් මම මේ අවස්ථාවේ දී ස්තුතිවන්ත වෙනවා. නගරාධිපතිතුමනි, ඔබතුමාගේ මගේත් දේශපාලන මතිමතාන්තර වෙනසක් වුවත් ඉදිරියේ දී මං විශ්වාස කරනවා ඔබතුමා පක්ෂ භේදයකින් තොරව මොරටුව ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට තීන්දු තීරණ ගනී කියලා. එහිදී ඔබතුමා විසින් ගන්නා ලද සෑම යහපත් තීරණයකටම මාගේ පෞද්ගලික සහයෝගය ලබා දෙන බව මම මේ අවස්ථාවේදී කියා සිටිනවා. මගේ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් ජයවේවා! මාගේ විපක්ෂ නායක සේනක දමියන්ත මැතිතුමාටත් ජයවේවා. මාගේ මොරටුව ජනතාවටත් ජයවේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න <u>හේවාවිතාරණ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, උප නගරාධිපතිතුමියගෙන්ද නාගරික කොමසාරිස්තුමියගෙන්ද නාගරික ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ගෙන් ද සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ද අවසරයි. ඇත්තටම අද මාගේ ජීවිතයේ විශේෂ දවසක් ඒට හේතුව තමයි මම කවදාවත් හිතලා තිබුණේ නැහැ මන්ත්‍රීවරයෙකු හැටියට දේශපාලනයට පිවිසෙන්න. මගේ කුඩා කාලයේ මගේ අයාව තිබුණේ නීතිඥවරයෙකු වෙන්න. ඒකට මූලික හේතුව වුණේ අසාධාරණය වෙනුවෙන් සමාජය තුළ යමක් කරන්න පුළුවන් නීතිඥවරයෙක්ට කියලා. මගේ තරුණ අවධිය වෙද්දී මට තේරුණා සමාජයට ලොකු කැප කිරීමක් කරන්න පුළුවන් වෙන්නේ නිවැරදි දේශපාලන දර්ශනයක් තුළ හිටියොත් අපිට ලොකු සේවයක් කරන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මගේ ජීවිතේ වෙනසක් සිදු වුණා මීට අවුරුදු 25 කට පමණ කලින්. මම මේ දේශපාලනයට පිවිසුණා. මම අද බොහොම සතුටින් කතා කරන්නේ මට මගේ ජීවිතයේ වෙනස් කරපු ලස්සනම තැනක් මට ලැබුණා. සහෝදරත්වයෙන් ඉන්න එකම අරමුණක් වෙනුවෙන් කැපවෙන මිනිස් සමූහයක් මට ලැබුණා. එහිදී මම බොහෝ ආදර්ශයක් ලබා ගත්තා. ජීවිත පරිත්‍යාග කරමින් මේ සමාජය මිනිස්සු සතුටින් තියන්න උපරිම කැප කිරීමක් කරන මිනිස් සමූහයක් මට හමුවුණා. ඒ නිසා මගේ ජීවිතයේ වැඩි කාලයක් මම දේශපාලනය සමඟ සිටියා.

ගරු නගරාධිපතිතුමනි, මීට වසර 20කට පමණ පෙර ඉතා දිළිඳු ගමක ඉපදුණු මම, මොරටුවට පැමිණි පුද්ගලයෙකු නොවෙයි නමුත්, දැන් මම මොරටුවේ ජීවියෙක්, හැබැයි මම මොරටුවට ඇවිත් මොරටුවේ එදා දැකපු දේවල් අදත් මම මොරටුවේ දී දකිනවා. පල් වෙච්ච කාණු. ලැලි ගෙවල්. හදගතන පරිසරයක් ඉතාම දිළිඳු බවින් ජීවත් වන මිනිස් සමූහයක් අද මම මොරටුව ඝන නාගරබද ප්‍රදේශ වල දකිනවා. වසර ගණනාවක් පුරාවට මේ කිසි දෙයක් වෙනස් කරගන්නා බැරි දේශපාලන යාන්ත්‍රණයක් තුළ මිනිස්සු අසරණභාවයට පත් වෙලා තියෙනවා මම දැක්කා. ඒ නිසා මම අද සතුටු වෙනවා ගමේ තියෙන සුන්දරත්වය එදා තිබුණ නැතිබැරිකම වෙනුවට ගමේ අද ඒ සුන්දරත්වය මම ගමේ තිබිම යාවතාවයක් අද මම දකින්නෙ නැහැ ගමේ ගියාම. නමුත්, මේ කොළඹ මොරටුවේ මම දකිනවා වියපත් අම්මලා තාත්තලා අද මහා පාරේ හිඟා කනවා. මේ සමාජ ක්‍රමය විසින් මේ කිසි දෙයක් වෙනස් කරන්න සමත් වෙලා තිබුණේ නැහැ. ඒ නිසා අද මගේ සේවය මේ මොරටුවට ලබා දෙන්න මට පුළුවන්කම තියෙනවා. මම මේ අවස්ථාව භාර ගන්නවා මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න රාවතාවත්ත බටහිර කොට්ඨාසයේ ආදරණීය ජනතාව. මගේ කොට්ඨාසයේ ආදරණීය සහෝදර සහෝදරියන්ගේ දායකත්වයෙන් හැදුණු රාවතාවත්ත බටහිර දකුණ කොට්ඨාස දෙකේ ඡන්ද

වැඩි ප්‍රතිශතයක් ලබා දෙමින් මම මේ උත්තරීතර සභාවට පත් කරන්න ඒ ජනතාව සමත් වුණා. ඒ නිසා මගේ එක අරමුණයි තියෙන්නේ අපේ කණ්ඩායමේ තියෙන එකම අරමුණ තමයි මිනිස්සුන්ට ලස්සන ජීවිතයක් උදාකර දීම. අපේ නගරාධිපතිතුමාගේ තියෙන අරමුණ තමයි අපපත් තියෙන්නේ. ඒ නිසා මා මේ උත්තරීතර සභාවෙන් ඉල්ලා සිටිනවා මින් ඉදිරියට අපි නියෝජනය කරන මේ ආදරණීය ජනතාව අපිව විශ්වාස කරලා අපිව මේ තැනට එව්වූ ආදරණීය ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න මේ අවුරුදු 04ක කාල සීමාව තුළ අපි හැමෝමගෙම හැඟවීම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ සමාජය වෙනුවෙන් අපේ වගකීම අපි ඉෂ්ට කරමු. ගොඩාරු අවලාද තර්ක විතර්ක වෙනුවට අපි මේ මාසයකට සැරයක් එකතු වෙන මේ ස්ථානය ඉතාම සුන්දර ස්ථානයක් කරගමු. ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් අප පෙනී සිටිමු. රාජ්‍ය සේවකයින් ද දේශපාලන නියෝජිතයින්ද කියලා භේදයක් නැතිව අප හැමදෙනාම සහෝදරත්වයෙන් එකම අරමුණක් වෙනුවෙන් අපි මේ වසර 04 ක කාල සීමාව තුළ එකම අරමුණක් වෙනුවෙන් මේ මොරටුව ගොඩනගන්න මොරටුව ලස්සන නගරයක් කරගන්න අපි හැමෝම එකාවන්ව ඒ කැප කිරීම කළොත් මම හිතන්නේ අපි හැමෝගේම අරමුණු ඉෂ්ට වෙයි. ඒ ජනතාව කවදාහරි දවසක අපේ විශ්‍රාම දිවියට අපිට සුභ පතයි අපි කෘතගුණ සලකන පුද්ගලයන් බවට පත්වෙයි. ඒ නිසා ඒ අරමුණු හැමෝටම ඉෂ්ට කරගන්න හැකිවන් වෙන්න කියලා බලාපොරොත්තුවෙමින් හැමදෙනාටම සුභ පතනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියනි ඒ වගේම අභිනවයෙන් තේරී පත් වූ නාගරික මන්ත්‍රීවරුනි, නාගරික කොමසාරිස්තුමියනි, ලේකම්තුමනි, සියලුම නිලධාරීන්ගෙන් අවසරයි. මා මුලින්ම ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාව මට ලබා දීම ගැන පස්වන ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහතාට හා නාමල් රාජපක්ෂ මහතාට ද පක්ෂ මහා ලේකම් නීතිඥ සාගර කාරියවසම් මහතාට ද මොරටුව ආසන සංවිධායක නීතිඥ මනෝජ් ගමගේ මහතාට ද මේ අවස්ථාවේ මා ස්තූතිය පුදකර සිටිනවා. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කතාව ආරම්භයේ දී සඳහන් කළ කරුණකින්ම මගේ කතාව ආරම්භ කරනවා. මම නීතිඥවරයෙකු වශයෙන් වසර 15කට ආසන්න කාලයක් මොරටුව අධිකරණයේ සේවය කරනවා. ඔබතුමා හොඳ කතාවක් කිවුවා අප නීතිගරුක පුරවැසියන් වශයෙන් යුක්තිගරුක පුරවැසියෙක් වශයෙන් ජීවත් වෙන්න අවශ්‍යයි. මා 100% ක්ම එකඟයි ඔබතුමා එක්ක. මම විශ්වාස කරනවා සියලුම පක්ෂ වලින් තරග කරලා, විශාල කැප කිරීම් කරලා, මේ තැනට ඇවිත් තියෙන්නේ මොරටුව ජනතාවට සේවය කරන්න කියලා. ඒ ප්‍රඥාවන්තභාවය හැමෝම අප හැම කෙනෙක් තුළම තියෙනවානම් මා විශ්වාස කරනවා අපි පළමුව නීතිගරුක යුක්තිගරුක පුරවැසියෙක් වශයෙන් අනිවාර්යයෙන්ම තමන් ආදර්ශයක් සැපයිය යුතුවයි. මා ඉල්ලීම් කිහිපයක් කිරීමට පෙර ඔබතුමාට ගෞරවයෙන් දන්වා සිටිනවා යෝජනාවක් වශයෙන් අපි පළමුව හැකියාවක් ඇත්නම් මේ නගර සභාවේ අපි නවක මන්ත්‍රීවරු වශයෙන් මා විශ්වාස කරන විශාල පිරිසක් ඉන්නවා මගේ වෘත්තියේ මා යම් නිපුණතාවයක් තිබුණත්, මා දේශපාලඥයෙකු වශයෙන් දේශපාලන ජීවිතයේ මට අත්දැකීම් දැනුමක් නැහැ. ඔබතුමා කිවුවා වගේ අපි සියල්ල දත් පිරිසක් නොවෙයි. අපි ඉන්ද්‍රජාලිකයෝ නොවෙයි. ඒ නිසා ඔබතුමාලා පක්ෂ විපක්ෂ සියලුදෙනා අත්දැකීම් හා දැනුම් තියෙන පුද්ගලයන් එකතු වෙලා මේ නවක මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය හා වගකීම කුමක්ද යන්න දිනක හෝ පැය කිහිපයක වැඩමුළුවක් සංවිධානය කරන්න පුළුවන්නම් මං දැකපු අනෙකුත් නවක මන්ත්‍රීවරුන්ට එය පිටුවහලක් වේවි. එහෙම නැතිනම් වැඩ කරන ගමන් ඉගෙන ගන්න සිද්ධවුණ එකකට ගියොත් මේ අවුරුදු 04 ඉවර වෙනකොට තමයි අපි මේක් දැනගන්නේ. එවිට අපට මොරටුවේ මහා ජනතාවට සේවයක් කරන්න අවස්ථාවක් නැති වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, හැකියාවක් තිබෙනවා නම් මොරටුව ජනතාවට යම් අධ්‍යාපනයක් මම දැනට දන්නා ආකාරයට නගර සභාව මගින් පෙර පාසල් අධ්‍යාපනයක් සිද්ධ වෙනවා යම් පෙර පාසල් කිහිපයක. ඒ වගේම හැකියාවක් ඇත්නම් ගරු නගරාධිපතිතුමනි, මං මගේ වෘත්තිය අත්දැකීම් එක්ක මං දන්නවා විශාල වශයෙන් මිනිස්සු පීඩාවට පත් වෙනවා අසාධාරණයකට පත්වෙනවා මේ නීතිමය කාරණා නොදන්න නිසා. ඒ නිසා අපිට හැකියාක් ඇත්නම් මිනිස්සුන්ගේ එදා ජීවිතයට අවශ්‍ය වන මූලික නීති සිද්ධාන්ත සම්බන්ධයෙන් යම් ආකාරයක දැනුවත්භාවයක් ලබා දෙන්න, නීති සම්මන්ත්‍රණයක් පහස් කරන්න, අඩු තරමේ මාසයකට සැරයක් හෝ අපිට එය ඉතාම වැදගත්

වෙනවා. ඒ ජන ජීවිතය යහපත් තත්ත්වයකට ගෙන ඒමට. ඒ වගේම අධ්‍යාපනය තුළ නීති අධ්‍යාපනය අනිවාර්ය තත්ත්වයක් බවට පත් කරන්න ඕන නමුත් අපිට එය නගර සභාවක් තුළ කරන්න පුළුවන් සීමාවක් තියෙනවා. ඒ සීමාව තුළ ඔබතුමාට හැකියාවක් තියෙනවානම් පාසල් මට්ටමින් හෝ මැතිවරණ කොට්ඨාශ මට්ටමින් හෝ යම් ආකාරයක දැනුවත් කිරීමක් සිදු කරන්න. පාණ්ඩු ජන්මයේ අජීර්ය නීතිඥ ශාන්තිනී වල්ගම මහත්මිය සිටිනවා. ජාතික ජන බලවේගය නියෝජනය කරමින් සිටින ඒ මහත්මිය වගේ ම නීතිඥ ලිහිණි ප්‍රනාන්දු මහත්මිය සිටිනවා. ඒ වගේම මගේ උගත් සහෝදර නීතිඥවරයා චන්දන විතානගේ මහතා සිටිනවා. අපිට හැකියාවක් තියෙනවා අපේ වෘත්තීය නිපුණතාවය තුළ යම් ආකාරයක දායකත්වයක් ලබා දෙන්න. මේ මොරටුව ජනතාවගේ ඒ අධ්‍යාපන තත්ත්වය දැනුම් තත්ත්වය යම් ආකාරයකට වර්ධනය කරන්න. මා විශ්වාස කරනවා ඔබතුමා මුලින් කිව්ව ආකාරයට නීතිගරුක පුරවැසියෙකු බිහි කරන්නනම් අපි ඒ නීතිය පිළිබඳ දැනගෙන සිටිය යුතුයි. ඔබ අප සියලු දෙනා දන්නා ආකාරයට නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් නොවෙයි. එහෙමනම් අපි මුලින්ම නීතිය දැනගන්න ඕනා.

ගරු නගරාධිපතිතුමනි, උද්‍යාන මහා නාගර සභා ආඥා පනතේ යම් යම් වගන්ති සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයන් ඇති වුණා. හැබැයි මම නීතිඥවරයෙකු වශයෙන් කල්පනා කළා මට මේ සඳහා දෙන්න පුළුවන් දායකත්වය මොකක්ද කියලා අඩු තරමේ මගේ අතේ පනතක්වත් නැහැ. ඒ වගේම මේ සියලුම මන්ත්‍රීවරුන්ට මේ අදාළ පනත ලබා දෙන්න අපට හැකියාවක් තියෙනවා එය පරිශීලනය කරන්න. අපි දන්නේ නැති දේවල් අහගන්න පුළුවන්, ඒ අත්දැකීම් මගෙන් ලබාගන්න හැකියාවක් තියෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා ඉදිරියට අපට ඒ පනත ලැබෙයි කියලා. අපි ඒ සම්බන්ධයෙන් යම් අධ්‍යයනයක් ලබාගෙන අපිට හැකි උපරිමයෙන් නගර සභාව, ඒ වගේම මොරටුව ජනතාවගේ ජීවිතය යහපත් කරන්න මේ අපේ දැනුම ලබා දෙන්න හැකියාවක් ඇති කියලා මම විශ්වාස කරනවා.ගරු නගරාධිපතිතුමනි, මොරටුව ජනතාවගේ ජාතික හැඳුනුම්පත් නොමැති විශාල පිරිසක් ඉන්නවා. එදිනෙදා ජීවිතයේ අපිට හමුවන නැනැත්තන් එනවිට ජාතික හැඳුනුම්පතක්වත් නැහැ, ජාතික හැඳුනුම්පතක් අවශ්‍යයි කියලා දන්නෙත් නැහැ. එවැනි මූලික කාරණයක් හරි අපිට නගර සභාව මඟින් එකදින වැඩමුළුවක් පවත්වලා මුළු මොරටුවටම මේ ග්‍රාම සේවා වසම් හරහා දැනුවත් කරලා ජාතික හැඳුනුම්පතක් ලබා දෙන්න හැකියාවක් ඇත්නම් එය ආරම්භයක් හැටියට ඉතාම වටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මම සභාවේ සියලු දෙනා කතා කළා දූෂණය අල්ලස හොරකම මේ සියල්ල නවත්වන්න ඕන කියලා. ඔබතුමාලා බලයට ආවෙත් නව දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න. හැත්තෑපස් වසරක දේශපාලනය සාපය එපා කියලා ඔබතුමාලා ජනතාවට පොරොන්දු දීලා තමයි අද බලයට ආවේ. මා විශ්වාස කරනවා එහෙමනම් ඒ කාරණය කරන්න පුළුවුම ජනතාව ඔබතුමාට අද ලැබිලා තියෙනවා. තවදුරටත් හැත්තෑපස්වසරක දේශපාලන සාපය ඔබතුමාට මේ වසර 04න් ඉවරවෙලා කියන්න සිද්ධ වෙනවානම් ඒක ඔබතුමාලාගේ අවාසනාවක්, මා පෞද්ගලිකව ඔබේ පරාජය දකින්න කැමති නැහැ. මා මිල් දකිනවා, නමුත් ඔබතුමාලා මේ අවුරුදු 04 ඉවර වෙලා යනකොටත් අපිට දකින්න තියෙන්නේ තවු විතරක්නම් ඒ සාපය හැත්තෑපස් වසරකට තව අවුරුදු 04ක් එකතු වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මා ඉල්ලා සිටිනවා ඔබතුමා මේ කිව්ව ආකාරයට හොරකම දූෂණය මේ සියල්ල නවත්වන්න ඕනානම් ඔබතුමා දන්නා පද්ධතියක් හොයා කරන්න. ඒ හරහා ඔබතුමාලාගේ රජයේ මේ වනවිට ප්‍රසිද්ධම කාරණය තමයි මුදල් විශුද්ධිකරණ පනත හරහා විශාල ආකාරයේ අයථා ලෙස උපයාගත් මුදල්, දේපල සියල්ල රාජසන්තක කරන්න කටයුතු කළා. ඉතාම හොඳයි. මගේ දැනුවත්භාවයෙන් නීතිඥවරයෙකු වශයෙන් මේ පනත යටතේ මේ වනවිට ලංකාවේ පස්දෙනෙක් හෝ දසදෙනෙක් හරි වැරදිකාරයා කරලා දේපල රාජසන්තක කරලා මහා භාණ්ඩාගාරයට ලබාගෙන නැහැ. මෙහි කතා කිහිපයක් ආවා යම් යම් පුද්ගලයන්ට චෝදනා එල්ල කළා හැබැයි අපිට අධිකරණය හරහා වැරදිකාරයෙකු නොවනතාක් ඒ නැනැත්තන්ට එවැනි චෝදනා කරන්න හැකියාවක් අපට නැහැ. නමුත්, අපි අනිවාර්යයෙන්ම එවැනි ආකාරයේ කුමන හෝ වරදක් අල්ලසක් හොරකමක් කරලා තියෙනවානම් ඒ පුද්ගලයාගේ තරාතිරම නොබලා අනිවාර්යයෙන්ම නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. එහෙම වුණොත් විතරයි නගරාධිපතිතුමනි ඔබතුමාට තවදුරටත් මේ දේශපාලනයට ඇඟිලි දික්කරලා වැරදි කියන්නෙ නැතුව ඔබතුමාට තමන් දිනාගෙන ඔබතුමාගේ රාජකාරි ඉටුකළා කියලා මේ ජනතාවගෙන් නික්මෙන්න ඔබතුමාට හැකියාව තියෙනවා. මොකද අපි

සියලුදෙනා මේ ස්ථානයට තාවකාලිකව පැමිණි පුද්ගලයන් පමණයි. ඔබතුමා දන්නවා ඔබතුමාලා 3%ක ඡන්ද ප්‍රතිශතයක ඉඳලා අද මේ පුටුවට ඔබතුමා වසර 29ක කැප කිරීමක්. විශාල කාලයක් අපේ ජීවිත කාලයක් එක්ක බැලුවොත් භාගයකටත් වඩා වැඩි කාලයක් එහෙම කාලයක් ඔබතුමා තමන්ගෙම කැප කරලා ඉවසීමෙන් දක්ෂතාවයෙන් අද ඔබතුමා මේ පුටුවට ඇවිල්ලා ඉන්නවා. මා විශ්වාස කරනවා එහෙනම් කවදාවත් ඒ ආකාරයේ අවලාද මඩ ඉතිහාසයට බනින්න විතරක් තියාගන්න එපා කියලා. ඉතිහාසය දිහා බලලා අපිට වරදුන තැන් ඒ වැරදි හදාගෙන අපි අනාගතයට යන්න ඕන. අපි පැති කණ්ණාඩිය බලලා අපිට පසුපෙළට පේන්නේ. නමුත් පසුපෙළට පේන්නේ විතරක් අපි බලාගෙන ගිවිසුමක් ඉස්සරහ අනතුරක් වෙන එක අපට නවත්තන්න හැකියාවක් නැහැ. ගරු නගරාධිපතිතුමනි හැකියාවක් ඇත්නම් නීති සම්මතයන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් මේ හැදුනුම්පත් සකස් කරන එක මේ සියල්ල කරන මේවා මෙන් එකක් තාවකාලික කාලයෙන් අපිට මේ නගර සභාව සුන්දර තැනක් කරන්න හැකියාව තියෙනවා. ඔබතුමා විශ්වාස කරන ආකාරයට, අප විශ්වාස කරන ආකාරයට මීට පෙර තිබූ නගර සභාවෙන් සිදුවූ සියලු අකටයුතුකම් නවත්වලා මොරටුව ජනතාවගේ ජීවිතය වඩා යහපත් තැනකට ගෙන ඒමට හැකියාව ලැබෙයි කියලා මා විශ්වාස කරනවා. පක්ෂයක් වශයෙන් මා මුලින් පක්ෂයේ ප්‍රතිපත්ති සමඟ සහ විපක්ෂයක් වශයෙන් විපක්ෂයේ කණ්ඩායම සමඟ එකතු වෙලා ඉතා ජනතුරුව නගර සභාවක් වශයෙන් ඔබතුමාලා සියලු දෙනා සමඟ එකතුවෙලා ඔබතුමාලා අරගෙන එන සියලු යහපත් වැඩ කටයුතු වලට දැන් මගේ සහාය ලබා දෙන බව මා ප්‍රකාශ කරන පෙරම්. සුජීව් මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ ඔබතුමා අපේක්ෂා පළමුවෙනි වැරදි යෝජනාව මේ ශ්‍රී ලංකාවේ අනිවාර්යෙන් මගේ ඡන්දෙත් නොඩියට එකතුවෙනවා. ඒ සමග මා අවසන් වනතුරු, පේගෙන යනවා අනිවාර්යයෙන්ම ඒ වන කතන් ඔබතුමා ගෙන එන සියලු සාර්ථක වැඩකටයුතුවලින්සකටම මා 100% ක එකඟතාවය පළ කරනවා. ඒ අනුව ඔබතුමාට ඔබතුමාගේ නවක මන්ත්‍රී කණ්ඩායමට, විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට මා සුභාශිංසන ගෙන එනවා අපි සියලුදෙනා එකමුතුව මොරටුව ජනතාවගේ ජීවිතය වඩා යහපත් කිරීමට එකතුවෙලා වැඩක් කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, උපනගරාධිපතිතුමනි, නාගරික කොමසාරිස්තුමිය ඇතුලු නාගරික ලේකම්තුමා සහ නිලධාරීන්ගෙන් ද ජනමාධ්‍ය වේදීන්ගෙන්ද අවසරයි. ඒ වගේම මොරටුමුල්ල බටහිර කොට්ඨාසයෙන් තේරී පත් වූ මොරටුව මහා නගර සභාවට මා පත් වී තියෙනවා. මොරටුමුල්ල බටහිර කොට්ඨාසයේ ජනතාවට මා මුලින්ම ස්තූතිය පුද කරනවා අද මාව මේ ස්ථානයට පත්කර ගැනීම සම්බන්ධයෙන්. ඒ වගේම කටලාන යාන්ත්‍ර ජන්මෙත්නි දේවස්ථානයේ දේවගැතිතුමා සහ අංගනාර්ඩින්න දේවස්ථානයේ දේවගැතිතුමාට මා ස්තූතිවන්ත වෙනවා. බටහිර මොරටුමුල්ල අපේ ජනතාව මා කෙරෙහි තැබූ විශ්වාසය මා කිසිදු අයුරකින් පළුදු නොකරන බවට මා පොරොන්දු වෙනවා. ජාතික ජන බලවේගයට මා ස්තූතිවන්ත වෙන අතර මෙහි සිටින නාගරික මන්ත්‍රී චලිසියන් සහෝදරයාටත් ස්තූතිවන්ත වෙනවා. තමයි මාව දේශපාලනයට එක්කගෙන ආවේ. ඒ වගේම ගැලරියේ සිටින අපේ මොරටුවේ සංවිධායක සුජීව් සහෝදරයා එතුමාට බොහොම ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම මා කෙරෙහි තැබූ විශ්වාසයට තමයි අපේ පසුගිය සහෝදරයා කිව්වා ඉඩ්බැද්ද විල්ලත් ප්‍රනාන්දු ක්‍රීඩාංගනය ගැන වචන ස්වල්පයක් මම ඊට නව අදහසක් යෝජනා කරන්න කැමතියි. ඩිස්වත් ගේ, පිරිප් ක්‍රීඩාංගනය තියෙනවා මැටිවන්නේ. ඒක අමලන් ගණ්වලයේ තියෙන්නේ. ඉදින් ක්‍රිකට් ක්‍රීඩාවට යොමු වන තරුණයෝ හැටියට ගරු නගරාධිපති මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මගේ ඉදිමාපියන්ට මගේ බිරිඳට වගේම මගේ දරුවන් දෙදෙනාට මගේ සහෝදර සහෝදරියන් මට උදව් කරපු අපේ බටහිර මොරටුමුල්ල ජනතාවට මගේ ස්තූතිය පළ කරනවා.මගේ ආදරණීය ජාතික ජන බලවේගයේ අභිනවයෙන් තේරී පත්වුණු නාගරික මන්ත්‍රීවරුන්ට ද විපක්ෂයේ සිටින අභිනවයෙන් තේරීපත් වූ ජේෂ්ඨ මන්ත්‍රීවරුන්ට හා නවක මන්ත්‍රීවරුන්ට ද සුභාශිංසනය පිරිනමනවා.. අපේ කොට්ඨාසයේ ජීවත්වන දිලිදු පවුල් සංඛ්‍යාවක් තියෙනවා ඒ ගැනත් මම නගරාධිපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.අපි නොනැසෙන රටක් ලස්සන ජීවිතයක් සඳහා ගමන් ගන්නා වූ අපේ වර්තමාන පාලනය සඳහා අපි ශක්තිමත්ව සපත කරගන්න මම මගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් කැප වන බව ප්‍රකාශ කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී – එච්.එල්. නිලිනි හෙට්ටිආරච්චි මෙනෙවිය

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමියගෙන් හා සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් ද අවසරයි. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නැමිට්ටම රැකවීත් ජනතාවගෙන් යහපත අවශ්‍යතාවෙන් පෙනී සිටින පක්ෂයක් විශයෙන් ඔබතුමන්ලා කරන ජනතාවට හිතවාදී හිතෑම් අදයකට කොන්දේසි විරහිතව සහයෝගය ලබා දෙන්නත් ඒ වගේම නගරයේ ජනතාවට යම් අහිතකර තීන්දුවක් ගන්නේනම් එයට විරුද්ධව නැගී සිටින්නත් අපි දෙපාරක් හිතන්නේ නෑ. සාම්ප්‍රදායික දේශපාලනයෙන් මිඩ්ඩට ගිහින් ජනතාව මගේ නිලය ලබාදුන්නේ දැඩි විශ්වාසයකින්. ඒ විශ්වාසය රකින්න මගේ යුතුකමයි. එලෙසින්ම අලුතින් මන්ත්‍රීවරියක් වශයෙන් ලාබාලතම මන්ත්‍රීවරියක් වශයෙන් මහනට යනාවට ඒමට ඉඩ සලසා දුන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ පක්ෂයේ හිටපු පස්වන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු නාමල් රාජපක්ෂ මැතිතුමාට හා සියල්ලන්ටම මා ස්තූතිවන්ත වෙනවා. මෙමය මගේ ජීවයක් නොවෙයි. මෙය මගේ තාත්තගේ හීනයක්. මගේ සීයගේ නිවසේ ප්‍රකාශ කෝරුව ගෙනෙත් වෙන්න. මට ඉංජිනි එකක් ලැබුණ නිසා මට එය අතිම ප්‍රිය. මම ගමාරවුවැල්ල දකුන කොට්ඨාසයෙන් ඡන්ද ඉල්ලුවේ. ගමාරවුව මුරවත්ත ප්‍රදේශයේ ගොඩක් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩකයින් ඉන්නවා. මුරවත්ත ප්‍රදේශයේ ක්‍රීඩාපිටියක් තියෙනවා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා නගරාධිපතිතුමනි. එම ස්ථානයේ ගොඩක් සල්ලි තියෙන මිනිස්සු නැහැ. දුප්පත් මිනිස්සු තමයි ඉන්නේ ඒ ස්ථානය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. මාව මේ තැනට ගෙන ආව මගේ අම්මා සහ තාත්තාව ගොඩක් ආදරයෙන් මේ අවස්ථාවේ මතක් කර සිටිනවා. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ගමාරවුව ආසනයේ සංවිධායක මහනාජ් ගමගේ මහතාව මේ මොහොතේ ගෞරවයෙන් මතක් කර සිටිනවා. මගේ කොට්ඨාසයේ සිටිනවා පාසල් යනයන දරුවන් විශාල පිරිසක්. ඔවුන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ වයස අවුරුදු 12 ත් 16ත් අතර දරුවන්. ඒ දරුවන් පිළිබඳව ද අවධානය යොමු කරන මෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම කැමති ඔබතුමාලාගේ මේ පක්ෂය සමඟ වැඩ කරන්න මගේ සියලුම නාගරික මන්ත්‍රීවරුනුත් විපක්ෂයේ සිටින නාගරික මන්ත්‍රීවරුනුත් එක්කම. මා සමඟ තරඟ කළ පමුණුව සිල්වා මන්ත්‍රීතුමාටත් මම මේ මොහොතේ මතක් කරන්නවා. එතුමා මගේ යහළුවාගේ තාත්තා. එතුමත් දන්නවා ගරු නගරාධිපතිතුමනි, ඒ ප්‍රදේශය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී – එම්. සී. සෙව්වන්දි නිලංකිකා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඇතුලු සියලුම නාගරික මන්ත්‍රීවරුනි, නාගරික කොමසාරිස්තුමිය නාගරික ලේකම්තුමා, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුලු සියලුම සේවක මහත්ම මහත්මීන්ගෙන් ද, මේ අවස්ථාව ආවරණය කරන්න පැමිණි මාධ්‍ය ආයතනයන් හී සහෝදරයන්ගෙන්ද අවසරයි. පළමුව මා කැමති මේ අවස්ථාවලට එකතු වෙලා ඉන්න සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට සුබ පැතුම් එක් කරන්න. ඔබ සියලු දෙනා මේ ගමාරවුව මහා නගර සභාව අලුතින් ලියමවන කාල පරිච්ඡේදයක තමයි නාගරික නියෝජිතයන් ලෙස මේ අවස්ථාවට එකතු වන්නේ. මා කැමති පළමුව පක්ෂ විපක්ෂ ඔබ සියලු දෙනාටම මාගේ සුබ පැතුම් එකතු කරන්න, ඒ වගේම අතීතය සැප්තැම්බර් 21, නොවැම්බර් 14, මැයි 06 වෙනිදාත් ගමාරවුව පුරවැසියන්ගේ අද්විතීය ජාතික ජන බලවේගය නමින් ලියා තබමින් ජාතික ජන බලවේගය වෙනුවෙන් ජයග්‍රහණය කරා ගෙන යන්න ශක්තියක් ධෛර්යයක් වූ ආදරණීය ගමාරවුව ජනතාවට මේ මොහොතේ දී මාගේ ස්තූතිය පුදකර සිටිනවා. මම කියන්න කැමති මා නියෝජනය කරන්නේ ලක්ෂපතිය උතුර කොට්ඨාසයයි. සාම්ප්‍රදායික තිසිස්ත්‍රී සාදාචාර සම්පන්න මැතිවරණ ව්‍යාපාරයක් මෙහෙයවා වකවානුවකදීත් මාහට ශක්තියක් වී 55.1 ක ඡන්ද ප්‍රතිශතයක් වාර්තා කරමින් ලක්ෂපතිය උතුර ජයග්‍රහණය කරා ගෙනයාමට මා හට ශක්තියක් වූ කොට්ඨාසයේ සියලුම සහෝදර සහෝදරියන්ට ද ස්තූතිය පුදකරන්න මෙය අවස්ථාවක් කරගන්නවා. 1865 දී කොළඹ ගාල්ල මහනුවර ලෙස ශ්‍රී ලංකාව ඉංග්‍රීසීන්ගේ යටත් විජිතයක්ව පැවති කාලයේ දී පාලනය පහසු කර ගැනීම සඳහා මහා නගර සභා ලෙස පිහිටුවමින් ආරම්භ කළ. පළාත් පාලන ව්‍යුහය අද වනවිට මහා නගර සභා 24 ක් නගර සභා 41 ක් ප්‍රාදේශීය සභා 276 ක් ලෙස ජනතාවට වඩා සමීප ලෙස ජනතාවට සේවය කිරීමට ස්ථාපනය කර

තිබෙනවා. මිනිසාගේ උපතේ සිට අපි කියනවා නිවිරියගය සිට සුසාන භූමිය දක්වාම අවශ්‍ය සියලු පහසුකම් සැලසීම සඳහා බැඳී සිටින ආයතනය වන්නේ පළාත් පාලන ආයතනයයි.

ගරු නගරාධිපතිතුමනි, 76 වසරක දූෂිත දේශපාලනයක් නිමා කරමින් නැවුම් පාලනයක් සඳහා නව දේශපාලන සංස්කෘතියක් සඳහා ජනතාව අපිට වරමක් දීලා තියෙනවා. අපි විශ්වාස කරනවා ජනතා විමුක්ති පෙරමුණ පලපත් ජාතික ජන බලවේගය වශයෙන් වසර 60 ක කාලයක් අපි මේ මහා පොළොවේ දැවැන්ත අරගලයක් කළා. ඒ අරගලය කවදාවත් දේශපාලන බලයක් වෙනුවෙන් නොවෙයි. ඉන් එහාට ගිය මේ රටේ ජනතාව වෙනුවෙන් වඩාත් යහපත් ජීවිතයක් උදාකරලීමේ අවංක චේතනාව මුදුන්පත් කර ගැනීම සඳහා බලය ලබා ගැනීමටයි. අපිට අද ඒ බලය ලැබී තිබෙනවා. මේ මොරටුව නගර ගත්තොත් මිලියන ගණනින් සංවර්ධන ව්‍යාපෘති සිදුවුණා. නමුත් කියන්න කණගාටුයි අදටත් අපේ මොරටුවට පොදු වැසිකිළි පද්ධතියක් නැහැ. ඉතා උසස් මලය නාවන්නෑ වෙනා. මිටනින් එක නාවඩුවත් සුපිරි මෙළද සැලක වැසිකිළියක් තමයි අපිට පෙන්නන්න වෙලා තියෙන්නේ. මා නියෝජනය කරන ලක්ෂපතිය උතුර කොට්ඨාසයට යොමු වුණොත් මම හිතනවා පසුගිය කාලයේ එකදිගටම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට මැයි 06 වෙනිදා ඉඳන් අඛණ්ඩව මගේ දුරකතන ඇමතුම් ලැබෙන්න ඇති කියලා. ඩෙංගු විසන්දුනීය රෝගය වසංගතයක් විදියට මුළු මොරටුවම වෙලාගෙන තියෙනවා. ඊට ප්‍රධාන හේතුව තමයි අවිධිමත් නගර සංවර්ධනය. දූෂිත දේශපාලන ක්‍රමය වගේම ඒ ගොඩනැගූ කාණු පද්ධතියේ සිට මංමාවත් වල ඉඳන් කිසිදු ව්‍යාපෘතියක් විධිමත් ආකාරයට සිදු නොකිරීම. කාණු වෙනුවට ජලය බැස යන්න ඉඩකරලා තියෙන්නේ මඩුරු වැංකි. කණගාටුයි කියන්න ලක්ෂපතිය උතුර කොට්ඨාසයේ පසුගිය කාලයේ ඩෙංගු රෝගීන් 12 දෙනෙක් වාර්තා වෙනවා. මම කැමති නැහැ පසුගිය අතීතය පිළිබඳ භාර අවුස්සන්න ඒ ක්‍රමයේ තිබුණ අඩුපාඩු ඉදිරිපත් කරමින් ඉදිරියට යන්න. නමුත් ඉතිහාසය තමයි සාර්ථක වර්තමානයකට පඩිකාලම දමන්නේ. ගරු නගරාධිපතිතුමනි, මේ ලැබුණ ජනවරමින් අපට මේ මොරටුවේ ජනතාවගේ හෘදස්පන්දනය හඳුනාගෙන පළාත් පාලන ආයතනය ඔබට ළං කරමින් ජනතාවට උසස් සේවයක් ලබාදීම වෙනුවෙන් අප කැපී පෙනී කටයුතු කරනවා. අපගේ ඒකායන අරමුණ වන්නේ මොරටුවේ ජනතාවට වඩාත් යහපත් ජීවන තත්ත්වයක් උදාකරලීමයි. ඒ වෙනුවෙන් මම හිතනවා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයක් ඇතුලේ ඉදිරිපත් වූ අප යැමට ප්‍රශ්නමක් තියෙනවා පක්ෂ විපක්ෂ පසෙකලා තමාකද අපි හැමෝම මැතිවරණවලට ඉදිරිපත් වුනාම කියන්නේ අපිට පොදු නායකයක් නැහැ, පොදු දේශපාලනයක් නැහැ. අපි හැමෝටම තියෙන්නේ ජනතාව වෙනුවෙන් වැඩ කරන ඒකායන අරමුණක් කියලා. එහෙනම් අපිටත් තියෙන්නේ මේ මොරටුවේ ජනතාවගේ ජීවන තත්ත්වය වඩාත් උසස් කිරීමේ එකම එක අරමුණයි. ඒ සඳහා මම ආරාධනා කරනවා මෙහි සිටින සියලුම මන්ත්‍රීවරුන්ට එකට එක්ව වැඩ කටයුතු කරමු. වඩා යහපත් හෙට දවසක් මේ පාලන ක්‍රමයේ ඉදිරි වසර 04 ඇතුළත් මොරටුව ජනතාවට අපි ලබා කරලා දෙමු. හැකිනම් කරමු. නොහැකි නම් පසෙකින් හෝ කරමු. ඒ මා දැකගත් දේශපාලනයයි. මා සියලු දෙනාටම ආරාධනා කරමින් ඉදිරි වසර 04 ක කාලය තුළ මොරටුව මේ රටේ හොඳම පළාත් පාලන ආයතනය බවට ගෙන යන්න වැඩ කරමු කියලා ආරාධනා කරමින් ඒ සඳහා ඔබ සියලු දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සියලුම නාගරික මන්ත්‍රීවරුනි මන්ත්‍රීවරියනි, කොමසාරිස්තුමිය ඇතුලු නිලධාරි මහත්ම මහත්මියනි, අපේ නිතරත් මධ්‍යවේදීන් ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. මම කෙටියෙන් අවසන් කරන්නම්. අපි පසුගිය දෙවැනිදා මගේ ආදරණීය නායකයා සහෝදරයා කියන්න ප්‍රදීපානන්ද, නගරාධිපතිතුමා දිවුරුම් දීලා පෙර කණ්ඩායමේ හැමෝම දිවුරුම් දීලා අපි වැඩ ආරම්භ කළා. දැන් සති 03 කට ආසන්න කාලයක් වෙනවා අපි මේ සභාවේ වැඩ කටයුතු ආරම්භ කරලා. මා මෙය අවස්ථාවක් කර ගන්නවා දැනට ආරම්භ කරපු වැඩ කිහිපයක් පිළිබඳව නඩුන්නාන්සේලා සියලු දෙනාව දැනුවත් කරන්න. මුලින්ම අපිට තිබුණ ප්‍රධානතම අභියෝගය මේ සභාව අතීතය දූෂිත අපි අර කවුරුත් කියන්නේ කාඩ් එක ගහලා ගෙදර යන, වැඩ නොකර පඩිනිකාල ගන්න, එහෙම තත්ත්වෙකට පත්වෙලා තිබුණ ආයතනයක්. මම කියන්නේ නැහැ එය තවම 100%කම නිවැරදි වෙලා කියලා. නමුත් අපි දැවැන්ත උත්සාහයක් දරමින් ඉන්නවා ආයතනයේ සියලු සේවක මහත්වරුන් සියලු නිලධාරි මහත්වරුන් සමඟ එකට එකතු කරලා දැන් අපි ඒ අය එක්ක නියැපනය වෙනකොට ඒ

සාකච්ඡා පවත්වලා අවසන් කළා. ඒ අයට අපේ ප්‍රතිපත්තිය අපේ අදහස කියන්න අපි එයාලට කිව්වා දැන් කටයුතු ගෙනයමු. වෙනස් වෙන්න පුළුවන් හැමෝටම. කලින් කරපු වැරදි ඇත්නම් ඒ වැරදි වලට සමාව දෙන්න හොඳයි ඒ වැරදි නිවැරදි කරගෙන වැඩ කරමු. නමුත් කිසියම් කෙනෙක් වැරදි කරලා තියෙනවා නම් නීතියෙන් ඒ අයට අනිවාර්යයෙන් නීතිය ක්‍රියාත්මක වේවි. මොකද ජාතික ජන බලවේගය ගොඩනැගුණේනම් නීතිය ඉදිරියට හරියට ක්‍රියාත්මක කරන්නයි. ඒ නිසා අපි උත්සහ කළා සියලුදෙනා ඒකාබද්ධව සුහදත්වයෙන් යුතුව අපේ අරමුණ ජයග්‍රහණය කරගන්න සාකච්ඡා මාර්ගයෙන් කාරුණු සාකච්ඡා කරලා අවබෝධයෙන් මේ ප්‍රශ්න වලට උත්තර හොයන්න. මම හිතන්නේ නාගරාධිපතිතුමා දන්න වුණා අද මේ වනවිට අපි කලින් කියපු විශාල පිරිසක් රාජකාරියට එනවා 100% ක් සම්පූර්ණ නොවුනත්. ඒ අයට යම් හැකියාවක් ඇවිත් තියෙනවා, ඇත්ත දේශපාලන නායකත්වයක් දැන් සභාවට ඇවිත් තියෙනවා. අද්භූතයි. අපිටත් දැන් වගකීමක් තියෙනවා කියන කාරණය. ඒ නිසා අපි සතුටුයි ඒ පිළිබඳව. මෙහි සිටින සෑම නිලධාරියෙක්ම ඒ හැඟීමෙන් වැඩ කරන්න ආරම්භ කරලා තියෙනවා. අඩුපාඩු ඇති අපි ඒවා සාකච්ඡා කරලා සකස් කරගමු. අපිට අවශ්‍ය නැහැ නාමිකයාටවත් නීතියෙන්ම මේ දේවල් ඉෂ්ට කරගන්න, නගරාධිපතිතුමා සෑම වෙලාවකම කිව්වේ සාකච්ඡා කරමු අදහස් හුවමාරු කර ගනිමු කියලා. ඉතින් එය අපිට යම් ප්‍රමාණයකට ජයග්‍රහණය කරගන්න හැකි වෙලා තියෙනවා.

ගරු නගරාධිපතිතුමනි,අපිට තිබෙන විශේෂ අභියෝගය ආදායම් උත්පාදනය. සභාවට ලැබෙන්න තියෙන ආදායම ඉතාම දුර්වල මට්ටමක තියෙන්නේ. විශේෂයෙන් පැත්තෙන් ගත්තත් කසල වලින් ගත්තත් සියලු දෙනා දන්නවා විශාල වානිජ කසල ප්‍රමාණයක් අපිට එකතු කරනවා. එහි ඇත්ත ආදායම් හරිම එන්නේ නැහැ. වෙනවෙන අයගේ සාක්කු වලට යනවා. අපි ඒවා නැති කරන්න ඕන. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම් අපි සකස් කරනවා. තවම සති 03ක්වත් නැහැ. මේ විපක්ෂය ඇතුළු මම ඇත්තටම විපක්ෂය කියලා කියන්නත් කැමති නැහැ. අපි කවුරුත් මේ සභාවේ නියෝජිතයෝ. නගරාධිපතිවරයා උප නගරාධිපතිවරිය ඇතුලු සභිකයෙක් විදියට තමයි අපේ පහගේ තියෙන්නේ. අපි කවුරුත් සභිකයෝ ලෙස අපේ දක්ෂතාවයන් මෙහි විශාල පිරිසක් ඉන්නවා පරණ අපේ මන්ත්‍රීවරු. ඒ දැනුම් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඔබේ සාධනීය විවේචන අපි භාර ගන්නවා, ඔබේ හැකියාවන් අපට දෙන්න. දැන් අපි කමිටු පත් කළා. ඒ කමිටු වලින් අපි අදහස් යෝජනා තීන්දු තීරණ අරගෙන මේ සභාවට ජනතාව තුළ තිබුණ අප්‍රසාදය අවිශ්වාසය නැවත ගොඩනගන සභාවක් බවට පත් කරමු මෙය ඉදිරි වසර කිහිපය තුළ. පසුගිය දිනෙක අපි ආරම්භ කළා අපි කවුරුත් දන්නවා මේ අලුත් පාර මෝදර ඉඳලා මැලිබන් හන්දිය දක්වා වසර කිහිපයක් තිස්සේ අඳුරේ තියෙන්නේ. පාලකයෝ ගණනාවක් හිටියා නිලධාරී විනාශ් මහත්මයා මෙහි පාලනය කළා. අපි කාටත් දොස් කියලා වැඩක් නැහැ, නැහැයි අපි දැන් යමින් වුණා ඒ කටයුත්ත ආරම්භ කරන්න. විශේෂයෙන්ම අපේ තරුණ නාගරාධිපතිතුමා, නාගරාධිපතිතුමා ඇතුලු අපේ කාර්යාලයම ආර් ඩී එකත් එක්ක කතා කරලා දැන් එහි කටයුතු ආරම්භ කලා ඉදිරි මාස එකහමාර ඇතුලත කාල සීමාව තුළ මුළු මෝදරපුලේම මැලිබන් හන්දියට යනකන් විදුලි එළිය වැටෙනවා එය අපි ලබපු ජයග්‍රහණයක්. විලහට අපි කවුරුත් දන්නවා පරණ ගාලු පාරේ දීර්ඝ කාලයක් තිස්සේ ජලයෙන් යටවෙනවා. රංජන මන්ත්‍රීතුමා අපේ මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු දන්නවා අපේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමන් විශාල යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කළා ඉතාම හොඳයි. ඒ ජලයෙන් යටවෙන ජනතාවට නිසිලෙස නිවැරදි සැලසුම් හදලා ඒ ජලයෙන් යටවීම වැලැක්වීමට අදාළ වියදම් වලට යන්න වැඩ කටයුතු ආරම්භ කරලා තියෙනවා. මේ දවස් වල මැනීම් කටයුතු සඳහා ඒ ප්‍රතිපාදන අවන්කරමින් යනවා. නාගරාධිපතිතුමාගේ අදහස හැටියට පරණ පාරෙන් තමයි ජලය බැසීම සිද්ධ කරන්න හදලා තියෙන්නේ මොකද එතන පැත්තේ රේල් පාරත් එක්ක තියෙන තත්ත්වයත් එක්ක. ඒ නිසා අපි විශ්වාස කරනවා ඉදිරි වසර ඇතුළත අපිට හැකියාව ලැබෙයි කොහොළවාල්ලෙන් පටන් අරන් අම්බදර ප්‍රයෝජනයකට යනකම් ඒ ජනතාවගේ ප්‍රධානතම ගැටලුවට කඩිනමින් විසඳුම් දෙන්න. ඒ සඳහා අපි සියලු දෙනාම එකතු වෙමු. ඒ සඳහා පූර්ණ සහයෝගය දෙන්න කියලා ඉල්ලීම කරනවා. ඒ විතරක් නොවෙයි නව ඩෙංගු ව්‍යාප්තිය අපි බලය අතට ගන්නකොට පස්සේ විශාල ශුන්‍යයා රෝගය හදිසියේ ව්‍යාප්ත වුණා. අපේ සෞඛ්‍ය මහත්වරුන් සෞඛ්‍ය අංශයේ සේවකයින් සියලු දෙනාම එකතු වෙලා ගිය සුමානේදා ඉඳලා අපි විශේෂ වැඩසටහනක් ආරම්භ වුණා. එහි හැටියට අපිට සැලසුමක් තියෙනවා. සභාවේ අපි මුහුණපාන ප්‍රධානතම ගැටලු 03. වාහන ප්‍රශ්නය, සේවක ප්‍රශ්නය හා මේ උපකරණ පිළිබඳව තියෙන ප්‍රශ්නය. බරපතල විදියට තියෙන එපි අවධානය හිරවෙලා තියෙන ප්‍රශ්නයක් තමයි මේ වාහන, කණහාට්ටි. සමන්තුමා කිව්වා අර ගැරේජ් එක

විශාල මුදල් ප්‍රමාණයක් කළා කියලා. ගැරේජ් එක දැක්කාම අද කණගාටුයි. අපි එය වෙනස් කරනවා. අපි උත්සාහ දරනවා අපිට උදව් කරන්න විවිධ කණ්ඩායම් එකතු වෙලා ඉන්නවා. ඒ කණ්ඩායමුත් සහයෝගී කරගෙන ඉතාම ඉක්මනින් මේ ගැරේජ් එකත් අඩපණ වෙලා තියෙන අක්‍රීය වෙලා තියෙන සියලු වාහන හදන්න පුළුවන් විශේෂයෙන්ම අපිට ඉන්නවා මිකැනිකල් සයිඩ් එක සම්බන්ධ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්. මොරටුව කැම්පස් එක ලබන සතියේ අප සමග සාකච්ඡාවකට එනවා කැම්පස් එකේ මිකැනිකල් ඉංජිනියර් ඇතුළු කණ්ඩායමක්. එයාලා ස්වේච්ඡාවෙන් ලෑස්ති අපට මේ කැඩුණු වාහන හදන්න. අපි සූදානම් මේ කාර්යය ආරම්භ කරලා ඉතාම කෙටි කාලයක් ඇතුලත මේ සභාව නැවතත් ජනතාවට විශ්වාස කරන්න පුළුවන් ජනතාවගේ ඒ සේවාවන් නිසිපරිදි ලබා දෙන්න පුළුවන් ආයතන බවට පත් කරන්න අපි සූදානම්. ඒ වෙනුවෙන් අපට කළ හැකි හැම කැපවීමක් ම ස්වේච්ඡාවෙන් කරනවා. අපි ස්වේච්ඡාවෙන් දේශපාලනය කරන කණ්ඩායමක්.

ගරු නගරාධිපතිතුමනි, තව විවිධ වැඩසටහන් තියෙනවා කලාප වලට සේවකයෝ යවන් කරලා අපි උත්සාහ කරනවා මේ සේවකයෝ අතර තියෙන විධිමත්භාවය හඳුන්වා ක්‍රමවත්ව මේ කානු ටික සුද්ධ කරන්න. මදුරුතෙල් ගහන්න. පාරවල් ටික හදන්න. අපි හැමෝටම ඒ වගකීම තියෙනවා. මේ කිසිදු මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් නගරාධිපතිතුමා ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ලබාදුන්නු සියලුම ඉල්ලීම් ඒ දින ඒ මොහොතේම ඉෂ්ට කළා. ඉදිරියටත් එහෙමයි කියන සහතිකය අපි දෙනවා. අපේ බෙදීම් නැහැ මෙතන. අපි ඉල්ලන්නේ අපි කවුරුත් මේ අවුරුදු හතරේ විපක්ෂ පක්ෂ කියලා බෙදන්නේ නැතුව අපි හැමෝගේම අදහස් යෝජනාවන් සාකච්ඡා වලින් එකතු වෙලා මේ සභාව මීට වසර කිහිපයකට පෙර තිබුණ අඩුපාඩු සභාවකට වඩා දියුණු සභාවක් බවට පත් කරන්න අපි කවුරුත් එකතු වෙමු කියන ඉල්ලීම කරනවා. ලේඛනගත වශයෙන් මට ඡන්දය භාවිතා කළ අපි සාමාන්‍යයෙන් පුද්ගලික දේශපාලනය කරනවා අඩුයි. මා නියෝජනය කළේ මොයිසාපුර ප්‍රදේශයේ යම් කිසි සැලකිය යුතු කාලයක් දේශපාලනය කළා. ජයග්‍රහණය කරන්න බැහැ කියලා තමයි තිබුණේ. සාමාන්‍යයෙන් මොයිසාපුර කියන්නේ එක්සත් ජාතික පක්ෂයට වැඩ ප්‍රදේශයක්. නමුත් අපිට හැකි වුණා ජනතාව සමග එකතු වෙලා ජනතාවට වැඩ කරලා අපි අපේ අදහස කියලා ඒ ජයග්‍රහණය අත්පත් කරගන්න මොරටුව ජයග්‍රහණය කළා වගේම. විශේෂයෙන්ම මා ස්තූතිවන්ත වෙනවා මොයිසාපුර ප්‍රදේශයේ සියලුම ජනතාවට. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ විශාල පිරිසක ජීවත් වෙනවා. මේ සියලු ජනතාව අපිව විශ්වාස කරලා අපිට අවස්ථාවක් ලබාදීම ඒ සියලු දෙනාගේ බලාපොරොත්තු සියල්ල හැකි උපරිමයෙන් ඉෂ්ට කරන්නත්, ඉදිහත් වෙන්නත් බලාපොරොත්තු වෙමින් නැවතත් අපි ආරාධනා කරනවා මේ සියලු දෙනාටම අපි කවුරුත් එකතු වෙමු දැන් දේශපාලනය අවසන් මෙතැනින් එහාට අද මංගල සභාව. ඉතින් පස්සේ අපි එනිද්දා ඉඳලා කමිටු පත් කරගන්නවා. කමිටු ආරම්භ කරනවා. එතැන් සිට අපි කවුරුත් එකට එක්ව එකතු වෙලා වැඩ කරමු. අපි කරනකොට විපක්ෂ බලන් ඉන්න එපා. විවේචනාත් සමග ඔබේ අදහසුත් අපට දෙන්න අපි කවුරුත් එකතු වෙලා මේ සටන ජයග්‍රහණය කරමු. මොකද ඔබට විශ්වාසයක් තියෙන්න පුළුවන් නගරාධිපතිවරයෙක් මේ ඉන්නේ. අදූෂිත දේශපාලනයක් තියෙන්නේ. බය වෙන්න එපා ඔබේ විවේචන අදහස් සියල්ලට මෙහි ඉඩ තියෙනවා. ඒ ඔබේ ගෞරවය සියල්ල අපි රකිනවා. ඔබේ ඉල්ලීම් සියල්ල අපිට හැකි උපරිමයෙන් අපි ඉටු කරනවා. ඒ වෙනුවෙන් ඔබේ ශක්තිය ධෛර්ය සහයෝගය දෙන්න කියන ඉල්ලීම කරනවා.

**නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා**

ගරු මන්ත්‍රීවරුනි, මංගල සභාවේ මන්ත්‍රීවරුන්ගේ සුභාෂිතන අවසාන වෙනවා. සභාව අවසාන කිරීමට කාලය එළඹ තිබෙන්නේ. ඊට පෙර ඔබට මතක් කරනවා දෙවැනිදා තමයි අපේ ධුර කාලය ආරම්භ වුණේ. අද 24 වෙනිදා සාමාන්‍යයෙන් මාස අවසාන දින 30 වෙනිදා ඔබේ දීමනාව සකස් කිරීමට කටයුතු කරමු.

ගරු මන්ත්‍රීවරුනි, කමිටු ටිකත් අවසාන කරලා සාමාන්‍යයෙන් අපිට තියෙන්නේ ගමන් දීමනාව හදන්න. නමුත් දැන් මෙතුමා මගෙන් ඉල්ලීමකුත් කළා නමුත් එයි නීතිමය ගැටලුවක් නැහැ. හෙට පුළුවන් ඔබේ ගමන් දීමනාව ලබා ගන්න. මීළඟට ඉදිරියට අපි දාලා තියෙන ස්ථාවර කමිටු ටික මම ඉතාම ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටිනවා අපි දැන් මේ මහා ගොඩක් කාර්ය කළා ඒ කාර්ය කළේ ඔබේ පෞද්ගලික අවශ්‍යතා නොවෙයි. ඔබ මහජන නියෝජිතයෙකු ලෙස ජනතාවට වග කිව යුතු වෙනවානම්

ඒ වගකීම් ඉෂ්ට වෙනවානම්, එතකොට ඒවා ඉෂ්ට කරගන්න තියෙන්නේ ම දැන් අපි බලය ගත්ත පක්ෂය ලෙස අපි වැඩ කරලා විපක්ෂයෙන් එකට විසම්මුතිය කරන එකට මම එකඟ නැහැ. මම කියන්නේ පක්ෂ විපක්ෂ කියලා නැහැ සභාවක් ලෙස අපි වැඩ කරමු. එහෙනම් අපට ඉතාම වැදගත් වෙන්නේ මේ ස්ථාවර කමිටු ටික සක්‍රිය කරගන්න එක. මොකද මේ සභාව දීර්ඝ කාලයක් පොඩි ඒකාධිපතිත්වයකට යටත් වූ නිසා මේ ස්ථාවර කමිටු සියල්ල අස්ථාවර කමිටු බවට පත් වුණා. ඒවායේ කිසිවක් කරන්න පුරුද්දක්කමක් තිබුණේ නැහැ. මොනා පහත් තිබුණත් අදාළ පුද්ගලයා ඇවිත් ඉඳගන්න එයාට ඕන විදියට කමිටු පවත්වාගෙන ගියා. ඒක තමා යථාර්තය. ඉතින් ඒ නිසා ඒක එපි නැහැමත්ටම එපා වුණා. ඒ නිසා දැන් ඒක වෙන්නේ නැහැ කමිටු වලට ඇවිත් කමිටු වල කතා කරලා අදාළ තීන්දු තීරණ අරන් සභා අනුමැතියක් ගෙනත් වැඩ කරමු. මම නිලධාරීන්ටත් මේ වෙලාවේම කියනවා හැම මාසෙම එකම නිර්දේශය අවශ්‍ය නැහැ. අපිට කියන අත්දැකීම් කරහා ගෑ කියන්නේ. මාළ ගාණක් එකම නිර්දේශයක් තියෙනවා. ඒ නිසා අපි සභාව ලෙස එක වෙමු එතැන සිට අපි ගන්න ක්‍රියාමාර්ගය පිළිබඳ සභාවේ වාර්තා වෙන්න ඕන එකහිත් ඔබ්බට.

<u>ගරු නගර සභා මන්ත්‍රී - බී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සමහර වෙලාවල් කම්කරුවන්ගේ සඳහන් කරලා තියෙනවා. ඔබතුමා පොඩ්ඩක් බලන්න මහජන උපයෝගිතාව, කාන්තා හා ළමා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කාරක සභාව පස්වරු 1.30ට පටන් ගන්නේ ඉන් පසුව ආයතන හා නීතිය පිළිබඳ කමිටුව පටන් ගන්නවා පස්වරු 2.30 ට එතකොට ගරු නගරාධිපතිතුමා, අපිට පැයයි තියෙන්නේ. මම කියන්නේ නැහැ පැයකින් කමිටුවක් හරියට කරනවානම් කරන්න පුළුවන් වෙයි කියලා. ඉන් පසුව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව පස්වරු 1.30 ට තියෙනවා. ඉන් පස්සේ ව්‍යාපාර හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කාරක සභාව පස්වරු 3.00 ට තියෙනවා, එතකොට එතන පැය එකහමාරක් තියෙනවා. හැබැයි 3 ට පටන් ගන්න කාරක සභාව ගරු නගරාධිපතිතුමා 4 වෙනකොට නිලධාරීන් යන්න ලෑස්ති වෙනවා. මොකද කෝට්ටේ වලට ඉන්න කට්ටිය යන්න හදනවා. එතකොට මම හිතන්නේ නැහැ මේක සාර්ථක වෙයි කියලා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඒ වෙලාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපි සාකච්ඡා කරලා බලලා ඔබතුමා මතු කරපු කාරණයට නිවැරදි කරන්නම්. මේ දාලා තියෙන වෙලාවල් මාරුවේ තියාගෙන ආයාම කමිටුව කරන්න සම්බන්ධවෙන්නේ නැහැ. ඒ නිසා අපි නිලධාරීන්ටත් මතක් කරනවා යම් කාල කිරීමක් කරන්නේ නැතුව අපි මේ කතා කරන දේවල් යථාර්තයක් වෙන්නේ නැහැ. කාල වේලාව ඕන වෙයි, එය දේශපාලඥයින්ට පමණක් නොවෙයි නිලධාරීන්ටත් කරන්න වෙනවා. ඒ නිසා පැයකින් අපිට පළවෙනි අවස්ථාවේ කමිටු සභාපතිවරයෙකු පත් කරගෙන කමිටුවට එන අදාළ යෝජනා ටික ගන්න මෙය ඇති වෙයි. නමුත් ඊළඟ පාරින් ඔබතුමාට කමිටුවක් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා තීන්දු තීරණ වලට එන්න අපි දන්නේ නැහැ කමිටු වලට පොහොසත් කරුණු එනවාද කියලා. දැන් අපිට මේ කමිටු වලට තියෙන වගකීම ගත්තොත් ප්‍රශ්න එකක්. ඒ නිසා ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වෙලාවල් අපිට පැය දෙකක් දෙකහමාරක් කරගෙන යන්න.

ගරු මන්ත්‍රීවරුනි, අපට දැනට මතුවෙන ප්‍රායෝගික ගැටලු ටිකක් තියෙනවා. හැබැයි ඒ ගැටලු ටික අපි වෙනස් කරගන්න බලන්න ඕන. එකක් මට පෙනෙනවා මේ එක දවසකට කමිටු 03 ක් කැඳවන එකේ ගැටලුවක් තියෙනවා. අපි දැනට කරගෙන යමු. මොකද නිලධාරීන් වැඩි පිරිසක් උදේට හවසට මෙහෙම තියාගන්නකොට ඔවුන්ගෙන් වැඩක් කරගන්න මිනිස්සු රැස්වෙනවා ඒ නිසා අපි සාකච්ඡා කරලා අපි හොඳ විදියට සංශෝධනය කරගමු. මම ඇත්තටම සතුටු වෙනවා ගරු මන්ත්‍රීවරුනි, මම බලාපොරොත්තු වුණාට වඩා ඉතාම හොඳින් මේ කටයුත්ත සිද්ධ වුණා. අපි මෙය මීට වඩා වර්ධනය කරගෙන ඉදිරියට යන්න ඕන. අපි එකිනෙකා අතර තරඟයක් නැහැ. අපි එකිනෙකා හොඳින් කියවා ගන්න ඇය. රටේ දේශපාලනමය මතවාදයේ වෙනසක්කම් තියෙයි. ඒක හෙටත් තියෙයි. ඒවා නරක

නැහැ. එවා තියෙන්න ඕන එතකොට තමයි හොඳම මතය ඉස්සරහට එන්නේ. ජනතාවට වගකියන සභාවක් විදියට අපිට ඕනම ප්‍රශ්නයක් සාකච්ඡා කරලා විසඳගන්න පුලුවන්. දැන් අද දවසේ අපි හිතන්න ඕන තරුණ කාන්තාවක් ගොඩනැගෙන්නම ඕන. එය ගොඩනැගුනේ නැත්නම් අපි අනාගතය කල්පනා කළත් වැඩක් නැහැ මහරගම ගැන. මොකද ඒ අයට විශාල දේශපාලන අත්දැකීම් ප්‍රමාණයක් තියෙන්න ඕන. ඒ නිසා අප මන්ත්‍රීතුමා කිව්වා වගේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් සහ ඒක පිහිටුවලා ඉටර වුණාට පස්සේ විශාල වැඩිවුණ ප්‍රමාණයක් සංවිධානය වෙනවා. ඊට අමතරව අපේ සභාවෙන් එවැනි දැනුම අවබෝධය තියෙන නිලධාරීන් තිහිපදෙනෙකු තෝරාගෙන පළාත් පාලන විෂය පිළිබඳව යම් පුහුණු කිහිපයක් කරන්න බලාපොරොත්තු වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

නගරාධිපතිතුමනි, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගියවර දුන්නාමත්. එතන හොඳ විස්තර ටිකක් එක්ක දෙනවා ඉන්පස්සේ අපිට. මේ කතාව මතු වූ නිසා පොඩි ඉල්ලීමක් කරන්න කැමතියි. මේ වෙනකොට ඉන්ස්ටිටියුට් ඔෆ් පොලිටික්ස් පිළිබඳ ආයතනයක් අපිටත් කියන ආයතනයක් එක්කත් එකතු වෙලා මම හිතන්නේ අපේ මහිලා මන්ත්‍රීතුමියට සම්බන්ධීකරණය කරන්න පුළුවන් රුපියල් 60000/- කට විතර තියෙන ඩිප්ලෝමා එකක්. මහජන නියෝජිතයන් විදියට අපිට එයට සම්බන්ධ වෙන්න පුලුවන්. ඒක නොමිලේ ඒ සඳහා කාන්තාවෝ ටික සම්බන්ධීකරණය කරගන්න අපේ මන්ත්‍රීතුමියට භාර දෙමු. පිරිමි පාර්ශවය මට කරන්න පුලුවන්. ඒ මාසේ අපි නොමිලේ ගන්නෙපත් ඒක අටිරුද්දක එකක්. ඔබතුමියලාගේ කණ්ඩායමටත් ඒ අවස්ථාව ලැබුණොත් හොඳයි. ප්‍රාදේශීය ආණ්ඩුකරණය පළාත් පාලන විෂයන් පිළිබඳව, ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳව නොමිලේ කරන්නේ ධම්මි දිසානායක ආචාර්යතුමා. අපේ හේමන්ත් ගුණසේකර මැතිණිය කරන වැඩසටහනක් තියෙනවා අපේ ශියාමි ඉන්දිකා කුරේ මන්ත්‍රීතුමියත් ඒ වගේම ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමියත් සම්බන්ධවෙලා තියෙනවා.

ගරු නගරා<u>ධිපති - එන්. ටී. නිශාන්ත මුදිතානන්ද මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපේ පැත්තෙන් අපි ඒ උත්සාහය ගන්නවා. නමුත් මගේ අත්දැකීමෙන් මම කියන්නේ ඔබ තනියෙනුත් ඒ අවශ්‍යතාවය ඉෂ්ට කරගන්න දරණ උත්සාහය හොඳක් සාර්ථකයි. දැනුම හොයාගෙන යන්න. පොත් තියෙනවා. මහා නගර සභා ආඥා පනත, අතුරු ව්‍යවස්ථාව දන්නකන් ඉන්න ඕන නැහැ. හොයාගෙන යන අකමාට ඒක අමාරු නැහැ. එතකොට එයා සැහෙන යම් අධ්‍යයනයක් අවශ්‍යතාවයක් මතගෙන් එය කරන්නේ. මොකද මේ පනත්, අතුරු ව්‍යවස්ථා හොඳටම කියවගන්න ඕන. එතකොට අපිට හරි සරලයි එතකොට අපිට ඕනෑ කැනක නිලධාරීන් එක්ක හොඳින් ඒ ගනුදෙනුව කරගන්න පුලුවන්. ඒ නිසා එය ප්‍රධාන අවශ්‍යතාවයක් විදියට තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී</u> - බී. <u>සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මහරගමේ ඉන්න ව්‍යාපාරික ප්‍රජාව මේ වෙලාවේ පොඩ්ඩක් කනස්සල්ලෙන් ඉන්නවා එයාලගේ ව්‍යාපාර ස්ථාන වල රථවාහන නවත්වන්න දෙන්නේ නැතුව දැන් පොලිසියෙන් මේ වෙනකොට ඔවුන්ට දැන්වීම් දීලා තියෙනවා කියලා. මම හිතන්නේ සභාවක් වශයෙන් විශාල වරිපනම් බදු ප්‍රමාණයක් ගෙවන පිරිසක් තමන්ගේ අමාරුවේ වැටෙන විපිනයේ. එය විශාල ප්‍රශ්නයක් එයාලා වෙනුවෙන් අවස්ථා ගණනාවක් මේක සිද්ද වෙලා තියෙනවා. එහෙම අවස්ථාවක අපි මැදිහත් වෙලා ඒ අවස්ථාව සලසා දුන්නා. මොකද රථ වාහන තදබදය අඩු වීමට විකල්ප පරිත්‍යාග එකක් නොවෙයි. සභාවක් වශයෙන් ඔබතුමාගේ මැදිහත්වීමක් කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු නගරාධිපති - ජේ. වී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා**

ගරු මන්ත්‍රීවරුනි, අපි සාකච්ඡා කරමු. මම හිතන්නේ දැන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී මේ ප්‍රශ්නය මතුවුණා. ඒ වෙලාවේ ඒ සඳහා කාගෙවත් විරුද්ධත්වයක් ලැබුණේ නැහැ. විටින්විට මේ තියෙන තදබදය අවම කර ගැනීම සඳහා පොලිසිය දරණ උත්සාහය මේ තියෙන්නේ. එතිදී යම් ව්‍යාපාරික කණ්ඩායමකට යම් අපහසුතාවයක් වෙනවා. ඒක ඇත්ත. නමුත් මේ දෙක එකට ගැලපෙමින් තියෙනවා. එකත් පාර අයිනේ ව්‍යාපාරික ප්‍රජාවට වෙන හානිය. කොහොමද මේක විසඳන්නේ කියලා. එකක් පදිකයින්ටත් එකක් ප්‍රශ්නයක් වෙනවා. ඒ මේ තියෙන ඉඩකඩ අඩුකම නිසා ඇති වූ ප්‍රශ්නයක්. අපි අවශ්‍යනම් නැවත පොලිසිය සමඟ කතා කරමු. පොලිසියත් මේ නිසා ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒක දෙපැත්තටම බලපානවානේ. දවසක් ඔත්තේ තව දවසක් ඉරට්ටේ. එක දවසකට බ්ලොක් වෙන එක අනිත් දවසේ අනිත් පැත්තට බ්ලොක් වෙනවා. නැත්නම් හැමදාම එක පැත්තකට බ්ලොක් වෙනවා පාර දෙපැත්තම බ්ලොක් වෙනවා.

**ගරු නගරාධිපති - ජේ. වී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා**

ගරු මන්ත්‍රීවරුනි, ඒක තමා දැන් අපේ අදහස. ව්‍යාපාරිකයෝ හිතන්නේ ඔත්තේ ඉරට්ටේ විදියට නෙවෙයි, තමන්ගේ බිස්නස් එකට වෙන හානිය ගැන. දැනට අපි ප්‍රශ්නයක් විදියට සාකච්ඡා කරලා බලමු කොහොමද මේක විසඳගන්නේ කියලා. පොලිසිය දැන් ඒ වැඩේ කරගෙන යන්න තීන්දු කළා. එය සම්බන්ධීකරණ කමිටුවේදී ගත්ත තීන්දුවක්. මම හිතුවා මේක කරලා මිනිස්සුන්ට පුරුදුනම් දාන්න එපා කියලා.

ගරු මන්ත්‍රීවරුනි. අපිට ඉක්මනට උදවු කරන්න අපිට අභ්‍යන්තර සාකච්ඡා සැලකිය යුතු ප්‍රමාණයක් ඉවර කරලා තියෙන්නේ. තව සාකච්ඡා දෙක තුනක් තියෙනවා. ඉතින් අපි හිතනවා තවමත් පැවැත් ඇවිල්ලා කඩේ අස්සන් කරලා යන තව පිරිසක් ඉන්නවා කියලා. මට ඉතාම ඉක්මනින් මේ සම්බන්ධයෙන් තද තීන්දුවක් ගන්නවා කොහොමද එහෙම කරන්න දෙන්න බැහැ. වැඩ කරන මිනිස්සු ඒ සේවකයෝ හැම තිස්සේම පෙන්වන එකක් නැත්තං අර කාඩ් ගහලා යන එක. මම හිතින ව්‍යාපාරයක්ම තිබ්බා. ඒ අයටත් සහාදුපලිකාව දැනෙන තරමක් කොට. ඒ නිසා මම නිලධාරීන්ගෙන් ඉල්ලනවා මේ වැඩේ නගර සීමාව අපේ වැඩක් නෙමෙයි. ඒකට තමයි නිලධාරි තන්ත්‍රය ඉන්නේ, ඔබට එකක් ඉන්නවා. ඒ වගේ අඩුපාඩුකම් තියෙනවා. ඒක අපිත් උදව් කරලා මේ වැඩේ ඉක්මනට වෙනස් කරමු. මම්පරවුවේ විශාල විරෝධතාවයක් තියෙනවා, යන යන තැන පෙන්නනවා අර ත්‍රීවීල් එක දුවන්නේ නගර සභාවේ අවසරයක්, අර මෙයාත් වැඩ කරන්නත් සභාවේ අවසරයෙන්. මේක නැවැත්වීම අපට බැ.

ගරු මන්ත්‍රීවරුනි, ඔබ දන්නවා වාණිජ සංකීර්ණ එකතු කරන එකේ සාමාන්‍ය කඩවල මුදල් අත්වලට ගන්නවා. අපි ළඟ මුදල් අවිනිශ්චිතයක ඉන්නවා, ඒ ගොල්ලො අනිකාල පොඩ්ඩක් අඩු වුණොත් අපිත් එක්ක සැසඳෙන්න නැත්තෙනවා. නැතිනම් අනිකාල දෙන්න තියෙන මුදල් ටික වෙනම අත්වලට එකතු කරනවා. ඒ නිසා කොමසාරිස්තුමියනි, ඉතාම ඉක්මනින් කඩවලට දැනුවත් කරලා, කොහොමද අපේ සභාවට එන්න තියෙන මුදල්පහ. මම දිනට දීර්ඝ කාලයක් කතා කළා, ඒ නිසා වාණිජ සංකීර්ණ එකතු කරන එකෙන් අපිට ලැබෙන ආදායමත් ඒ ආදායම දැන් එන්නෙ නෑ. ඒ නිසා මෙය පොඩ්ඩක්

ඉක්මණින් නිවැරදි කර ගන්න ඕන. මෙහෙම වැඩ ටිකක් තියෙනවා ඉක්මණින් කර ගත යුතුයි. ඒ ටිකට උදව් කරන්න. කමිටුවලටත් ඕන නම් දාලා කතා කරමු. මේ දවස්වල අපි යම් වැඩ ටිකක් කර ගෙන යනවා. සේවකයො ඇත්තටම මහන්සි උනා. අවංකවම මහන්සි උනා. පාරේ ශ්‍රමදානය ඉවර වෙලා පාන්දර හතරයි මම එතනින් යනකොට. නිලධාරීන් කිහිප දෙනෙකුත් හිටියා. මම කියන්නේ මිනිස්සු වැඩ කරන්න සූදානම් බව පේනවා. අපි හොඳ නායකත්වයක් දෙනවා නම්, සේවකයො වැඩ කරනවා. මිනිස්සු උදව් කරනවා. ඒ නිසා මට විශ්වාසයක් තියෙනවා මේ තත්වය ඉතාම හොඳින් වෙනස් කරගෙන යන්න පුළුවන්. හැමදාම කියන්නෙ සභාව තමයි ප්‍රධානම නියමු කාර්යභාරය කරන්නෙ. දැන් අද දවසේ හැමදෙනාම මෙය සාර්ථක කරගන්න දායක වුනා. ඉතාම හොඳ අදහස් ඉදිරිපත් වුනා. ඒ වා ඉස්සරහට කමිටුවලට, සභාවලට යෝජනා විධියට ගේමු. ඒවා අරගෙන ඵලදායි ලෙස ඒවා ක්‍රියාත්මක කරන්න උත්සාහ කරමු. අද දවසේ මේ මංගල සභාව සාර්ථක කරගන්න දායක වෙච්ච සියළුදෙනාටම, සියළු මහා නගර සභා මන්ත්‍රීවරුන්ට හා නිලධාරී මහත්ම මහත්මීන්ට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමින් සභාවේ වැඩ කටයුතු සමාප්ත කරනවා.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2025.06.24 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.

2025.07.15 දිනැති මාසික සභා රැස්වීමේදී සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත වූ 2025.06.24 දිනැති මාසික සභා රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

2025.09.02 වන දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.

ගරු නගරාධිපති,
මොරටුව මහා නගර සභාව

කේ.ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද
නිල නොලත් මහේස්ත්‍රාත් හා සාම විනිසුරු
නගරාධිපති
මොරටුව මහා නගර සභාව